# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2013

විදේශ කටයුතු අමාත්‍යාංශය

- ශ්‍රී ලංකාව -

# පටුන


මෙහෙවර ප්‍රකාශය I

මහින්ද චින්තන - ඉදිරි දැක්ම II

පෙරවදන III - V

<u>අංශවල ප්‍රගති වාර්තාව</u>

01. දකුණු ආසියා හා සාර්ක් අංශය 1 - 17
02. නැගෙනහිර ආසියා හා පැසිෆික් අංශය 18 - 28
03. මැද පෙරදිග අංශය 29 - 34
04. අප්‍රිකා අංශය 35- 41
05. යුරෝපා, ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු මඩුලු සහ ඇමෙරිකා අංශය 42 - 49
06. එක්සත් ජාතීන්ගේ, බහු පාර්ශ්වීය කටයුතු, මානව හිමිකම් සහ සමුළු අංශය 50 - 57
07. ආර්ථික කටයුතු අංශය 58 - 64
08. සන්ධාන අංශය 65 - 70
09. කොන්සියුලර් කටයුතු අංශය 71 - 78
10. පොදු සන්නිවේදන අංශය 79 - 84
11. නීති අංශය 85 - 89
12. විදේශ දූත මණ්ඩල පාලන අංශය 90 - 92
13. සාමාන්‍ය පරිපාලන අංශය 93 - 94
14. මුදල් අංශය 95-98
15. විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල ජාලය 99
16. විදේශ කටයුතු අමාත්‍යාංශයේ සංවිධාන සටහන 100

# මෙහෙවර ප්‍රකාශය

“ශ්‍රී ලංකා රජයේ විදේශ ප්‍රතිපත්තියට අනුකූලව ශ්‍රී ලාංකීය ජාතික අභිලාෂයන් ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීම, විදහා දැක්වීම සහ සුරක්ෂා කිරීම සහ ජාත්‍යන්තර ප්‍රවණතා ශ්‍රී ලාංකීය ජාතික අභිලාෂයන්ට අනුකූලව කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම”

# විදේශ කටයුතු අමාත්‍යාංශයේ විෂයයන් සහ කාර්යයන්

“විදේශ කටයුතු පිළිබඳ දේශපාලනික සැලසුම් හා
වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;
විදේශ රටවලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම;
ජාත්‍යන්තර ගිවිසුම් හා සම්මුතිවලට එළඹීම;
ශ්‍රී ලංකාවේදී විදේශ රටවල ආණ්ඩු සහ
ජාත්‍යන්තර සංවිධාන නියෝජනය කිරීම;
විදේශ රටවලදී සිදු කරන ප්‍රචාරණ කටයුතු;
රාජ්‍යතාන්ත්‍රික විනිර්මුක්තීන් හා වරප්‍රසාද සහ
කොන්සියුලර් කටයුතු”

ශ්‍රී ලංකාව කවදත් අනුගමනය කළ නොබැඳි විදේශ ප්‍රතිපත්තිය තවදුරටත් ශක්තිමත් කොට පවත්වාගෙන යන්නෙමි. ඉන්දියාව, ජපානය, චීනය, පකිස්තානය ඇතුළු ආසියානු රටවල් සමඟ පවත්වාගෙන යන අපේ මිත්‍රශීලී සබඳතාවන් කොතෙක් ඵලදායී ද යන්න පසුගිය සිව් වසර තුළ මනාව පැහැදිලි වූ අතර, දේශපාලන, ආරක්ෂක, ආර්ථික, වෙළඳ හා සංස්කෘතික ක්ෂේත්‍රයන්හි එම සබඳතා අතිශයින් මිත්‍රශීලී ලෙස පවත්වාගෙන යාමට කැප වෙමි.

ලෝක පාරිසරික සහ දේශගුණික විපර්යාසයන් හා බැඳුණු ජාත්‍යන්තර සම්මුතීන් හා ගිවිසුම් සමඟ ඒකාබද්ධව කටයුතු කරන අතර, එක්සත් ජාතීන්ගේ සංවිධාන සමඟ ඇති සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කරමි.

ශ්‍රී ලංකාව වෙනත් රටවල් සමඟ පවත්නා විදේශ සබඳතාවයන් හි දී රටේ ගෞරවය සහ අභිමානය සුරැකෙන පරිදි ක්‍රියා කිරීමටත් විදේශ රටවල ආකර්ෂණය වර්ධනය කර ගැනීමටත් අවශ්‍ය නව වැඩපිළිවෙළක් හඳුන්වා දෙමි.

## මහින්ද චින්තන - ඉදිරි දැක්ම

# පෙරවදන

ශ්‍රී ලංකා විදේශ ප්‍රතිපත්තිය සුපරික්ෂාකාරීව, විධිමත්ව සකස් කොට ඇත්තේ රටේ දේශපාලන, ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අභිලාශයන් විදේශ රටවලදී ප්‍රවර්ධනය කර ගැනීමත් රටේ ජාතික ඒකාග්‍රතාව, ස්වෛරීභාවය හා අනන්‍යතාව ආරක්ෂා කර ගැනිමත් සඳහාය. නිදහස ලැබුණු දා පටන් ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති ක්‍රියාවලිය සම්පාදනය කිරීමේ හා එය ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇත්තේ විදේශ කටයුතු අමාත්‍යාංශයට ය. 2013 වර්ෂයේදී එහි කිසිදු වෙනසක් සිදු වී නොමැත.

විදේශ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් මෙහෙයවනු ලබන අතර මෙම වර්ෂය තුළ දී ශ්‍රී ලංකාව විදේශ සේවා ක්ෂේත්‍රයෙහි සුවිශේෂ ප්‍රගතියක් ලබා තිබේ. විශේෂයෙන්ම, අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අමාත්‍යතුමාගේ මාර්ගෝපදේශකත්වය යටතේ, රජයේ සහ පෞද්ගලික අංශයේ අයතන ගණනාවක සහයෝගය ඇතිව පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ විසි දෙවන රැස්වීම (2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීම) ශ්‍රී ලංකාවේ දී පැවැත්වීමේ කටයුතු සංවිධානය කිරීමේදී මෙම අමාත්‍යාංශය ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන ලදී. මෙය ශ්‍රී ලංකාවේදී පවත්වන ලද සුවිශේෂ කටයුත්තක් බව පොදුවේ පිළිගනු ලබන කාරණයකි. ප්‍රතිශේධනාත්මක ජයග්‍රහණ රාශියක් මධ්‍යයේ පෙර නොවූ විරූ ආකාරයේ ශ්‍රී විභූතියෙන් යුතුව සමුළුව නිමා කොට අතිගරු ජනාධිපතිතුමාට සංවිධානයේ සභාපතීත්වය භාර ගැනීමට හැකිවීම නිසා රාජ්‍යතාන්ත්‍රික හා දේශපාලන කටයුතු සමබන්ධයෙන් ශ්‍රී ලංකාවට ලෝක සිතියමේ විශේෂ ස්ථානයක් ඒකාන්තයෙන්ම හිමි වනු ඇත.

මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි මනාව සඳහන් කර ඇති ප්‍රතිපත්ති රාමුවට අනුකූලව ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියෙහි අලුතින් හුවා දක්වා ඇති ආර්ථික වැදගත්කම අනුව විදේශවල පිහිටි සියලුම ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ තනතුරුලාභීන් සමඟ මෙම අමාත්‍යාංශය ක්‍රියාශීලීව කටයුතු කර ඇත. ශ්‍රී ලංකා ජනතාවට සමෘද්ධිමත් හා දීප්තිමත් අනාගතයක් උදාකරදීම සඳහා ඔවුන්ගේ ආර්ථික අභිලාෂයන් ප්‍රවර්ධනය කිරීමෙහිලා රජයේ සහ පෞද්ගලික අංශයේ ආයතන සමඟ නොකඩවා කටයුතු කිරීමට මෙම අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල සැදී පැහැදී සිටිති. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී ශ්‍රී ලංකාව විදේශ රාජ්‍ය ගණනාවක් සමඟ ද්විපාර්ශ්වික සම්බන්ධතා ශක්තිමත් කරගෙන ඇති අතර සංසඳ තුළ ක්‍රියාශීලී කාර්යභාරයක් ඉටු කරයි. මෙම වර්ෂය තුළදී අතිගරු ජනාධිපතිතුමා ජපානය, උගන්ඩාව, චීනය, ටැන්සානියාව, සීෂෙල්ස්, බෙලාරුස් යන රටවල හා එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනය සඳහා නිව් යෝර්ක් හි සුහද හා සාරවත් සංචාරවල නිරත වූ අතර විදේශ රටවල රාජ්‍ය නායකයින් සමඟ පවත්වන ලද සාකච්ඡා සහ අන්‍යෝන්‍ය ක්‍රියාකාරකම් තුළින් ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික සම්බන්ධතා ශක්තිමත් කොට ඇත. මෙයට අමතරව, ගරු අමාත්‍යතුමා, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ විදේශ කටයුතු පිළිබඳ ගරු අධීක්ෂණ මන්ත්‍රීතුමා විදේශ නිල සංචාර ගණනාවක නිරත වී ඇති අතර, ඔවුන් විදේශවල ප්‍රතිරූප නායකයින් හා ප්‍රමුඛ පෙළේ නිලධාරීන් සමඟ පවත්වන ලද අන්‍යෝන්‍ය ක්‍රියාකාරකම් තුළින් ජාත්‍යන්තර කරළිය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ඔසවා තැබීමටත් ම රාජ්‍ය සමඟ පවත්නා සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කර ගැනීමත් සඳහා විශේෂ කාර්යභාරයක් ඉටු කර තිබේ. මෙම සංචාර සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය සහාය ලබාදී ඇති අතර ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති, අරමුණු ඉෂ්ට සිද්ධ කර ගැනීමෙහි ලා දායක වී ඇත.

තවද රාජ්‍ය නායක හා ආණ්ඩු ප්‍රධානීන්ගේ මට්ටමේ නායකයින් ඇතුළු විදේශීය ප්‍රභූවරුන් ශ්‍රී ලංකාවේ කළ නිල සංචාර ගණනාවක් සම්බන්ධයෙන් 2013 වර්ෂයේදී විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් පහසුකම් සලසා දී ඇත. ශ්‍රී ලංකාවත් ජාත්‍යන්තර ප්‍රජාවත් අතර වැඩි සහයෝගීතාවක් ඇති කර ගැනීමට මෙම සංචාර මඟින් මඟ පෑදී ඇති අතර එමඟින් ශ්‍රී ලංකා ජනතාවට ඉමහත් යහපතක් සැලසී තිබේ.

මෙම අමාත්‍යාංශය මෙම වර්ෂය තුළදී සිවිල් ගුවන් සේවා, ආයෝජන ප්‍රවර්ධනය ද්විත්ව බදු වැළැක්වීම, සමුද්‍රික කටයුතු, වාණිජ හා වෙළඳ කටයුතු, අධිකරණ සහයෝගීතාව ආදී ක්ෂේත්‍ර ගණනාවක් සම්බන්ධයෙන් ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික ගිවිසුම්වල හා රැස්වීම්වල වැඩ කටයුතු අවසන් කිරීමෙහිලා සුවිශාල ප්‍රගතියක් අත්කර ගෙන තිබේ. ගරු අමාත්‍යතුමාගේ නායකත්වය හා ප්‍රබල මාර්ගෝපදේශකත්වය යටතේ ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික සම්බන්ධතාවලට අදාළ විදේශ සංචාර සැලකිය යුතු ප්‍රමාණයක් සඳහා පහසුකම් සැලසීම මඟින්, ගෝලීය මට්ටමේදී ශ්‍රී ලංකාව ඉටු කරන කාර්යභාරය සහ ශ්‍රී ලංකාව පවත්වන සම්බන්ධතා ශක්තිමත් කර ගැනීමට ශ්‍රී ලංකාව දරන ප්‍රයත්න මනාව පැහැදිලි වේ.

ද්විපාර්ශ්වික සම්බන්ධතා ශක්තිමත් කර ගැනීමත් රාජ්‍යතාන්ත්‍රික කටයුතු ඵලදායක ලෙස ඉටු කිරීමත් සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ මාර්ගෝපදේශකත්වය යටතේ, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව, 2013 වර්ෂය තුළදී, කම්පාලා, අබූජා ,මනාමා සහ වික්ටෝරියා හි නව නේවාසික දූත මණ්ඩල සහ ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් හි කොන්සල් ජනරාල් කාර්යාලයක් විවෘත කර ඇත. මෙම වර්ෂයේ අවසානයට පෙර සී ෂෙල්ස් හි සහ ඇෆ්ගනිස්ථානයේ නව දූත මණ්ඩලද ඉන්දියාවේ කල්කටා හි කොන්සල් කාර්යාලයක් ද විවෘත කිරීම සඳහා කටයුතු කරගෙන යනු ලැබේ.

විදේශවල සිටින එල්.ටී.ටී.ඊ. හිතවාදීන් විසින් ජාත්‍යන්තරව කරනු ලබන සාවද්‍ය තොරතුරු ප්‍රචාරය කිරීමේ කටයුතු, කරුණු විකෘති කිරීමේ කටයුතු හා අසත්‍ය ප්‍රචාරක කටයුතු මැඩ පැවැත්වීම සඳහා සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී මෙම අමාත්‍යාංශය මඟින් කටයුතු කරනු ඇත.

විදේශවල පදිංචි වී සේවය කරන ශ්‍රී ලාංකිකයින්ගේ උවමනා එපාකම් ගැන අදාළ විදේශ දූත මණ්ඩල මඟින් සොයා බැලීමේ කටයුතු ද මෙම අමාත්‍යාංශය මඟින් කර ගෙන යනු ලැබේ. අමාත්‍යාංශයේ කොන්සල් කටයුතු අංශයේ මහජන කුටිය මඟින් මහජනතාවට කාර්යක්ෂම හා කඩිනම් සේවයක් සපයාදීමට ද උත්සාහයක් දරා ඇත. මෙම කුටිය සතියේ දිනවල පෙ.ව. 6.00 සිට විවෘතව තිබේ. මේ අතර, පිටරටවලින් නෙරපනු ලැබූ ශ්‍රී ලාංකික කම්කරුවන් බොහෝ දෙනෙකුට වන්දි සහ වෙනත් ප්‍රතිලාභ, ලබා ගැනීමට වර්ෂය පුරාම අමාත්‍යාංශය මඟින් සහාය සලසා දී තිබේ. මහජනතාවට කාර්යක්ෂම හා කඩිනම් සේවයක් සලසා දීම සඳහා ප්‍රමාණවත් සම්පත් කොන්සියුලර් කටයුතු අංශයට ලබා දී තිබේ.

ශ්‍රී ලංකා දූත මණ්ඩල ගණනාවක නිල කාර්යාල හා නිල නිවාස අලුත්වැඩියා කිරීම හා ඉදිකිරීම සඳහා මෙම වර්ෂය තුළදී අමාත්‍යාංශය මඟින් පියවර ගෙන තිබේ. වොෂින්ටන් ඩී.සී., නිව් යෝර්ක් හා ඕමාන් හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සඳහා අමාත්‍යාංශය මඟින් ගොඩනැගිලි මිලදී ගෙන ඇති අතර එමඟින් කුලී සඳහා වැය වන විදේශ විනිමය ඉතිරි කර ගැනීමට පිළිවන් වී තිබේ.

වෘත්තීය රාජ්‍යතාන්ත්‍රික කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීමත් විදේශවල සිටින හා ශ්‍රී ලංකාවේ සිටින ශ්‍රී ලාංකිකයින්ට කාර්යක්ෂම සේවයක් සලසා දීමත් සඳහා අමාත්‍යාංශයේ මානව සම්පත් නොමදව ලබාදීමේ වැදගත්කම ගැන සලකා බලා විවෘත තරඟ විභාගයක ප්‍රතිඵල අනුව ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන්ගේ 25 දෙනෙකුගේ කණ්ඩායමක් 2013 අගෝස්තු මාසයේදී බඳවා ගන්නා ලදී. මෙයට අමතරව, නිලධාරීන්ට පශ්චාත් උපාධි මට්ටමේ පුහුණුව ඇතුළුව විදේශ පුහුණු අවස්ථා සලසා දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමන් විසින් පැහැදිලිව ප්‍රකාශයට පත් කොට ඇති ප්‍රතිපත්ති මාර්ගෝපදේශක මත පිහිටා ශ්‍රී ලංකාව කෙරෙහි එල්ල වන අභියෝගවලට, ප්‍රායෝගික හා යථාභූත පදනමක් මත මුහුණ දීමට හැකි වන ආකාරයේ තත්ත්වයකට, ගරු අමාත්‍යතුමා විසින්, විදේශ කටයුතු අමාත්‍යාංශය පත් කරනු ලැබ තිබේ. ශ්‍රී ලංකාවේ ස්වාධිපත්‍යය හා භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කර ගැනීම උදෙසා සෑම කල්හිම කර ඇති පරිදි, වෘත්තීය නිපුණතාවයකින් කටයුතු කිරීමට අමාත්‍යාංශය ඇප කැපවී සිටින්නීය.

විදේශ කටයුතු අමාත්‍යාංශය,
ජනරජ ගොඩනැගිල්ල
කොළඹ 01

2014 මැයි 28 වැනි දින

`

# දකුණු ආසියා හා සාර්ක් අංශය

## <u>දකුණු ආසියා අංශය</u>

- ආවරණය වන රටවල්: ඇෆ්ගනිස්ථානය, බංගලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය සහ පකිස්තානය
- නේවාසික දූත මණ්ඩල සංඛ්‍යාව: 05(බංග්ලාදේශය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය සහ පකිස්තානය)
  03- නියෝජ්‍ය මහ කොමසාරිස්/කොන්සල් ජනරල් ඉන්දියා (චෙන්නායි, මුම්බායි)සහ පකිස්තානය (කරච්චි)
- බහුපාර්ශ්වීය සංවිධාන සංඛ්‍යාව: 02 - ඇෆ්ගනිස්තානය, භූතානය නවදිල්ලි වෙතින්

## දකුණු ආසියානු අංශය

- වැදගත් දේශපාලන හා ආර්ථික ප්‍රවණතා ශ්‍රී ලංකාවේ දේශීය හා විදේශීය ප්‍රතිපත්තිය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ තක්සේරුවක් ඉදිරිපත් කිරීම සඳහා දකුණු ආසියා අංශය, දකුණු ආසියා කලාපයේ පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව, එම ප්‍රවණතා අඛණ්ඩව අධීක්ෂණය කිරීම.

- දකුණු ආසියානු රටවල කොළඹ පිහිටි දූත මණ්ඩල සමඟයහපත්, ඵලදායී, කාර්යක්ෂම කාර්ය සබඳතාවක් පවත්වාගෙන යාම.

- අතිගරු ජනාධිපතිතුමාගේ, ගරු අමාත්‍යතුමාගේ, ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාගේ වෙනත් කැබිනට් අමාත්‍යවරුන්ගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ විදේශ සංචාර සම්බන්ධීකරණය කිරීම.

- දකුණු ආසියානු කලාපයේ රටවල සම්භාවනීය අමුත්තන් ශ්‍රී ලංකාවෙහි සිදු කරන සංචාර සඳහා කටයුතු සූදානම් කිරීම.

- ඒකාබද්ධ කොමිෂන් සභා, විදේශ අමාත්‍යවරුන්ගේ උපදේශාත්මක සාකච්ඡා සහ ඒ ඒ රටවල සමස්ත ද්වීපාර්ශ්වික සහයෝගීතාවෙන් යුත් ඒකාබද්ධ කාර්ය කණ්ඩායම් ඇතුළු සංවිධානාත්මක ව්‍යුහයකින් යුත් ද්විපාර්ශ්වික සංවාදවල සැසිවාර සඳහා කැඳවීමේ කටයුතු සිදු කිරීම.

- දේශපාලනික, අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අමාත්‍යාංශ අතර අනුගාමී සහ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

- දේශපාලනික, අධ්‍යාපනික, විද්‍යා හා තාක්ෂණික සහ සංස්කෘතික ගිවිසුම් පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය කොට එම ගිවිසුම්වලට එළඹීමේ කටයුතු කිරීම.

- විදේශ දූත මණ්ඩලවලින් ලැබෙන මාසික දේශපාලනික වාර්තා පිළිබඳ සැකසුම් කටයුතු කොට එම තොරතුරු අදාළ බලධාරීන් අතර බෙදා හැරීම.

- කලාපය ආශ්‍රිතව සිදු කෙරෙන සංචාරවලදී සහ සමුළුවලදී සාකච්ඡාවට ලක් කිරීම සඳහා ලුහුඬු වාර්තා, කථා සහ කථාවලදී ඉදිරිපත් කෙරෙන කරුණු පිළියෙල කිරීම.

- ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳ කටයුතු හා ආර්ථික ආරම්භක කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- කලාපය කේන්ද්‍ර කොට ගත් රැස්වීම්/සාකච්ඡා සහා සංවිධානය කිරීමේදී වෙනත් අමාත්‍යාංශවලට සහාය වීම.

- අනෙකුත් දකුණු ආසියාතික රටවල් සමඟ සිරකරුවන් හුවමාරු කර ගැනීම පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- උතුරු පළාත් සහා මැතිවරණයේදී නිරීක්ෂණ කණ්ඩායම් වශයෙන් දකුණු ආසියාවේ මැතිවරණ සංසදයෙන් පැමිණි කණ්ඩායම් පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු මැතිවරණ දෙපාර්තමේන්තුව සමඟ කරන ලදී.

## ද්විපාර්ශ්වික සම්බන්ධතා

## බංග්ලාදේශය

## ශ්‍රී ලංකාවේ සිදු කරන ලද නිල සංචාර

- විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, එම්.සහිදුල් හක් මහතා විදේශ කාර්යාල සාකච්ඡාවක් සඳහා දූත පිරිසක් සමඟ2013 අප්‍රේල් 21 වැනි දින ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. විදේශ කාර්යාල සාකච්ඡාවේ විශේෂ ප්‍රතිඵලය වූයේ වෙළඳ, නාවික හා සම්බන්ධතා හැකියාවන් පිළිබඳ ඒකාබද්ධ කාර්ය කණ්ඩායමක් ස්ථාපනය කිරීම පිළිබඳ වැදගත් තීරණවලට එළඹීමය.

- 2013 අගෝස්තු 29-30 වැනි දිනවල ශ්‍රී ලංකාවේදී පවත්වන ලද සාර්ක් මුදල් අමාත්‍යවරුන්ගේ 6 වැනි රැස්වීමට සහභාගී වීම සඳහා පැමිණි බංග්ලාදේශ මුදල් අමාත්‍ය, අබ්දුල් මාල් ඒ. මුහිත් මහතා එම සංචාරය අතරවාරයේ හම්බන්තොට වරාය හා මත්තල ගුවන් තොටුපල නැරඹීමට ගියේය. විශේෂයෙන් නැව් අතර හුවමාරු කර ගැනීම් සඳහා හම්බන්තොට වරායත් කොළඹ වරායත් චිතගොං වරාය සමඟ සම්බන්ධ කිරීම පිළිබඳ සාකච්ඡා පවත්වාගෙන යනු ලැබේ.

- බංග්ලාදේශයේ ජේෂකර්ම හා ජූට් කර්මාන්ත අමාත්‍ය ගරු අබ්දුල් ලතීෆ් මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් අට සාමාජික නියෝජිත පිරිසක් 2013 ජුනි 21-23 දිනවල ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. ශ්‍රී ලංකාවේ ජූට් කර්මාන්තය සංවර්ධනය කිරීම පිළිබඳ සාකච්ඡා පැවැත්විණ.

- බංග්ලාදේශ අගමැති උපදේශක මහාචාර්ය සෙයිද් මුද්දස්සර් අලි මහතා ලෝක සෞඛ්‍ය සංවිධානයේ අග්නිදිග කාර්යාලයේ අධ්‍යක්ෂ තනතුරේ අපේක්ෂකත්වයට ඉදිරිපත්වීම පිණිස අවශ්‍ය කටයුතු සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේදී 2013 ජුනි 28 -29 දෙදින හමුවක් පැවැත්විය.

- 2013 සැප්තැම්බර් මාසයේදී පැවැති මධ්‍යම, වයඹ සහ උතුරු පළාත් සභා මැතිවරණවලදී බංග්ලාදේශ මැතිවරණ නිරීක්ෂකවරුන් තිදෙනෙක් ශ්‍රී ලංකාවට පැමිණියහ.

## ශ්‍රී ලංකාව බංග්ලාදේශය තුළ කළ නිල සංචාර

- විදේශ කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය, මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා, පොදු රාජ්‍ය මණ්ඩලයීය අමාත්‍යාංශ කාර්ය කණ්ඩායමට අදාළ කරුණු සම්බන්ධයෙන් බංග්ලාදේශ අග්‍රාමාත්‍ය ෂික් හසීනා මහත්මිය හා විදේශ අමාත්‍ය, ආචාර්ය දිපු මොනී මහතා සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත් විය. පොදු රාජ්‍ය මණ්ඩලයීය අමාත්‍ය කාර්ය කණ්ඩායමේ සභාපතිත්වය උසුලන්නේ බංග්ලාදේශයයි.

- බංග්ලාදේශ ජනාධිපතිවරයාව සිටි අතිගරු සිල්ලූර් රහමන් මහතාගේ රාජ්‍ය අනුග්‍රහය යටතේ පැවැත්වුණු අවමංගල්‍ය උත්සවයේදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා නාගරික කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ඒ.එච්.එම්.ෆවුසි මහතා 2013.03.21 - 2013.03.23 දක්වා දිනවල බංගලාදේශයේ සංචාරයක නිරත විය.

- පශ්චාත් 2015 එක්සත් ජාතීන්ගේ සංවර්ධන න්‍යාය පත්‍රයේ සංදර්භය තුළ ජනගහණ ගති විද්‍යාව පිළිබඳ ගෝලීය නායකත්ව රැස්වීමට සහභාගී වීම සඳහා විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු නියොමාල් පෙරේරා මැතිතුමා 2013 මාර්තු 12-13 දිනවල ඪකා හි සංචාරයක නිරත විය.

- 2013 මැයි 25-26 දිනවල ඪකා හි පැවති ජෛව තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර සාකච්ඡා සභාවේ ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී වීම සඳහා විද්‍යා කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ගරු තිස්ස විතාරණ මහතා බංග්ලාදේශයේ සංචාරයක නිරත විය.

- රජයෙන් රජයට පදනම යටතේ බංග්ලාදේශයෙන් ශ්‍රී ලංකාවට ඖෂධ ආනයනය කළ හැකිදැයි සොයා බැලීම සඳහා සෞඛ්‍ය අමාත්‍ය, ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා 2013 අප්‍රේල් 08-11 දිනවල ඪකා හි සංචාරයක නිරත විය. බංගලාදේශයෙන් ඖෂධ ආනයනය කිරීමේ අවබෝධතා ගිවිසුමක් පිළිබඳ සාකච්ඡා පවත්වනු ලැබේ.

- පොදු රාජ්‍ය මණ්ඩලයීය කාන්තා කටයුතු අමාත්‍යවරුන්ගේ 10 වැනි රැස්වීමට සහභාගී වීම සඳහා ළමා සංවර්ධන හා වනිතා කටයුතු අමාත්‍ය ගරු තිස්ස කරල්ලියද්ද මහතා 2013 ජුනි 17-19 දිනවල ඪකා හි සංචාරයක නිරත විය. ශ්‍රී ලංකාව 2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීමේ සත්කාරක රට වන හෙයින් කරල්ලියද්ද අමාත්‍යතුමාගේ සහභාගීත්වය වැදගත් වේ.

## ශිෂ්‍යත්ව

- සාර්ථක සංකච්ඡාවලින් පසුව බංග්ලාදේශය රටේ වෛද්‍ය හා දන්ත වෛද්‍ය විද්‍යාලවල ශිෂ්‍යත්ව හතක් (7) ක් ශ්‍රී ලංකාවට පිරිනමා ඇත. මේ අතර බංගලාදේශයේ හමුදා ආයතන මගින් ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවල පුද්ගලයින් සඳහා පුහුණු වීමේ අවස්ථා ගණනාවක් පිරිනමා ඇත.

- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පිරිනමා ඇති ශිෂ්‍යත්ව 100 ට අමතරව කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨය හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය මඟින් බංග්ලාදේශ ජාතිකයින් සඳහා ශිෂ්‍යත්ව දෙකක් පිරිනමා ඇත.

## භූතානය

## ශ්‍රී ලංකාව තුළ කරන ලද සංචාර:

- ශ්‍රී ලංකා ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය මඟින් සංවිධානය කරන ලදුව 2013 අගෝස්තු 15 සිට 19 දක්වා කාලය තුළ අනුරාධපුරයේදී පවත්වන ලද 2 වැනි ජාත්‍යන්තර ජල සහයෝගිතා සම්මේලනයට සහභාගී වීම සඳහා භූතානයේ වැඩ හා මානව ජනාවාස අමාත්‍යාංශයේ සැලසුම් සම්පාදන අංශයේ ප්‍රධාන ක්‍රමසම්පාදන නිලධාරී ලාඩන් පේමා මහත්මිය ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූවාය.

## භූතානය තුළ කරන ලද සංචාර

- භූතානයේ ජාතික සභාවේ ගරු කථානායකවරයාගේ ඇරයුම පරිදි, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගරු කථානායක චමල් රාජපක්ෂ මහතා 2013 සැප්තැම්බර් 22-29 කාලය තුළ භූතානයේ සංචාරයක නිරත විය. භූතානය රාජාණ්ඩු තත්ත්වයේ සිට රජුට ධනාත්මක කාර්ය භාරයක් සහිතව ව්‍යවස්ථාදායක පාලන ක්‍රමයකට පරිවර්තනය වෙමින් පවතින නිසා මෙම සංචාරය වැදගත් වේ.

## ශිෂ්‍යත්ව

ද්විපාර්ශ්වික කටයුතුවලදී අධ්‍යාපන ක්ෂේත්‍රය වැදගත් වන හෙයින් භූතානයේ ශිෂ්‍යයින් නව දෙනෙකුට ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලවල ශිෂ්‍යත්ව පිරිනමා ඇත.

**ඉන්දියාව**

## නිල සංචාර - ඉන්දියාවෙන් ශ්‍රී ලංකාව තුළ කළ සංචාර:

භාරතීය ජනතා පක්ෂයේ සාමාජිකයින් ඇතුළු ඉන්දියානු පදනමේ ඉහළ මට්ටමේ සය සාමාජික නියෝජිත කණ්ඩායමක් ඉන්දියාව සමඟ කෙරෙන ආරම්භක කටයුතුවල II වන පථයේ කොටසක් (Track II Initiative with India)වශයෙන් 2013 ජූනි 4 සිට 8 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. II වැනි පථයේ මට්ටමේ දී අන්‍යෝන්‍ය වශයෙන් සහභාගී වීමේ අවස්ථාවක් ලැබීම වැදගත් ක්‍රමෝපාය ආරම්භනයක් ලෙස සලකනු ලැබේ.

වෙළඳාම, ආයෝජනය හා වාණිජ කටයුතු පිළිබඳ ඉන්දියා ආණ්ඩුවේ වාණිජ ලේකම් එස්.ආර්.රාඕ මහතා 2013 ජූනි 24-25 දිනවල දී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. ද්විපාර්ශ්වික ආර්ථික සහයෝගීතාව පිළිබඳ සංඛ්‍යා ලේඛන සංචාරය අවසානයේදී නිකුත් කරන ලද නිල නිවේදනයක් මඟින් පිළි ගන්නා ලදී.

- මාලදිවයින, ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර සමුද්‍රික ආරක්ෂාව පිළිබඳ ත්‍රිපාර්ශ්වික රැස්වීමක් 2013 ජූලි 8, 9 දිනවල පවත්වන ලද අතර, ඉන්දියානු නියෝජිත කණ්ඩායම ඉන්දියානු ජාතික ආරක්ෂක උපදේශක, ශිව් ෂන්කර් මෙනන් මහතාගේ නායකත්වය යටතේ මෙහෙය වනු ලැබීය. මෙම රැස්වීමේදී ගන්නා ලද තීරණ හුවා දක්වන ප්‍රතිඵල පිළිබඳ ලේඛනය තෙවැනි ත්‍රිපාර්ශ්වික රැස්වීමේදී අත්සන් කරන ලදී.

- 2013 අගෝස්තු 16-18 දිනවල අනුරාධපුරයේදී පවත්වන ලද ප්‍රජා සංවර්ධනය ජල සහයෝගීතාව පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට ලොක් සභා මන්ත්‍රී (මහාචාර්ය) ප්‍රසන් කුමාර් පදසානී මහතාසහ නියෝජිතයින් තුන් දෙනෙක් සහභාගී වූහ.

- අත්‍යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය, බලවේග රෙදිපිළි කර්මාන්තය හා පේෂකර්මාන්තය පිළිබඳ කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායක සංවර්ධනය පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සඳහා ඉන්දියාවේ පේෂ කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් සොහ්රා චැටර්ජි මහත්මිය 2013 සැප්තැම්බර් 9 වැනි දින ශ්‍රී ලංකාවට පැමිණියාය.

- ඉන්දියාවේ ජාතික ආරක්ෂක විද්‍යාපීඨයේ දාහතකින් (17) යුත් සාමාජික නියෝජිත පිරිසක් අසල්වැසි රටවන ශ්‍රී ලංකාවේ යුද්ධෝපක්‍රම පිළිබඳ වැඩ සටහනක් 2013 සැප්තැම්බර් 8-12 කාලය තුළ මෙහෙයවීමට භාර ගත්හ.

- ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර සංශෝධිත ද්විපාර්ශ්වික ගුවන් සේවා ගිවිසුමක් පිළිබඳ කොන්දේසි සාකච්ඡා කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නිල මට්ටමේ නියෝජිත පිරිසක් 2013 සැප්තැම්බර් 12-13 දින වල ශ්‍රී ලංකාවෙහි සංචාරය කළ අතර, දෙරටෙහි සිවිල් ගුවන් සේවා බලධාරීහු සංශෝධිත ආකෘතියකට අත්සන් තැබූහ.

- ඉන්දියාවේ විදේශ කටයුතු අමාත්‍ය, සල්මන් කුර්ෂිඩ් මහතා 2013 ඔක්තෝබර් 7-8 දිනවල ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නිරත විය. මෙම සංචාරයේදී ත්‍රිකුණාමලයේ ගල් අඟුරු බලාගාරයට අදාළ අවබෝධතා ගිවිසුම් ගණනාවකටද ත්‍රෛභාෂික ශ්‍රී ලංකාවක් සඳහා වූ දස අවුරුදු ජාතික සැලැස්මට ආධාරක වශයෙන් තාක්ෂණික සහාය සඳහා අවබෝධතා ගිවිසුමකට මෙම සංචාරය තුළදී අත්සන් තබන ලදී.

### නිල සංචාර

### ශ්‍රී ලංකාවෙන් ඉන්දියාව තුළ කළ සංචාර

2013 ජනවාරි 22 වැනි දින පවත්වන ලද අටවැනි ඉන්දු-ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිෂන් සභාවට සහභාගී වීම සඳහා විදේශ කටයුතු ගරු අමාත්‍ය, මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා නියෝජිත පිරිසක් සමඟ ඉන්දියාවේ සංචාරයක නිරත විය. මෙම සංචාරයේදී මහාචාර්ය පීරිස් මහතා ඉන්දීය අග්‍රාමාත්‍ය ආචාර්ය මන්මෝහන් සිං මහතා හමුවිය. මෙම සංචාරයේදී ජාත්‍යන්තර ත්‍රස්තවාදය හා නීති විරෝධී මත් ද්‍රව්‍ය ප්‍රවාහනය මැඩ පැවැත්වීම පිළිබඳ ගිවිසුමකටත් දෙවරක් බදු පැනවීම වැළැක්වීමේ ගිවිසුමකටත් අත්සන් තබන ලදී.

- ආර්ථික කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා 2013 ජූලි 5 වැනි දින නව දිල්ලියේ සංචාරයක නිරත වී උසස් නිලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්විය.

- පොදු රාජ්‍ය මණ්ඩලීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීමට සහභාගීවන ලෙස ඉන්දීය අග්‍රාමාත්‍ය මන්මෝහන් සිං මහතා වෙත ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ඇරයුම් ලිපිය භාරදීම සඳහා විදේශ කටයුතු අමාත්‍ය, ගරු මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා 2013 අගෝස්තු 19 වැනි දින ඉන්දියාවේ සංචාරයක නිරත විය.

### මාලදිවයින

### මාලදිවයිනෙන් ශ්‍රී ලංකාව තුළ කළ නිල සංචාර

- මාලදිවයිනේ ආරක්ෂක අංශ ප්‍රධානී, මේජර් ජෙනරාල් අහ්මඩ් ෂියාම් මහතා 2013 ජූනි 07-11 දිනවල ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

- මාලදිවයින, ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර සමුද්‍රික ආරක්ෂාව පිළිබඳ ත්‍රිපාර්ශ්වික රැස්වීමක් 2013 ජූලි 8 - 9 දිනවල පැවැත්වුණු අතර, මාලදිවයිනේ නියෝජිත පිරිස මාලදිවයින් ආරක්ෂක අමාත්‍ය, ගරු මහමඩ් නෂීම් මහතා විසින් මෙහෙයවනු ලැබීය.

- 2013 අගෝස්තු 16-18 දිනවල අනුරාධපුරයේදී පවත්වන ලද ප්‍රජා සංවර්ධනය සඳහා ජල සහයෝගීතාව පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට මාලදිවයිනේ පාරිසරික හා බලශක්ති අමාත්‍ය ගරු ආචාර්ය මරියම් ෂකීලා මහතා සහභාගී විය.

- අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහයෝගීතාවය පිළිබඳ අවබෝධතා ගිවිසුමට අත්සන් කිරීම සඳහා මාලදිවයින් අධ්‍යාපන අමාත්‍ය ගරු ආචාර්ය අෂිම් අහමඩ් මහතා 2013 සැප්තැම්බර් 29 වැනි දින ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

**නේපාලය**

## නේපාලයෙන් ශ්‍රී ලංකාව තුළ කළ නිල සංචාරය

- ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ 70 වැනි සාංවත්සරික උත්සවයට සහභාගීවීම සඳහා නේපාලයේහිටපු කොමියුනිස්ට් පක්ෂ නායක මධාව් කුමාර් මහතා 2013 ජූලි 02- 07 දිනවල ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

**නිල සංචාර**

## ශ්‍රී ලංකාවෙන් නේපාලය තුළ කළ නිල සංචාර

- සනීපාරක්ෂාව පිළිබඳ කලාපීය ව්‍යාපාරය දියත් කිරීමේ පාර්ලිමේන්තු සංසදයට සහභාගීවීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආචාර්ය රෝහණ පුෂ්පකුමාර මහතා සිව් සාමාජික නියෝජිත කණ්ඩායමක් සමඟ 2013 මාර්තු 18-19 දිනවල නේපාලයේ සංචාරය කළේය.

- 2013 මාර්තු 22 - 23 දිනවල පවත්වන ලද මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ නැඹුරුව හා ලිංග භේදය හඳුනාගැනීම පිළිබඳ ආසියා-ශාන්තිකර කලාපීය සම්මන්ත්‍රණයට ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වසන්ත සේනානායක මහතා සහභාගීවිය.

**පකිස්තානය**

## පකිස්තානයෙන් ශ්‍රී ලංකාව තුළ කළ නිල සංචාර

- 2013 අප්‍රේල් 4-5 දිනවල කොළඹ දී පවත්වන ලද විදේශ ලේකම් මට්ටමේ ද්විපාර්ශ්වික දේශපාලන උපදේශක රැස්වීමට සහභාගිවීම සඳහා පකිස්තානයේ විදේශ ලේකම් ජලීල් අබ්බාස් ජිලානි මහතා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

  මෙම සංචාරය අතරවාරයේදී ශ්‍රී ලංකාවේ පිහිටි ජාත්‍යන්තර සබඳතා සහ ක්‍රමෝපායික අධ්‍යයනය පිළිබඳ ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය (LKIIRSS) සහ ඉස්ලාමාබාද්හි පිහිටි ක්‍රමෝපායික අධ්‍යයන ආයතනයක් අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

- 2013 ජූනි 28-30 දිනවල පවත්වන ලද දියතලාවේ පිහිටි ශ්‍රී ලංකා යුද හමුදා අභ්‍යාසආයතනයේ විසිරයාමේ පෙළපාලිය නිරීක්ෂණය කිරීමේ ප්‍රධාන අමුත්තා වශයෙන් පකිස්තානයේ යුද හමුදා කාර්ය මණ්ඩල ප්‍රධානී, ජනරාල් අෂ්ෆාක් පර්වාස් කයානි මහතා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

- පකිස්ථානයේ ආරක්ෂක සේවා අණදෙන හා කාර්ය මණ්ඩල විද්‍යායතනයේ 34දෙනෙකුගෙන් යුත් නියෝජිත කණ්ඩායමක් 2012 අගෝස්තු 15 සිට 26 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ අධ්‍යයන චාරිකාවක නිරත විය.

- ශ්‍රී ලංකා ජල සම්පාදන හා ජලපවාහන අමාත්‍යාංශය මඟින් සංවිධානය කරන ලදුව 2013අගෝස්තු 15 වන දින සිට 26 වැනි දින දක්වා කාලය තුළ අනුරාධපුරයේදී පවත්වන ලද දෙවැනි ජාත්‍යන්තර ජල සහයෝගීතාව පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගීවීම සඳහා පකිස්තානයේ ජල සම්පාදන හා බලශක්ති අමාත්‍ය, ගරු අබිඩ් ෂර් අලී මහතා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරතවිය.

- 2013 සැප්තැම්බර් 01-4 දිනවල පැවැති හයවැනි දකුණු ආසියා සමුළුවට සහභාගීවීම සඳහා පකිස්ථානයේ ක්‍රමසම්පාදනය හා සංවර්ධනය පිළිබඳ ෆෙඩරල් අමාත්‍ය, ගරු අෂාන් ඉක්බාල් මහතා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

## නිල සංචාර

## ශ්‍රී ලංකාවෙන් පකිස්ථානය තුළ කළ නිල සංචාර

- විදේශ කටයුතු අමාත්‍ය, ගරු මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා 2013 අගෝස්තු 22-24 කාලය තුළ පකිස්තානයේ සංචාරයක නිරත විය. එතුමා 2013 අගෝස්තු 23 වැනි දින, ජනාධිපති අසීෆ් අලී සර්දාරි, අග්‍රාමාත්‍ය, නවාස් ෂරීෆ් සහ මුදල් අමාත්‍ය, මහමඩ් ඉෂාක් දාර් යන මහත්වරුන් හමුවිය.

- 2013 අප්‍රේල් 28-30 දිනවල පැවැති නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ වාණිජ ලේකම් මට්ටමේ ද්වීපාර්ශ්වික සාකච්ඡාවලට සහභාගීවීම සඳහා කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ ලේකම්, අනුර සිරිවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් දූත පිරිසක් පකිස්ථානයේ සංචාරයක නිරත විය.

## ශිෂ්‍යත්ව

ශ්‍රී ලාංකික ශිෂ්‍යයින් එකොළොස්දෙනෙකුට (11) වෛද්‍ය විද්‍යා (MB.Bs), ඉංජිනේරු යන ක්ෂේත්‍රවල අධ්‍යයනය කිරීම සඳහා පකිස්තානු කාර්මික ආධාර ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ ශිෂ්‍යත්ව පිරිනමන ලද අතර, ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ පකිස්තානුශිෂ්‍යයින් තුන්දෙනෙකුට ශිෂ්‍යත්ව පිරිනමන ලදී.

## සාර්ක් අංශය

සාමාජික රටවල් : ඇෆ්ගනිස්ථානය, බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්තානය සහ ශ්‍රී ලංකාව

සාර්ක් නිරීක්ෂක රටවල් : චීනය, ජපානය, දකුණු කොරියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉරානය, මුරුසිය, ඕස්ට්‍රේලියාව, මියන්මාරය සහ යුරෝපා සංගමය

මූලස්ථානයේ පිහිටීම : කත්මණ්ඩු (නේපාලය)

### විදේශ කටයුතු අමාත්‍යාංශයේ සාර්ක් අංශයේ ප්‍රධාන කාර්ය කටයුතු

1. සාර්ක් සංසදයේ ආචාරවිධි හා ක්‍රියාපිළිවෙත් ප්‍රකාරව සාර්ක් හා සම්බන්ධ රැස්වීම් පැවැත්වීම සඳහා ශ්‍රීලංකාවේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ආයතනවලට සහායලබාදීම.
2. සාමාජික රටවල පැවැත්වෙන සාර්ක් රැස්වීම්වලට සහභාගීවීම සඳහා විවිධ අමාත්‍යාංශවල නියෝජිතයින්ට පහසුකම් සැලසීම.
3. සාර්ක් රැස්වීම් සඳහා සහභාගීවීමට සාර්ක් වීසා බලපත් ලබාගැනීමට ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායම්වලට සහාය ලබාදීම.
4. සාර්ක් ලේකම් කාර්යාලය සහ සාර්ක් කලාපීය මධ්‍යස්ථාන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

### 2013 වර්ෂයේදී පැවති සාර්ක් අමාත්‍යවරුන්ගේ රැස්වීම්

1. 2013 අගෝස්තු 23 වැනි දින කොළඹදී පැවති දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමට ඇතුළත් රටවල අමාත්‍යවරුන්ගේ එකොළොස්වැනි රැස්වීමසංවිධානය කරන ලද්දේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයයටතේ වාණිජ දෙපාර්තමේන්තුව මඟිනි.

   එහිදී දකුණු ආසියානු රටවල වාණිජ/වෙළඳ අමාත්‍යවරු අරලියගහ මන්දිරයේදී ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමා හමුවී සාකච්ඡා පවත්වන ලදී.

2. 2013 අගොස්තු 30 වන දින කොළඹදී පැවති සාර්ක් මුදල් අමාත්‍යවරුන්ගේ හයවැනි රැස්වීම.

   මෙම රැස්වීම සංවිධානය කරන ලද්දේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය මඟිනි.
   දකුණු ආසියානු රටවල මුදල් අමාත්‍යවරු 2013 අගෝස්තු 30 වැනි දින අරලියගහ මන්දිරයේදී අතිගරු ජනාධිපතිතුමා සමඟ උදය ආහාරය අතරතුරදී පැවති සාකච්ඡාවකට සහභාගී වූහ.

3. 2013 මැයි 03 වැනි දින නවදිල්ලි නුවරදී පැවති සාර්ක් මුදල් අමාත්‍යවරුන්ගේ නිල නොවන රැස්වීමක් පවත්වන ලදී.

   2013 වර්ෂය තුළ දී ශ්‍රී ලංකාවේදී පවත්වන ලද රැස්වීම.

ශ්‍රී ලංකාවේ ගැටුම්වලින් පසු අවධියේ පවත්නා යහපත් වාතාවරණය සැලකිල්ලට ගනිමින් සාර්ක් සාමාජික රටවල් සාර්ක් රැස්වීම් ශ්‍රී ලංකාවේ පැවැත්වීමට විශේෂ උනන්දුවක් දක්වා තිබේ.

මෙම තත්ත්වය යටතේ, 2013 වර්ෂයේදී වැඩි රැස්වීම් ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ පවත්වා තිබේ. නව ඉදිරිපත්වීම් හා ඉල්ලීම් රැසක් පැවතුනද, සමහර අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල අයවැය සම්බන්ධයෙන් පැවති බාධක හමුවේ සමහර රැස්වීම් ශ්‍රී ලංකාවේ නොපැවැත්විණි.

මෙම අමාත්‍යාංශයේ සාර්ක් අංශයේ අනුග්‍රහය යටතේ පහත සඳහන් අමාත්‍ය මට්ටමේ රැස්වීම් හා තවත් රැස්වීම් කීපයක් පවත්වන ලදී. මේ සඳහා අවශ්‍යවූ සැපයුම් කටයුතු, මාර්ගෝපදේශ හා ධජ, නාමපුවරු වැනි විශාල ප්‍රමාණයේ අවශ්‍යවන ද්‍රව්‍ය සපයන ලද්දේ මෙම අමාත්‍යාංශයේ සාර්ක් අංශය මඟිනි.

සාර්ක් රැස්වීම් පැවැත්වීමේ ක්‍රමවේදය පිළිබඳව පහත සඳහන් රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු දැනුවත් කිරීම සඳහා පෙර සූදානම්වීමේ රැස්වීම්වට කිහිපයක් පවත්වන ලදී.

a) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
b) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
c) ජන මාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය
d) සෞඛ්‍ය අමාත්‍යාංශය
e) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
f) වාණිජ දෙපාර්තමේන්තුව
g) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
h) පොලිස් දෙපාර්තමේන්තුව
i) රේගු දෙපාර්තමේන්තුව
j) සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය
k) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
l) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

මුදල් අමාත්‍ය මට්ටමේ රැස්වීම්වල සම්බන්ධීකරණ නිලධාරීන් ලෙස රාජකාරී ඉටුකරන ලද මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් පුහුණු කිරීම හා ඔවුන්ට මාර්ගෝපදේශ ලබාදීම සිදු කරන ලද්දේ විදේශ කටයුතු අමාත්‍යාංශය විසිනි. අලුතින් බඳවා ගන්නා ලද ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් පුහුණු කරන ලද්දේ මෙම අමාත්‍යාංශයේ සාර්ක් හා සන්ධාන අංශ මඟිනි.

1. සාර්ක් සාමාජික රටවල් අතර ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සහ සංචාරකයන්ගේ සිත් ඇද බැඳගන්නා ස්ථාන විදහා දැක්වීම.

2. ශ්‍රී ලංකාවේ හෝටල් කර්මාන්තයට සහ එකී කාර්යමණ්ඩලවලට ජාත්‍යන්තර මට්ටමේ සමුළු පැවැත්වීම පිළිබඳ පළපුරුද්දක් ලබාදීම, අරමුණු කරගනිමින් කොළඹින් බැහැර පළාත්වල මෙම රැස්වීම් පැවැත්වීමට රේඛීය අමාත්‍යාංශ දිරිගැන්විය.

කෙසේවෙතත් සැපයුම් කටයුතු හා සම්බන්ධ දුෂ්කරතා හේතු කොටගෙන වයික්කාල හා කොග්ගල යන ප්‍රදේශවලදී එනම් කොළඹින් බැහැර ප්‍රදේශවලදී රැස්වීම් පවත්වන ලද්දේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය පමණි.

## 2013 වසරේදී ශ්‍රී ලංකාවේ පවත්වන ලද රැස්වීම්

1. 2013 අප්‍රේල් 24-27 දිනවලදී කොළඹදී පැවති ගැටුම් විසඳීමේදී සහ සාමය ස්ථාපිත කිරීමේදී මාධ්‍යයේ කාර්යභාරය පිළිබඳ සමුළුව - සංවිධානය කරන ලද්දේ ජන මාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය විසිනි.

2. 2013 මැයි 28-30 දිනවලදී කොළඹදී පැවති සාර්ක් කලාපයේ නිපුණතා සංවර්ධනය සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය (SHRDC)

   මෙය සංවිධානය කරන ලද්දේ ජාතික අධ්‍යාපනික ආයතනය විසිනි.
   අධ්‍යක්ෂ ජනරාල්/ සාර්ක්, ආර්.ඩී.රාජපක්ෂ මහත්මිය මෙම රැස්වීමට සහභාගීවූවාය.

3. 2013 ජූනි 13-17 දිනවලදී කොළඹදී පැවති ක්ෂය රෝගය සහ එච්.අයි.වී.ඒඩ්ස් මර්දන වැඩසටහනේ කාර්ය කටයුතු සඳහා කළමනාකරණ තොරතුරු පිළිබඳ සාර්ක් කලාපීය වැඩමුළු පුහුණුව.

   මෙය සංවිධානය කරන ලද්දේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසිනි.
   අධ්‍යක්ෂ ජනරාල්/ සාර්ක්, ආර්.ඩී.රාජපක්ෂ මහත්මිය සහ සහකාර අධ්‍යක්ෂ/ සාර්ක් කෙත්මා රාජපක්ෂ මහත්මිය මෙම රැස්වීමට සහභාගී වූහ.

4. 2013 සැප්තැම්බර් 05- 06 දිනවලදී කොළඹ පැවති ගොවිපළ සතුන්ගේ ජාන සම්පත් සුරක්ෂාකිරීම කිරීම පිළිබඳ කලාපීය අධ්‍යයනය.

   මෙය සංවිධානය කරන ලද්දේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසිනි.

5. 2013 මාර්තු 04-15 දිනවලදී කොළඹ පැවති ත්‍රස්තවාදී මර්දන ක්‍රමෝපායික කළමනාකරණ පුහුණු වැඩසටහන.

   සංවිධානය කරන ලද්දේ ශ්‍රී ලංකා පොලීසිය විසිනි.
   අධ්‍යක්ෂ ජනරාල්/ සාර්ක්, ආර්.ඩී.රාජපක්ෂ මහත්මිය සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සාර්ක් පෝෂිතපෙරේරා මහතා මෙම වැඩසටහනට සහභාගීවූහ.

6. 2013 මාර්තු 15-16 දිනවලදී කොළඹ පැවති බලශක්තිය පිළිබඳ සාර්ක් ක්‍රියාකාරී කණ්ඩායමේ හත්වන රැස්වීම.
   මෙය සංවිධානය කරන ලද්දේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයයි.
   අධ්‍යක්ෂ ජනරාල්/ සාර්ක්,ආර්.ඩී.රාජපක්ෂ මහත්මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සාර්ක් පෝෂිත පෙරේරා මහතා සහ පර්යේෂණ නිලධාරී/ ජූඩ් චන්දිමාල් මහතා මීට සහභාගීවූහ.

7. 2013 ජූනි 18-21 දිනවලදී කොළඹ පැවති රේගු සහයෝගීතාව පිළිබඳ සාර්ක් උප කණ්ඩායමේ නවවැනි රැස්වීමට පසුව පැවති රේගු කටයුතු පිළිබඳ 3 වැනි පුහුණු වැඩසටහන.

   අධ්‍යක්ෂ ජනරාල්/ සාර්ක්, ආර්.ඩී.රාජපක්ෂ මහත්මිය සහ පර්යේෂණ නිලධාරී/ සාර්ක් ජූඩ් චන්දිමාල් මහතා මීට සහභාගීවූහ.

8. 2013 අගෝස්තු 23 දින කොළඹදී පැවති දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුමට අයත් රටවල අමාත්‍යවරුන්ගේ රැස්වීමේ එකොළොස්වැනි රැස්වීම.

මෙය සංවිධානය කරන ලද්දේ කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය (වාණිජ දෙපාර්තමේන්තුව) මඟිනි.

අධ්‍යක්ෂ ජනරාල්/ සාර්ක්, ආර්.ඩී.රාජපක්ෂ මහත්මිය සහ පර්යේෂණ නිලධාරී/ ප්‍රූඩ් චන්දිමාල් මහතා මීට සහභාගීවූහ.

9. 2013 අගෝස්තු 21-22 දිනවලදී කොළඹදී පැවති දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ විශේෂඥ කමිටුවේ අටවැනි රැස්වීම.

මෙය සංවිධානය කරන ලද්දේ වාණිජ දෙපාර්තමේන්තුව මඟිනි.
අධ්‍යක්ෂ ජනරාල්/ සාර්ක්,ආර්.ඩී.රාජපක්ෂ මහත්මිය, පර්යේෂණ නිලධාරී/ ප්‍රූඩ් චන්දිමාල් මහතා මීට සහභාගීවූහ.

10. 2013 අගෝස්තු 30 වැනි දින කොළඹදී පැවති සාර්ක් මුදල් අමාත්‍යවරුන්ගේ හයවැනි රැස්වීම.
මෙය සංවිධානය කරන ලද්දේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය මඟිනි.
අධ්‍යක්ෂ ජනරාල්/ සාර්ක්, ආර්.ඩී.රාජපක්ෂ මහත්මියමෙම රැස්වීමට සහභාගීවිය.

11. 2013 අගෝස්තු 29 වැනි දින කොළඹදී පැවති සාර්ක් මුදල් ලේකම්වරුන්ගේ රැස්වීමේ හයවැනි රැස්වීම.
මෙය සංවිධානය කරන ලද්දේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය මඟිනි.
අධ්‍යක්ෂ ජනරාල්/ සාර්ක්, ආර්.ඩී.රාජපක්ෂ මහත්මියමෙම රැස්වීමට සහභාගීවිය.

12. 2013 සැප්තැම්බර් 9-10 දිනවලදී පැවති සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයේ පස්වැනි රැස්වීම සංවිධානය කරන ලද්දේ සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය විසිනි.

අධ්‍යක්ෂ ජනරාල්/සාර්ක් - ආර්.ඩී.රාජපක්ෂ මහත්මිය සහ සාර්ක්/පර්යේෂණ නිලධාරි ප්‍රූඩ් චන්දිමාල් මහතා මෙම රැස්වීමට සහභාගි වූහ.

13. 2013 සැප්තැම්බර් 24-27 දිනවලදී සාර්ක් සාමාජික රටවලින් සහභාගිවූවන් සඳහා පැවති මූඩ්ල් හුවමාරු වෙබ් අඩවිය පදනම් කරගත් අධ්‍යයන ද්‍රව්‍ය පිළිබඳ කලාපීය වැඩමුළුව

* සංවිධානය කරන ලද්දේ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මඟිනි.
අධ්‍යක්ෂ ජනරාල්/සාර්ක්- ආර්.ඩී. රාජපක්ෂ මහත්මිය මෙම රැස්වීමට සහභාගි විය.

14. හණ කෙඳි, රෙදිපිළි සහ පදනම් කළ හම් පිළිබඳ ආංශික තාක්ෂණික කමිටුවේ (STC) තුන්වැනි රැස්වීම. මෙම රැස්වීම සඳහා සත්කාරකත්වය ලබාදෙන ලද්දේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් වන අතර මෙය 2013 දෙසැම්බර් 18-19 දිනවලදී කොළඹදී පවත්වන ලදී. මෙම රැස්වීම පැවැත්වීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට සහාය ලබාදෙන ලදී.

15. කෘෂිකර්ම පර්යේෂණ හා ව්‍යාප්තිය පිළිබඳ අන්තර් ආණ්ඩු කණ්ඩායමේ තෙවැනි රැස්වීම. මෙය 2013 දෙසැම්බර් 19-20 දිනවලදී ශ්‍රී ලංකාවේදී පවත්වන ලදී.

16. ත්‍රස්ත වැරදි නිරීක්ෂණය කිරීමේ සාර්ක් ඒකකයේ(STOMD) සහ මත්ද්‍රව්‍ය වැරදි නිරීක්ෂණය කිරීමේ සාර්ක් ඒකකයේ(SDOMD) දත්ත පාදකයේ ආරක්ෂාව හා මෙහෙයුම් යාන්ත්‍රණයේ පද්ධති සහතිකකරණය. මෙම ඒකක දෙකෙහි ආරක්ෂිත වෙබ් පෝටලය 2013 ඔක්තෝබර් 24 වැනි දින කොළඹදී එළි දක්වන ලදී. මෙම වෙබ් පෝටල මඟින් සියලුම සාමාජික රටවලට තොරතුරු බෙදා හදාගත හැකිය. මේ හා සම්බන්ධ තාක්ෂණික විශේෂඥයින්ගේ රැස්වීමක් පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව විසින් දින වකවානු යෝජනා කර තිබුණද, එම රැස්වීම පැවැත්වීමට නොහැකි විය. අධ්‍යක්ෂ ජනරාල්/සාර්ක්, ආර්.ඩී.රාජපක්ෂ හා සහකාර අධ්‍යක්ෂ/සාර්ක්, බෙත්මා රාජපක්ෂ යන නිලධාරීන් ඉහත රැස්වීම සඳහා සහභාගි වූහ.

## <u>**2013 වසරේදී වෙනත් සාර්ක් රටවල පවත්වන ලද රැස්වීම්**</u>

| උප ශීර්ෂය | විෂය | කෙටි විස්තරය | සටහන් |
|---|---|---|---|
| පාරිසරික හා ආපදා කළමනාකරණ | සාර්ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයේ අටවැනි රැස්වීම | 2013 ඔක්තෝබර් 30-31 දිනවලදී ඉන්දියාවේදී මෙම රැස්වීම පවත්වන ලදී. එහිදී ශ්‍රී ලංකාව නියෝජනය කරන ලද්දේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් එස්.එස්.මොහමඩ් මහත්මිය විසිනි. | මෙම රැස්වීම පැවැත්වීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට සහාය ලබාදෙන ලදී. |
| | මුහුදුබඩ කලාපය කළමනා කිරීමේ සාර්ක් මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයේ දහවැනි රැස්වීම | මෙම රැස්වීම, 201නොවැම්බර් 09-10 දිනවලදී මාලදිවයිනේදී පවත්වන ලදී. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අනිල් ප්‍රේමරත්න මහතා ඉහත රැස්වීමට සහභාගි විය. | කර්මාන්ත හා වාණිජ අමාත්‍ය ගරු රිෂාඩ් බදියුදීන් මහතා ඊට සහභාගි වූ අතර මෙහිදී ඉන්දියාවේ වාණිජ අමාත්‍යාවරයා සමඟ සාකච්ඡා පැවැත්විය. |
| වෙළෙඳ ප්‍රවර්ධන | හණ, රෙදිපිළි සහ පදම් කළ හම් පිළිබඳ ආංගික තාක්ෂණික කමිටුවේ (STC) තෙවැනි රැස්වීම | මෙම රැස්වීම සඳහා සත්කාරකත්වය සපයන ලද්දේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වන(SLSI) අතර එය පවත්වන ලද්දේ 2013 දෙසැම්බර් 18-19 දිනවලදී කොළඹදීය. | |
| | සාර්ක් ව්‍යාපාරික නායකයන්ගේ පස්වැනි රැස්වීම | මෙය 2014 ජනවාරි 16-17 දිනවලදී නවදිල්ලි නුවර දී පවත්වන ලදී. | |
| බහු පාර්ශ්වීය සබඳතා | සාර්ක් නායකවරුන්ගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමයේ හත්වැනි සමුළුව | මෙය 2014 දෙසැම්බර් 21-24 දිනවලදී මාලදිවයිනේ දී පවත්වන ලදී. | පාර්ලිමේන්තුවේ කථානායක ගරු චමල් රාජපක්ෂ මහතාගේ නායකත්වයෙන් යුතු පාර්ලිමේන්තු නියොජිත කණ්ඩායමක් මීට සහභාගිවිය. විදේශ කටයුතු අමාත්‍යාංශය, පසුගිය පරිචයන් පිළිබඳ කරුණු පැහැදිලි කරමින් හා තොරතුරු ලබාදෙමින් ශ්‍රී ලංකාවෙන් සහභාගි වූ නියෝජිත කණ්ඩායමට සහාය දැක්විය. |
| අධ්‍යාපනය | සාර්ක් තොරතුරු මධ්‍යස්ථානයේ (SIC) පාලක මණ්ඩලයේ නවවැනි රැස්වීම | මෙම රැස්වීම, නේපාලයේ කත්මන්ඩු නුවරදී 2013 නොවැම්බර් 13-14 දිනවලදී පවත්වන ලදී. | |

| | | | |
|---|---|---|---|
| | සාර්ක් මානව සම්පත් සංවර්ධන මධ්‍යස්ථානයේ (SHRDC) පාලක මණ්ඩලයේ දාහතරවැනි රැස්වීම | මෙම රැස්වීම, 2013 නොවැම්බර් 21-22 දිනවලදී පකිස්තානයේ ඉස්ලාමාබාද් නුවරදී පවත්වන ලදී. | |
| කෘෂිකර්මය/ ආහාර | කෘෂිකර්ම පර්යේෂණ හා ව්‍යාප්තිය පිළිබඳ අන්තර් ආණ්ඩු ප්‍රධාන කණ්ඩායමේ තුන්වැනි රැස්වීම | මෙම රැස්වීම, 2013 දෙසැම්බර් 19-20 දිනවලදී ශ්‍රී ලංකාවේදී පවත්වන ලදී. | |
| | සාර්ක් ආහාර බැංකුවේ පාලක මණ්ඩලයේ හයවැනි රැස්වීම | මෙම රැස්වීම, 2013 නොවැම්බර් 25-26 දිනවලදී භූතානයේ තිම්පු නුවරදී පවත්වන ලදී. | |
| සෞඛ්‍යය | සාර්ක්-ටියුබකියුලෝසිස් හා එච්.අයි.වී./ඒඩ්ස් මධ්‍යස්ථානයේ (STAC) පාලක මණ්ඩලයේ විසි තුන්වැනි රැස්වීම | මෙම රැස්වීම, 2013 නොවැම්බර් 07-08 දිනවලදී නේපාලයේ කත්මන්ඩු නුවරදී පවත්වන ලදී. | |
| විදේශීය ආධාර | සාර්ක් සංවර්ධන අරමුදලේ (SDF) පාලක මණ්ඩලයේ දාහත්වැනි රැස්වීම | මෙම රැස්වීම, 2013 දෙසැම්බර් 03-05 දිනවලදී ඇෆ්ගනිස්තානයේ කාබුල් නුවරදී පවත්වන ලදී. | සාර්ක් සංවර්ධන අරමුදල යටතේ ශ්‍රී ලංකාවේ සහ සාර්ක් රටවල් සියල්ලගේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති පහත දැක්වේ.<br>1. ළමුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම සඳහා දකුණු ආසියානු රටවල ක්‍රියාමාර්ග(SAIEVC ) මේ සඳහා සම්පූර්ණ ඇස්තමේන්තුව ඇ.ඩො.410,000 කි.( 2010 සිට 2015 දක්වා)<br>2. සාර්ක් කලාපයේ සිටින සියරට ජේරු ශ්‍රමිකයන්ගේ ජීවන තත්ත්ව නගාසිටුවීම සඳහා පියවර ශක්තිමත් කිරීම. සම්පූර්ණ ඇස්තමේන්තුව ඇ.ඩො. මිළියින 1.4 කි.<br>3. ඇෆ්ගනිස්තානය,බංග්ලාදේශය,භූතානය,න ේපාලය සහ ශ්‍රී ලංකාව යන රටවල දී හයිඩ්‍රොක්ලෝරොෆ්ලෝරෝ කාබන කළමනාකරණ |

| | | | |
|---|---|---|---|
| | | | සැලැස්මේ දේශගුණික හා බලශක්තිය භාවිතා වන සංරචකය ක්‍රියාත්මක කිරීම. මේ සඳහා යෝජිත අයවැය ඇ.ඩො.5,500,000කි. (මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය කාලසීමාව 2012 ජූලි සිට 2015 ජූනි දක්වා වෙයි)<br>4. සාර්ක් රටවල පසු අස්වනු කළමනාකරණය හා පෝෂිත ප්‍රදේශ ඇති කිරීමේ දී පලතුරු සඳහා වටිනාකම් එක්කිරීම<br>5. සාර්ක් රටවල තෝරාගත් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ජල, සනීපාරක්ෂක සහ සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීම. මේ සඳහා සමස්ත අයවැය ශ්‍රී ලං.රු.119,041,823 කි.<br>6. ප්‍රතිශක්තිකරණය ඇතුළුව පශ්චාත් මාතෘ හා ළදරු සෞඛ්‍යය සවිබල ගැන්වීම. මෙම ව්‍යාපෘතිය දැනටමත් සම්පූර්ණ කර ඇත. |
| ආරක්ෂාව/ නීතිය බලාත්මක කිරීම | සාර්ක් ත්‍රස්ත වැරදි නිරීක්ෂණ ඒකක, (STOMD) සහ සාර්ක් මත්ද්‍රව්‍ය වැරදි නිරීක්ෂණ ඒකක (SDOMD) දත්ත පාදකයේ ආරක්ෂාව හා මෙහෙයුම් යාන්ත්‍රණයේ පද්ධති සහතිකකරණය | ත්‍රස්ත වැරදි නිරීක්ෂණ ඒකකයේ සහ මත්ද්‍රව්‍ය වැරදි නිරීක්ෂණ ඒකකයේ ආරක්ෂිත වෙබ් පෝටලය 2013 ඔක්තෝබර් 24 වැනි දින කොළඹ දී දියත් කරන ලදී. මෙම වෙබ් පෝටලය මඟින් සියලුම සාමාජික රටවලට තොරතුරු හුවමාරු කර ගැනීමට ඉඩකඩ ලබාදෙයි. ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් තාක්ෂණික විශේෂඥවරුන්ගේ රැස්වීමක් පැවැත්වීම සඳහා දින වකවානු දෙකක් යොදා ගත්තද එය පැවැත්විය නොහැකි විය. | ප්‍රධාන අමුත්තා ලෙස, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා මෙම අවස්ථාව වර්ණවත් කළේය. |

| | | | |
|---|---|---|---|
| වෙනත් | සාර්ක් වැඩසටහන් කමිටුවේ හතලිස් හතරවැනි සැසිවාරය | මෙම රැස්වීම 2013 දෙසැම්බර් 09-11 දිනවලදී නේපාලයේ කත්මන්ඩු නුවර පිහිටි සාර්ක් ලේකම් කාර්යාලයේදී පවත්වන ලදී. | විදේශ කටයුතු අමාත්‍යාංශයේ සාර්ක් අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙම රැස්වීමට සහභාගි විය. සාර්ක් ලේකම් කාර්යාලය හා සම්බන්ධ පරිපාලනමය හා මූල්‍ය කටයුතු සඳහා 43 වැනි රැස්වීමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ සමාලෝචනය කිරීම සඳහා කරුණු රාශියක් පිළිබඳව මෙහිදී සාකච්ඡා කරන ලදී. |

## සාර්ක් ගිවිසුම්

2011 නොවැම්බර් මස මාලදිවයිනේ අඩ්ඩු සිටිහි දී පැවැත්වූ 17 වැනි සාර්ක් සමුළුව අතරතුරදී අත්සන් තබන ලද සාර්ක් ගිවිසුම් පහත දක්වා ඇත.

1. ස්වාභාවික ආපදාවලදී සීඝ්‍රයෙන් ප්‍රතිචාර දැක්වීම පිළිබඳ සාර්ක් ගිවිසුම
2. සාර්ක් බීජ බැංකු ගිවිසුම
3. අනුකූලතා තක්සේරුව හඳුනාගැනීම සඳහා බහුපාර්ශ්වීය වැඩ පිළිවෙළ පිළිබඳ සාර්ක් ගිවිසුම
4. කලාපීය ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාර්ක් ගිවිසුම
5. ආහාර බැංකු ගිවිසුම

   මෙම අංශය, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වැනි රේඛීය ආයතනය සමඟ එක්ව මෙම ගිවිසුම්වල තහවුරු කිරීමේ කටයුතු නිම කිරීම සඳහා කටයුතු කරයි. මෙම අංශය, ගිවිසුම්වල තහවුරු කිරීමේ කටයුතු නිම කිරීම සඳහා නීති අංශය සමඟ ද සහයෝගිතාවයෙන් යුතුව කටයුතු කරයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, සාර්ක් බීජ බැංකු ගිවිසුමෙහි සහ ආහාර බැංකු ගිවිසුමෙහි ශ්‍රී ලංකාව විසින් සිදුකළ යුතු වන තහවුරු කිරීමේ කටයුතු සිදුකෙරෙමින් පවතින අතර අනෙකුත් ගිවිසුම් සම්බන්ධයෙන් තහවුරු කිරීමේ කටයුතු නිම කිරීම සඳහා සාර්ක් අංශය, අදාළ අමාත්‍යාංශ සමඟ සමීපව කටයුතු කරමින් සිටියි.

# නැගෙනහිර ආසියා හා පැසිෆික් අංශය

## නැගෙනහිර ආසියා හා පැසිෆික් අංශය

ආවරණය කරන රටවල් : ඕස්ට්‍රේලියාව, බෲනායි දරුස්සලාම්, චීනය,කාම්බෝජය,කොරියානු ප්‍රජාතන්ත්‍රවාදී මහජන ජනරජය, ෆීජී, ඉන්දුනීසියාව, ජපානය, කොරියාව, ලාඕසය, මැලේසියාව, මොන්ගෝලියාව, මියන්මාරය, නවසීලන්තය, පිලිපීනය, පැපුවා නිව්ගිනියාව, සිංගප්පූරුව, තායිලන්තය, වියට්නාමය, වනවාටු සහ හොංකොං විශේෂ පරිපාලන ප්‍රදේශ, සොලොමන් දූපත්

නේවාසික දූත මණ්ඩල හා දූත කාර්යාල සංඛ්‍යාව : තානාපති කාර්යාල 11 (ඕස්ට්‍රේලියාව,චීනය,ඉන්දුනීසියාව,ජපානය,දකුණු කොරියාව,මැලේසියාව,මියන්මාරය,පිලිපීනය,සිංගප් පූරුව, තායිලන්තය, වියට්නාමය)

: කොන්සල් කාර්යාල 05 (ඕස්ට්‍රේලියාව - සිඩ්නි,මෙල්බර්න්, චීනය-ෂැංහයි,චෙන්ග්ඩු සහ ගුවැන්ෂූ)

සමගාමීව අක්ත ගැන්වීම්:

ඕස්ට්‍රේලියාව - කැන්බරා : ෆීජී, නවසීලන්තය, පැපුවා නිව් ගිනියාව, වනවාටු සහසොලමන් දූපත්

චීනය : කොරියානු ප්‍රජාතන්ත්‍රවාදී මහජන ජනරජය, මොන්ගෝලියාව

සිංගප්පූරුව : බෲනායි දරුස්සලාම්

තායිලන්තය : කාම්බෝජය සහ ලාඕසය

බහුපාර්ශ්වීය/ කලාපීය සංවිධාන සංඛ්‍යාව: ආසියාන් කලාපීය සංසඳය (ARF), ෂැංහයි සහයෝගීතාසංවිධානය (SCO)

ආවරණය කරන වෙනත් සංවිධාන සංඛ්‍යාව : බාලි ප්‍රජාතන්ත්‍රවාදී සංසඳය, ෂැංග්‍රිලා සංවාදය

**නැගෙනහිර ආසියා සහ පැසිෆික් අංශයේප්‍රධාන කාර්ය ක්ෂේත්‍ර පහත දැක්වෙන ආකාරයට පුළුල්ව වර්ගීකරණය කළ හැක.**

- අතිගරු ජනාධිපතිතුමාගේ, ගරු අග්‍රාමාත්‍යවරයාගේ, ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ, වෙනත් කැබිනට් අමාත්‍යවරුන්ගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ ද්විපාර්ශ්වික සංචාර පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

- විදේශීය සම්භාවනීය පුද්ගලයන් ශ්‍රී ලංකාවේ සිදුකරන සංචාර සඳහා කටයුතු සූදානම් කිරීම

- දේශපාලනික, අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික ප්‍රවණතා පිළිබඳ පසුවිපරම් සහ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

- ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සහ කලාපයේ පවතින ව්‍යවස්ථාදායක ආයතන අතර කාර්යය කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- දේශපාලනික, විද්‍යාත්මක හා තාක්ෂණික, අධ්‍යාපනික සහ සංස්කෘතික ක්ෂේත්‍ර පිළිබඳව ද්විපාර්ශ්වික ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් සකස් කිරීම සහ අත්සන් කිරීම පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- සමුළු හා වෙනත් අදාළ රැස්වීම් සඳහා සැපයුම් සංවිධානය හා සම්බන්ධ ගැටලු සහ වැදගත් වන වෙනත් ගැටලු පිළිබඳව කටයුතු කිරීම ඇතුළුව ආසියාන් කලාපීය සංසදය (ARF), ෂැංහයි සහයෝගීතා සංවිධානය (SCO) සහ බාලි ක්‍රියාදාමය සම්බන්ධයෙන් වන කාර්යය කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- ෂැංග්‍රිලා සංවාදය සහ බාලි සංසදය සඳහා වැදගත් සහ සැපයුම් සංවිධාන කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- ශිෂ්‍යත්ව වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

- විදේශ රටවල දූත මණ්ඩලවලින් ලැබෙන මාසික තොරතුරු වාර්තා පිළිබඳව දත්ත සැකසීම.

- කලාපයට අදාළ සංචාර සහ සමුළු සඳහා ලුහුඬු සටහන් සකස් කිරීම.

- මෙම අංශයේ විෂය පථය යටතේ ආවරණය කෙරෙන රටවල්වලින් නිකුත් කෙරෙන එක් එක් රටවල සංචාරය කිරීම පිළිබඳ උපදේශන මාලා (Travel Advisories) අධීක්ෂණය කිරීම.

- කලාපය තුළ පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට උපදෙස් දීම හා අවශ්‍ය මාර්ගෝපදේශ/ තොරතුරු ලබාදීම.

## මහජන චීන ජනරජය (බීජිං)

අතිගරු ජනාධිපතිතුමා මැයි මාසයේ දී චීනයේ නිරත වූ රාජ්‍ය සංචාරයේදී ද්විපාර්ශ්වික සබඳතා, ක්‍රමෝපායික සහයෝගීතා පාර්ශ්වකාරීත්වයක් දක්වා ඉහළ නංවමින් චීනයේ ජනාධිපති අතිගරු XI වැනි ජින් ජින්ග් මැතිතුමා සමඟ ඵලදායී සාකච්ඡාවල නිරත විය. මෙහිදී ආර්ථික, තාක්ෂණික සහයෝගීතා, වෙළඳ, කෘෂිකර්ම හා රාජ්‍ය ආරක්ෂක සහයෝගීතා ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ද්විපාර්ශ්වික ගිවිසුම්වලට අත්සන් තබන ලදී.

ශ්‍රී ලංකා ජාතික ඇස් බැංකුව, වෙන්ග්ඩු හි අයිඩි අක්ෂි රෝහල සමඟ සහයෝගීතා ගිවිසුමකට අත්සන් තැබීය.

කොළඹ සහ ෂැංහයි අතර සහෝදර නගර සබඳතාවය සම්බන්ධයෙන් අත්සන් තබන ලද ගිවිසුමට අත්සන් තැබීමේ 10 වැනි සංවත්සරය 2013 ට යෙදී තිබුණි. කොළඹ - ෂැංහයි සබඳතාවල 10 වැනි සංවත්සරයට සමගාමීව ක්‍රියාකාරකම් රැසක් සංවිධානය කරන ලදී. හම්බන්තොට නගර සභාවේ නියෝජිත කණ්ඩායමක් ගුවැන්ෂු වෙත සංචාරයක නියැලුණු අතර, එම සංචාරය අතරතුරදී හම්බන්තොට නගර සභාව සහ ගුවැන්ෂුහි ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා වන චීන මණ්ඩලය (CCPIT) අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී.

ගරු අග්‍රාමාත්‍යදි.මු. ජයරත්න මැතිතුමා 2013 ජූනි මාසයේදී පැවති දකුණු ආසියා වෙළඳ ප්‍රදර්ශනයේ ගරු අමුත්තා ලෙස සහභාගි විය.

ගරු අග්‍රාමාත්‍යතුමා 2013 ජූනි මාසයේදී කුංමින් හි පැවති 1 වැනි චීන - දකුණු ආසියා එක්ස්පෝ හි සමාරම්භක උත්සවයට සහ 2013 අගෝස්තු මස ෂැන්ජින් හි පැවති 2 වැනි ආසියානු යෞවන ක්‍රීඩා උළෙලේ සමාප්ති උළෙලට සහභාගී විය. චීනයේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ආරාධනයකට අනුව, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා චීනයේ නිල සංචාරයක නියැලිණි.

ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍ය ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා 2013 ඔක්තෝබර් 18-29 දිනවලදී චීනයේ සංචාරයක නියැලිණි. සෞඛ්‍ය අමාත්‍ය ගරු මෛත්‍රිපාල සිරිසේන මහතා, 2013 ඔක්තෝබර් 22-23 දිනවල පැවති පශ්චාත් ජනගහණ හා සංවර්ධන ජාත්‍යන්තර සමුළුව හා සහශ්‍ර සංවර්ධන ඉලක්ක පිළිබඳ දක්ෂිණ-දක්ෂිණ සහයෝගිතාව පිළිබඳ අමාත්‍ය සමුළුවට සහභාගි විය.

චීන මහජන දේශපාලන උපදේශන සමුළුවේ (CPPCC) උප සභාපති අතිගරු ලූඕ ෆුහී මැතිතුමා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ විවෘත කිරීමේ උත්සවයට මාර්තු මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණියේය.

ෂැංහයි කාන්තා බල මණ්ඩලයේ සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් යුතු දස සාමාජික නියෝජිත කණ්ඩායමක් 2013 මාර්තු හී දී ශ්‍රී ලංකාවට පැමිණි අතර ජනාධිපති ආර්යාව, ළමා සංවර්ධන හා වනිතා කටයුතු අමාත්‍යවරයා සහ කාන්තා සංවිධානයේ නියෝජිතවරියන් බැහැ දුටුවේය.

සිචුආන් වාණිජ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා දෙරට අතර ද්විපාර්ශ්වික වෙළඳ කටයුතු වැඩිදියුණු කිරීමේ අරමුණින් 2013 අප්‍රියෙල් හී දී ශ්‍රී ලංකාවට පැමිණියේය.

2013 මැයි මස ෂැංහයි හි විදේශ කටයුතු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සු වෙයිමින් මහතාගේ සංචාරය අතරතුරදී ජාත්‍යන්තර සබඳතා හා ක්‍රමෝපායික අධ්‍යයන සඳහා ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය සහ ජාත්‍යන්තර අධ්‍යයන සඳහා ෂැංහයි ආයතනය අතර අවබෝධතා ගිවිසුම අලුත් කරන ලදී. මෙම නිලධාරියා, කොළඹ නගරාධිපති සහ කොළඹ නගර සභාවේ, ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ සහ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමු විය.

ජාත්‍යන්තර ගුවන්ෂූහි ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා වන චීන මණ්ඩලයේ (CCPIT) සභාපති ඇතුළුව නියෝජිත කණ්ඩායමක් 2013 සැප්තැම්බර් හී දී දෙරට අතර පවත්නා සුහදශීලි සබඳතා තවදුරටත් වැඩි දියුණු කර ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකාවට පැමිණියේය.

ජාත්‍යන්තර වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා චීන කවුන්සිලයේ උප සභාපති යූ පින්ග් මහතා ඉහළ පෙළේ ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමක් සමඟ 2013 නොවැම්බර්යේ පැවති පොදු රාජ්‍ය මණ්ඩලයීය ව්‍යාපාරික සංසදයට සහභාගි විය.

රාජ්‍ය ආරක්ෂක හා අධ්‍යාපන ක්ෂේත්‍ර ඇතුලු ඉහළ පෙළේ සංචාර කිහිපයක් ද 2013 වසර තුළදී සිදුවූ අතර ඒ සඳහා අමාත්‍යාංශය හා චීනයේ දූත මණ්ඩල හා දූත කාර්යාල මගින් පහසුකම් සලසන ලදී .

**ඕස්ට්‍රේලියාව**

ශ්‍රී ලංකාව හා ඕස්ට්‍රේලියාව අතර ද්විපාර්ශ්වික කටයුතු, විශේෂයෙන්, අක්‍රමවත් සංක්‍රමණික ගැටලු පිලිබඳව පවත්නා දැඩි සහයෝගීතා යාන්ත්‍රණය හේතුවෙන් තවදුරටත් ශක්තිමත් වී හා තහවුරු වී තිබේ. එල්.ටී.ටී.ඊයේ අරමුදල් රැස් කිරීමේ කටයුතු 2013 නොවැම්බර් සිට තව වසර තුනක කාලසීමාවක් සඳහා වළකාලමින්, 2002 එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්ති විධිවිධාන යටතේ ඕස්ට්‍රේලියා විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් පවත්වාගෙන යන ලැයිස්තුවට එල්.ටී.ටී.ඊය ත්‍රස්ත සංවිධානයක් ලෙස ඇතුළත් කර තිබීම ඕස්ට්‍රේලියාව විසින් නිල වශයෙන් දීර්ඝ කරන ලදී. කිරි නිෂ්පාදන අංශය වැඩිදියුණු කිරීම සඳහා ඕස්ට්‍රේලියාව ශ්‍රී ලංකාවට සහාය ලබා දී ඇත. ශ්‍රී ලංකාව කිරිපිටි මත ඇති යැපීම අඩු කර ගැනීම පිණිස, ඕස්ට්‍රේලියාවේ රොබෝ බැංකුව විසින් ලබා දුන් ණයක් යටතේ ඕස්ට්‍රේලියාවෙන් කිරි හරක් 500 දෙනෙකු ආනයනය කරන ලදී.

ආගමන කටයුතු පිළිබඳ අමාත්‍යවරයෙකුව සිටි ගරු බ්‍රෙන්ඩන් ඕ කෝනර් මහතා ශ්‍රී ලංකාවට පැමිණි අතර නීතිවිරෝධී සංක්‍රමණය හා සම්බන්ධ ගැටලු පිළිබඳව අදාල බලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්විය. මිනිසුන් නීතිවිරෝධී ලෙස ප්‍රවාහනය කිරීම මැඩපැවැත්වීම හා වැළැක්වීම සඳහා ඕස්ට්‍රේලියාව, " බේ ක්ලාස් " මුර බෝට්ටු දෙකක් ශ්‍රී ලංකාවට පරිත්‍යාග කළේය. වර්ධනය වෙමින් පවත්නා නීතිවිරෝධී ලෙස මිනිසුන් ප්‍රවාහනය කිරීම අඩුකිරීම සඳහා "මිනිසුන් නීතිවිරෝධී ලෙස ප්‍රවාහනය කිරීම සහ දේශසීමා ආරක්ෂාව, නීතිය හා නීතිය බලාත්මක කිරීම" පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමේ 2 වැනි සැසිවාරය කැඳවීම සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වන ලදී.

ඕස්ට්‍රේලියාවේ අග්‍රාමාත්‍ය ගරු ටෝනි ඇබෝට් මහතා සහ විදේශ කටයුතු අමාත්‍ය ගරු ජුලී බිෂොප් මහත්මිය, 2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීමට සහභාගිවීම සඳහා නොවැම්බර් 15-17 දිනවලදී ශ්‍රී ලංකාවට පැමිණියහ. පොදු රාජ්‍ය මණ්ඩලයීය ව්‍යාපාරික සංසදය සඳහා උපරිම සහභාගිත්වයක් ලබාගැනීමේ අරමුණින් යුතුව ඕස්ට්‍රේලියාව ප්‍රවර්ධන වැඩසටහන් පවත්වා තිබේ. වෙළඳාම, ආයෝජන, සංචාරක හා තේ ප්‍රවර්ධනය සඳහා ප්‍රදර්ශන කිහිපයක් ද ඕස්ට්‍රේලියාවේදී සංවිධානය කරන ලදී. ඕස්ට්‍රේලියාවෙන් ප්‍රධාන වෙළඳ සමාගම් 10 කට අධික ප්‍රමාණයක් පොදු රාජ්‍ය මණ්ඩලයීය ව්‍යාපාරික සංසදයට සහභාගි වූහ.

ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා හා පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාමල් රාජපක්ෂ මහතා ඇතුළුව පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායමක්, දෙරට අතර පවත්නා සබඳතා තවදුරටත් තහවුරු කරමින් ඕස්ට්‍රේලියාවේ සංචාරයක නියැලුණහ. ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා, සිඩ්නි ගිය අවස්ථාවේදී එහි රැස්ව සිටි පිරිස ඇමතුවේය. ආයෝජන මණ්ඩලය සිඩ්නිහිදී ව්‍යාපාරික සංසද ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කළේය. පොදු රාජ්‍ය මණ්ඩලයීය සංසද තොරතුරු සැසිවාරයේදී ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා, 2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීම් හා ව්‍යාපාරික සංසදයේ ප්‍රතිලාභ පිළිබඳව ඊට සහභාගි වූ පිරිස දැනුවත් කළේය. ව්‍යාපාරිකයන් 200කට අධික පිරිසක් මෙම සංසදයට සහභාගි වූහ. ඉහත සැසිය අතරතුරදී ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධන වැඩසටහනක් ද සංවිධානය කරන ලදී.

ගරු අමාත්‍යවරයා සහ නියෝජිත කණ්ඩායම මෙල්බර්න්හි කොන්සල් ජනරාල් කාර්යාලය විවෘත කිරීමේ උත්සවයට ද සහභාගි වූහ. දෙරට අතර පවත්නා සබඳතා ශක්තිමත් කිරීම සඳහා ලිබරල් හා කම්කරු පක්ෂ සමඟ අමාත්‍යවරයාට සම්බන්ධවිය හැකි රැස්වීම් සංවිධානය කරන ලදී. ඕස්ට්‍රේලියාව සමඟ පවත්නා ද්විපාර්ශ්වික, වෙළඳ, ආයෝජන හා සංචාරක කටයුතු ව්‍යාප්ත කිරීම සඳහා මෙල්බර්න්හි දී ව්‍යාපාරික සංසදයක් සංවිධානය කරන ලදී.

ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා, 2013 නොවැම්බර් 01 වැනි දින පර්ත්හි පැවති ඉන්දියානු සාගර වටද්දර රටවල සංගමයේ 13 වැනි අමාත්‍ය මණ්ඩල රැස්වීමට ද සහභාගි විය.

**නවසීලන්තය**

ශ්‍රී ලංකාව හා නවසීලන්තය අතර පවත්නා මනා සබඳතා, 2013 වසරේදී ශ්‍රී ලංකාවේ නිරතවූ නවසීලන්තයෙන් සිදුකළ ඉහළ පෙළේ සංචාරත් සමඟම තවදුරටත් ශක්තිමත් විය. 2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීමට සහභාගිවීම සඳහා නවසීලන්තයේ අග්‍රාමාත්‍යවරයා ශ්‍රී ලංකාවට පැමිණියේය. විදේශ කටයුතු අමාත්‍ය ගරු මුරේ මැක්කලි මහතා ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලුණු අතර කිරි ආහාර ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳ සාකච්ඡා පැවැත්විය. කෙටුම්පත් ගුවන් සේවා ගිවිසුම පිළිබඳව සාර්ථකව සාකච්ඡා පවත්වා 2013 වසරේදී එහි වැඩ කටයුතු අවසන් කරන ලදී.

**ජපානය**

දෙරට අතර ඉහළ පෙළේ සංචාර කීපයක් සිදුවීමත් සමඟම 2013 වසරේදී ජපානය සමඟ ද්විපාර්ශ්වික සබඳතා අඛණ්ඩව වර්ධනය විය. අතිගරු ජනාධිපතිතුමා 2013 වසරේ මාර්තු මසදී ජපානයේ නිල සංචාරයක නියැලුණු අතර එහිදී ජපානයේ අග්‍රාමාත්‍ය අතිගරු ෂින්සෝ ඇබේ මැතිතුමා සහ ජපාන රජයේ ඉහළ පෙළේ සම්භාවනීය පුද්ගලයන් රැසක් සමඟ ඵලදායී සාකච්ඡා පැවැත්විය. මෙම සංචාරයේදී 43 වැනි යෙන් ණය පැකේජයට අත්සන් තැබූ අතර අතිගරු ජනාධිපතිතුමා මෙහිදී ටෝකියෝහි ටාමා සත්වෝද්‍යානයට අලි දෙදෙනෙකු පරිත්‍යාග කළේය.

2013 වසරේදී ශ්‍රී ලංකාවේ නිරතවූ ජපාන ඉහළ පෙළේ සංචාර අතරට නියෝජ්‍ය අග්‍රාමාත්‍ය ගරු ටරෝ අසෝ මැතිතුමාගේ සහ ජ්‍යෝෂ්ඨ උප මුදල් අමාත්‍ය යුකෝ ඔබුචි මැතිණිය මැයි මසදී නිරතවූ සංචාරය, අභ්‍යන්තර කටයුතු හා සන්නිවේදන අමාත්‍ය ගරු යොෂිටකා ෂින්ඩෝ මැතිතුමා මාර්තු මස නිරතවූ සංචාරය, ටකමාඩුහි ට්සුගුකෝ රජ කුමරිය අගෝස්තු මස නිරතවූ සංචාරය සහ විදේශ කටයුතු උප අමාත්‍ය ගරු මිනොරු කියුචි මැතිතුමා සැප්තැම්බර් මසදී නිරතවූ සංචාරය අයත්වන අතර- මෙම සංචාර, ජපානය සමඟ පවත්නා මිත්‍රශීලි සබඳතා තවදුරටත් වැඩිදියුණු කිරීමෙහි උපයෝගී විය.

ජපාන රජයේ අමුත්තෙකු ලෙස ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මහතා 2013 සැප්තැම්බර් මස ජපානයේ සංචාරයක නියැලුණු අතර ජපාන රජයේ ඉහළ පෙළේ සම්භාවනීය පුද්ගලයින් සමඟ ද්විපාර්ශ්වික රැස්වීම් හා ද්විපාර්ශ්වික කටයුතුවල නියැලිණි. ගරු අමාත්‍යවරයා යමාගුචිහි නිරතවූ සංචාරයේදී අලි දෙදෙනෙකු පරිත්‍යාග කළේය. පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා, 2013 ඔක්තෝබර් 6-11 දිනවලදී ජපානයේ පැවති ''රසදිය පිළිබඳ මිනමාටා සම්මුතිය'' සඳහා සහභාගි විය.

අතිගරු යසුෂි අකාෂි මහතා, 2013 දෙසැම්බර් 8-13 දිනවලදී ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නියැලුණු අතර එහිදී, අතිගරු ජනාධිපතිතුමා සමඟ සුහද හමුවක් පැවැත්විය. විදේශ කටයුතු ගරු අමාත්‍යවරයා සහ ඉහළ පෙළේ සම්භාවනීය පුද්ගලයන් රැසක් හමුවූ එතුමා ද්විපාර්ශ්වික සබඳතාවලට අදාළව කරුණු සාකච්ඡා කළේය.

ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් කීපයක ප්‍රතිඵලයක් ලෙස, ජපානයේ සීමාසහිත බැන්සෙයි සිකියුරිටීස් පුද්ගලික සමාගම, රුපියල් මිලියන 930 ක වටිනාකමකින් යුතු පැන් ඒෂියා බැංකුවේ කොටස් 20% ක් ලබාගෙන තිබෙන අතර දෙරට අතර ආර්ථික සබඳතා ශක්තිමත් කිරීම සඳහා සංචාරක වෙළඳ ප්‍රදර්ශන, ක්‍රියාකාරකම් වෙළඳ ප්‍රදර්ශන සහ ප්‍රදර්ශන රැසකට සහභාගි විය. ජපාන විදේශ වෙළඳ සංවිධානයේ

(JETRO) සාමාජිකයන් 40කින් යුත් ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ පවතින ආයෝජන ඉඩප්‍රස්ථා පිළිබඳව සොයාබැලීම සඳහා ඔක්තෝබරයේ ශ්‍රී ලංකාවට පැමිණියේය.

**කොරියා ජනරජය**

දකුණු කොරියාව සමඟ පවත්වන සබඳතා, ආර්ථික,දේශපාලන, සමාජයීය හා සංස්කෘතික සබඳතා ආවරණය කරමින් වසර ගණනාවක් පුරා වර්ධනය වී තිබේ. ශ්‍රී ලංකාවේ හා කොරියාවේ විදේශ කටයුතු අමාත්‍යාංශ අතර ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන සෝල් නුවරදී 2013 ජූලි මසදී පවත්වන ලදී.

එවකට කොරියා ජනරජයේ අග්‍රාමාත්‍ය අතිගරු චුන්ග් හොන්ග්-වොන් මැතිතුමා, 2013 අගෝස්තු 28-30 දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලිණි.

කොරියා ජනරජ රජයෙන් සම්භාවනීය පුද්ගලයෙකු ශ්‍රී ලංකාවේ නියැලුණු ඉහළ පෙළේ සංචාරය මෙය විය. මෙම සංචාරය තුළදී, දකුණු කොරියා අග්‍රාමාත්‍යවරයා, ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපති හා ගරු අග්‍රාමාත්‍යවරයා බැහැදුටු අතර වෙනත් නිල කටයුතු කීපයක නියැලිණි.

ශ්‍රී ලංකාවේ ගරු විදේශ අමාත්‍යවරයා, 2013 ඔක්තෝබර් 16-18 දිනවලදී සෝල් නුවර පැවති සයිබර් අවකාශ සමුළුවට සමගාමීව කොරියා ජනරජයේ විදේශ කටයුතු අමාත්‍ය ගරු යුන් බයියන්ග්-සේ මහතා හමුවිය.

පාර්ලිමේන්තුවේ කථානායක ගරු චමල් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායමක් ඔක්තෝබර් 14-18 දිනවලදී කොරියා ජනරජයේ සංචාරයක නියැලිණි. මෙම සංචාරය අතරතුරදී නියෝජිත කණ්ඩායම ජනරජයේ ගරු අග්‍රාමාත්‍යවරයා සහ පාර්ලිමේන්තුවේ ගරු කථානායකවරයා සමඟ සාකච්ඡා පැවැත්වීය. සාකච්ඡා අවසානයේදී දෙරටේ අගනුවර තෙක් ගුවන් ගමන් මෙහෙයවීම් සඳහා "කොරියන් එයාර්" හා " ශ්‍රී ලන්කන් එයාර් ලයින්ස්" සඳහා ගුවන් ගමන් අයිතිවාසිකම් ලබාදෙමින් අවබෝධතා ගිවිසුමකට අත්සන් තබන ලදී.

නිෂ්පාදන හා ධීවර අංශවල නියැලෙන ශ්‍රී ලාංකිකයන්ට කොරියා ජනරජය විසින් නිකුත් කරන ලද රැකියා බලපත්‍ර ප්‍රවර්ග තවදුරටත් දීර්ඝ කරන ලදී. ඉදිකිරීම් ක්ෂේත්‍රය ඇතුළුව මෙම බලපත්‍ර ලබාදෙන ක්ෂේත්‍ර තවදුරටත් ව්‍යාප්ත කිරීමට සාකච්ඡා ආරම්භ කර තිබේ.

**තායිලන්තය**

2013 වර්ෂය, තායිලන්තය වෙත හා තායිලන්තයෙන් ශ්‍රී ලංකාව වෙත සිදුකළ ඉහළ පෙළේ සංචාර විශාල සංඛ්‍යාව හේතුවෙන් ශ්‍රී ලංකාව තායිලන්තයව අතර ද්විපාර්ශ්වික සබඳතාවල වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරයි. දෙරට අතර පවත්නා දැඩි ද්විපාර්ශ්වික සබඳතා පිළිබිඹු කරමින්, 2013 මාර්තුහිදී ශ්‍රී ලංකාව පිළිබඳ යෝජනාවලියට එරෙහිව ඡන්දය ප්‍රකාශ කරමින් ජිනීවාහි මානව හිමිකම් කවුන්සිලයේ 22 වැනි සැසිවාරයේදී ශ්‍රී ලංකාවට සහාය දැක්වීය.

මෙම වසර ශ්‍රී ලංකාවේ සියම් නිකාය ස්ථාපනය කිරීමේ 260 වැනි සංවත්සරය සනිටුහන් කළේය. මෙම 260 වැනි සංවත්සරය නිමිත්තෙන් තායිලන්තයේ මහා චාක්රි සිරින්ඩෝන් රජ කුමරිය 2013 වසරේදී ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලිණි.

2013 මැයි මාසයේදී එවකට තායිලන්ත අග්‍රාමාත්‍ය අතිගරු යින්ග්ලක් ෂිනවත්‍රා මැතිණිය ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නියැලුණු අතර එමඟින් දෙරට අතර පවත්නා සබඳතා තවදුරටත් වැඩිදියුණු විය. අග්‍රාමාත්‍යවරියගේ මෙම සංචාරයේදී සංචාරක, තාක්ෂණික හා වෙළඳ යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුම්වලට අත්සන් තැබීය.

තායිලන්තයේ ගරු නියෝජ්‍ය අග්‍රාමාත්‍යවරයා සහ විදේශ කටයුතු අමාත්‍යවරයා 2013 මැයි මස පැවති ඒකාබද්ධ කොමිෂන් සභාවේ 3 වැනි සැසිවාරයට සහභාගීවීම සඳහා වන තායිලන්ත නියෝජිත

කණ්ඩායම් ප්‍රධානත්වය දරමින් ශ්‍රී ලංකාවට පැමිණියේය. දෙරට අතර පවත්නා මිතුදම් තවදුරටත් ශක්තිමත් කරගැනීම කෙරෙහි සුවිශේෂී බලපෑමක් මෙම ඉහළ පෙළේ සංචාර මඟින් එල්ල විය.

සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු ටී.බී.ඒකනායක මහතා, 2013 දෙසැම්බර් මස අයුත්තයාහි උපාලි මහ තෙරෝ කෞතුකාගාරය විවෘත කිරීමේ උත්සවයට සහභාගි විය.

සියම් ස්ථාපනය කිරීමේ 260 වැනි සංවත්සරය සනිටුහන් කරමින් 2013 නොවැම්බර් 23 හා 24 දිනවලදී තායිලන්තයේ " නැෂනල් ඩිස්කවරි මියුසියම්" ආයතනය, සංස්කෘතික හා ආගමික අංග සංවිධානය කළේය. දෙරට අතර බෞද්ධ හා සංස්කෘතික සබඳතා පිළිබිඹු කරමින් ඡායාරූප ප්‍රදර්ශනයක්ද මෙම අංග අතර විය. දෙරට අතර වාණිජ හා ව්‍යාපාරික සහයෝගිතාව සඳහා පහසුකම් සැලසීම සඳහා තායිලන්තයේදී සංචාරක හා වෙළෙඳ ප්‍රවර්ධන වැඩසටහන් කීපයක් සංවිධානය කර තිබේ.

**සිංගප්පූරුව**

2013 වසරේදී ශ්‍රී ලංකාව හා සිංගප්පූරුව අතර ද්විපාර්ශ්වික සබඳතා ආර්ථික හා රාජ්‍ය ආරක්ෂක යන අංශ දෙක සම්බන්ධයෙන්ම වැඩි දියුණු කොට තිබේ. දෙරට අතර පවත්නා දැඩි ද්විපාර්ශ්වික සබඳතා පිළිබිඹු කරමින් කොළඹ පැවති 2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු නිලධාරීන්ගේ රැස්වීම, සිංගප්පූරුවේ අග්‍රාමාත්‍ය ලී සෙයින් ලූන් මහතාසහ විදේශ අමාත්‍ය කේ.ෂන්මුගම් මහතා විසින් නියෝජනය කරන ලදී.

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් ඉහළ පෙළේ නියෝජිත කණ්ඩායමක් 2013 මැයි මස සිංගප්පූරුවේ පැනති ෂැන්ග්‍රිලා සංවාදයට සහභාගි විය. මීට සමගාමීව, මෙම සංචාරය අතරතුරදී මැලේසියාව, ජපානය, ඉන්දුනීසියාව හා සංගප්පූරුව යන රටවල ඉබහළ පෙළේ සම්භාවනීය පුද්ගලයන් සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා කීපයක් පවත්වන ලදී.

කම්කරු ක්ෂේත්‍රය හා සම්බන්ධයෙන් දෙරජයන් අතර සබඳතා ශක්තිමත් කිරීමේ හා ශ්‍රමිකයන් නීතිවිරෝධී ආකාරයෙන් බඳවා ගැනීම වැළැක්වීමේ අරමුණෙන් යුතුව ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ හා සිංගප්පූරු මිනිස් බල අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරිහු සහයෝගිතාව සඳහා අඛණ්ඩව කටයුතු කළහ. රැකියාවේ නියුක්තව සිටින අතරතුර හෝ මාර්ග හදිසි අනතුරුවලින් තුවාල ලබා තිබූ ශ්‍රී ලාංකික සේවකයන්ට නෛතික සහාය ලබාදීම පිළිබඳව ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ නිලධාරිහු සිංගප්පූරුවේ නීතිඥයන් සමඟ සාකච්ඡා පැවැත්වූහ.

සිංගප්පූරු ව්‍යාපාර බලමණ්ඩලයේ සහයෝගය ඇතිව සිංගප්පූරුවේදී ආයෝජන ප්‍රවර්ධන සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. තේ, මැණික් හා ස්වර්ණාභරණ ප්‍රවර්ධනය කිරීම් සඳහා වෙළෙඳ සල්පිල් හා ප්‍රදර්ශන ගණනාවක් සිංගප්පූරුවේදී පැවැත්විණ.

**පිලිපීනය**

ශ්‍රී ලංකාව හා පිලිපීනය අතර මනා සම්බන්ධතා නොකඩවා පවත්වාගෙන යනු ලැබේ. දෙරට අතර පවත්වාගෙන යන ශක්තිමත් ද්විපාර්ශ්වික සම්බන්ධතා පිළිබිඹු කරමින් 2013 මාර්තු මාසයේදී, ජිනීවාහි මානව හිමිකම් කොමිසමේ 22 වන සැසිවාරයේදී ශ්‍රී ලංකාවට එරෙහිව ඉදිරිපත් කරන ලද යෝජනාවට විරුද්ධව පිලිපීනය ඡන්දය දුන්නාය. ආරක්ෂාව, සුරක්ෂිතභාවය යන ක්ෂේත්‍රවලදී ද ශ්‍රී ලංකාව යහපත් සම්බන්ධතා පවත්වාගෙන යයි. පිලිපීන ආරක්ෂක විද්‍යාපීඨ මගින් ශ්‍රී ලංකා යුද හමුදා නිලධාරීන් දෙදෙනෙකුට පුහුණු අවස්ථා සලසා දී ඇත.

දෙරට අතර පවතින ශක්තිමත් ද්විපාර්ශ්වික සම්බන්ධතා සංකේතමත් කරමින් බෝ ෆා සුළි සුළඟින් පීඩාවට පත්වූවන්ට නිවාස ඉදිකර ගැනීම සඳහා ශ්‍රී ලංකා රජයෙන් ඇමෙරිකන් ඩොලර් 25,000 ක සංකේතවත් පරිත්‍යාගයක් ලබාදෙන ලදී. 2013 නොවැම්බර් 08 වන දින පිලිපීනයේ ඇතිවූ විනාශකාරී සුළි සුළඟින් පීඩාවට පත් ජනතාවට පිහිටවීම සඳහා, ශ්‍රී ලංකා ජනතාව පිලිපීන ජනතාව කෙරෙහි

දක්වන මානුෂික හිතවාදීකම පිළිබඳ ඉඟියක් දක්වමින්, වෛද්‍යවරුන් 11 දෙනෙකු හා‍ෙහද නිලධාරීන් 11 දෙනෙකුගෙන් සමන්විත වෛද්‍ය සහන කණ්ඩායමක් යවන ලදී.

දෙරට අතර පවතින ද්විපාර්ශ්වික සම්බන්ධතා තවදුරටත් තහවුරු කිරීම සඳහා විදේශ කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා 2013 ජූලි මාසයේදී පිලිපීනයේ නිල සංචාරයක නිරත විය. පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීමේ ව්‍යාපාරික සංසදයට සහභාගිවීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණීමට පිලිපීනයේ ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරික සමාගම් පෙළඹවීමේ ක්‍රමෝපාක්‍රම සොයාබැලීම සඳහා මෙම සංචාරයේදී, ගරු අමාත්‍යතුමා පිලිපීනයේ වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ සභාපතිතුමන් හමුවිය. මෙබු හා ඩවාවෝ නගරවල හා පිලිපීනයේ නිදහස් වෙළඳ කලාපවල ව්‍යාපාරික ප්‍රජාව සඳහා ආයෝජන අවස්ථා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

දෙරට අතර සංස්කෘතික බැඳීම් තවදුරටත් ශක්තිමත් කිරීම අරභයා උගතුන් හා සංස්කෘතික කණ්ඩායම් හුවමාරු කරගැනීමටත්, මැනිලාවේ පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය හා ශ්‍රී ලංකාවේ පශ්චාත් උපාධි ආයතනය හා ශ්‍රී ලංකාවේ පශ්චාත් උපාධි ආයතනයත් අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමේ හැකියාව ගැන සොයාබැලීමටත් එකඟ විය.

**වියට්නාමය**

ඉහළ මට්ටමේ සංචාර හේතුකොට ගෙන ශ්‍රී ලංකාව හා වියට්නාමය අතර ද්විපාර්ශ්වික සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් විය. වියට්නාමයේ ජාතික රාජ්‍ය සභාවේ නියෝජ්‍ය ජනාධිපතිනි අතිගරු න්ගුයෙන් ති. කිම් න්ගන් ආර්යාව සහ කොමියුනිස්ට් පක්ෂයේ විදේශ සම්බන්ධතා පිළිබඳ කොමසාරිස් න්ගුයෙන් හුවායි ටැන්ග් මහතා 2013 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකාවේ සංචාරය කළහ.

වියට්නාමයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍ය සහ විදේශ කටයුතු අමාත්‍ය ගරු ෆාම් බින්හ් මින්ග් මහතා 2013 නොවැම්බර් 23 සිට 26 දක්වා දිනවල ශ්‍රී ලංකාවේ සංචාරය කළ අතර හෝ චි මින්ග් ප්‍රතිමාව නිරාවරණය කිරීමේ උත්සවයට සහභාගි විය. ෆාම් බින්ග් මින්ග් මහතා අතිගරු ජනාධිපතිතුමා සමඟ සුහද හමුවත් පැවැත්වූ අතර රජයේ අමාත්‍යවරුන් බොහෝ දෙනෙකු සමග ප්‍රයෝජනවත් සාකච්ඡා පැවැත්වීය.

දෙරට අතර පවත්වාගෙන ආ විශිෂ්ට සම්බන්ධතාවල ප්‍රතිපලය වූයේ ජිනීවාහි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සල 22 වන සැසියේදී ශ්‍රී ලංකාවට එරෙහිව ඉදිරිපත් කරන ලද යෝජනාවට වියට්නාමය විරුද්ධවීමයි.

වියට්නාමයේ ගරු අධිකරණ අමාත්‍යතුමා අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකාවේ කළ සංචාරය අතරවාරයේදී අමාත්‍යවරුන් දෙදෙන අතර "දේශීය නෛතික පද්ධතිය සංවර්ධනය කිරීම හා තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා නෛතික සහාය සහ අන්‍යොන්‍යාධාර සැලසීම" පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී.

දෙරට අතර ජ්‍යෙෂ්ඨ නිලධාරි මට්ටමේ ද්විපාර්ශ්වික දේශපාලන උපදේශනවල දෙවන වටය මැයි මාසයේදී හැනෝයිහිදී පවත්වන ලදී. මෙම සැසි අතරවාරයේදී ද්විපාර්ශ්වික පාර්ශ්වකාරීත්වය හා සහයෝගය ලබාගත හැකි නව ක්ෂේත්‍ර හඳුනාගැනීම ගැන සැලකිළිමත්ව, අන්‍යොන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන ජාත්‍යන්තර හා කලාපීය ප්‍රශ්න පිළිබ අදහස් මෙම සැසිවලදී දෙපාර්ශ්වය විසින් හුවමාරු කරගන්නා ලදී.

2013-2015 කාලය තුළ ශ්‍රී ලංකාවේ ජලජීවි සංවර්ධනය සඳහා සහයෝගය ලබාගැනීම පිළිබඳ අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා ධීවර හා ජලජීවි සංවර්ධන සහයෝගිතා ව්‍යාපෘතියක් මැයි මාසයේදී ජාතික ජලජීවී සංවර්ධන අධිකාරියේදී ආරම්භ කරන ලදී.

වියට්නාම විශේෂඥයෝ හා ගිනිකොන දිග,උතුරු,නැගෙනහිර හා දකුණු පළාත්වල මුහුදු කැකිරි අභිජනන මධ්‍යස්ථානයක්, මුහුදු කැකිරි වගාකිරීමේ මධ්‍යස්ථානයක්, පොකිරිස්සන් තර කිරීමේ

මධ්‍යස්ථානයක් සඳහා සුදුසු ප්‍රදේශ පරීක්ෂා කර මෙම නියමු ව්‍යාපෘති හතර සඳහා ප්‍රදේශ නිශ්චය කළහ.

දෙරටේ අධ්‍යාපන අමාත්‍යාංශ අතර අත්සන් තබන ලද අධ්‍යාපන සහයෝගිතාව පිළිබඳ ගිවිසුම යටතේ ශ්‍රී ලාංකික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වියට්නාමයේ අධ්‍යයන කටයුතු සිදුකරගෙන යාම සඳහා ශිෂ්‍යත්ව අටක් වියට්නාම රජය ප්‍රදානය කළේය.

**මැලේසියාව**

ශ්‍රී ලංකාව මැලේසියාව සමඟ පවත්වන ආර්ථික, දේශපාලන, සමාජයීය හා සංස්කෘතික සබඳතා ඇතුළුව සහයෝගිතා ක්ෂේත්‍ර පුළුල් පරාසයක් ආවරණය කරමින් වසර ගණනාවක් පුරා වර්ධනය වී ඇත. කොළඹ පැවති 2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීමට සහභාගිවීම සඳහා අග්‍රාමාත්‍ය නජීබ් රසාක් මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය දෙරට අතර පවත්නා දැඩි සබඳතා පිළිබිඹු කරන්නක් වෙයි. මැලේසියාව, ඇ.ඩො. බිලියන 1.4කට අධික ආයෝජන ප්‍රමාණයක් අඛණ්ඩවම ශ්‍රී ලංකාවේ ආයෝජනය කරමින් විශාලතම ආයෝජකයා බවට පත්වී තිබේ. මින් 80% කට වැඩි ආයෝජන ප්‍රමාණයක් සිදුකර ඇත්තේ විදුලි සංදේශ අංශය සම්බන්ධයෙනි.

2013 ඔක්තෝබරයේ ක්වාලා ලාම්පූර් හිදී පැවති ශ්‍රී ලංකාව හා මැලේසියාව අතර 2 වැනි ඒකාබද්ධ කොමිෂන් සභාවට සහභාගි වූ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ ප්‍රධානත්වය දරන ලද්දේ ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා විසිනි. ප්‍රධාන ද්විපාර්ශ්වික කරුණු හා අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන වෙනත් කරුණු විස්තරාත්මකව සාකච්ඡා කිරීමට මෙම අවස්ථාවේදී දෙපාර්ශ්වයටම ඉඩ සැලසිණි. මෙම සංචාරය අතරතුරදී, ගරු අමාත්‍යවරයා මැලේසියාවේ ගරු අග්‍රාමාත්‍යවරයා සමඟ සුහද හමුවක් පැවැත්වූ අතර ගරු වෙළෙඳ අමාත්‍යවරයා ද හමුවිය.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ සදහයෝගිතාව සඳහා ද පහසුකම් සලසා තිබේ. මැලේසියා විශ්ව විද්‍යාලය හා ජාතික අධ්‍යාපන ආයතනය අතර ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා විශේෂඥයින් හුවමාරු කිරීම වැඩිදියුණු කිරීම සඳහා පෙබරවාරි මාසයේදී එම ආයතන දෙක අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තබන ලදී. මැලේසියානු රජය, මැලේසියානු තාක්ෂණික සහයෝගිතා වැඩසටහන (MTCP) හා මැලේසියානු රාජ්‍ය ආරක්ෂක සහයෝගිතා වැඩසටහන(MDCP) හරහා පුහුණු වැඩසටහන් ප්‍රදානය කරයි.

ජනාධිපති ලේකම්, ලලිත් වීරතුංග මහතා සැප්තැම්බර් මාසයේදී මැලේසියවේ සංචාරයක නියැලුණු අතර එහිදී මැලේසියානු රජයේ ඉහළ පෙළේ සම්භාවනීය පුද්ගලයන් සමඟ හමුවීම් කීපයක් සංවිධානය කරන ලදී. මෙම සංචාරයේදී, රාජ්‍ය අංශයේ ධාරිතාව වැඩිදියුණු කිරීම, දෙරට අතර විශේෂඥයින් හුවමාරු කිරීම, හුරුපුරුදුවීමේ සංචාර, ඉ- අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහයෝගිතාව, මැලේසියාවේ රාජ්‍ය පරිපාලන ආයතනය(INTAM) සහ ශ්‍රී ලංකාවේ සංවර්ධන පරිපාලන ආයතනය(SLIDA) අතර සහයෝගිතාව පිළිබඳ දෙරටේ අදහස් හුවමාරු කරගන්නා ලදී. තවද කාර්ය සාධන කළමනාකරණය සහ බෙදාහැරීමේ ඒකකය (P&MAMDU) සමඟ සාකච්ඡා ද පැවැත්වුහ. ජූනි මාසයේදී මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා මැලේසියාවේ නිරත වූ සංචාරය සඳහා ද මෙම අමාත්‍යාංශය පහසුකම් සැලසූ අතර මෙහිදී මහබැංකු අධිපතිවරයා අග්නිදිග ආසියානු මහබැංකුව මගින් සංවිධානය කරන ලද "අවිනිශ්චිත අවස්ථාවලදී වෙනස්වීම පිළිබඳ අවබෝධයක් ලබාදීම " මැයෙන් පැවති සිම්පෝසියමක් ද ඇමතීය.

සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා මාධ්‍ය හුරුපුරුදු වීමේ ශ්‍රී ලංකා සංචාර සංවිධානය කර තිබේ. තවද ශ්‍රී ලංකාවෙන් ආයුර්වේද නිෂ්පාදන, මැණික්, ස්වර්ණාභරණ හා නිමි ඇඳුම් අපනයනය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙළඳ පොළවල් හා ප්‍රදර්ශන කීපයක් ද පවත්වා තිබේ. දෙරට අතර ආර්ථික සබඳතා තවදුරටත් සවිබල ගැන්වීමේ අරමුණින් වසර 06 කට පසුව මැලේසියා-ශ්‍රී ලංකා ව්‍යාපාරික කවුන්සලය යළිත් පණගන්වා තිබේ.

ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු ෆයිසර් මුස්තාෆා මහතා 2013 දෙසැම්බර් 2-3 දිනවලදී පැවති 4 වැනි එක්සත් මැලේ ජාතික සංවිධානයේ (UNMO) 2013 ජාත්‍යන්තර සංසදයට සහභාගි විය. මෙය සංවිධානය කරන ලද්දේ මැලේසියවේ පාලක පක්ෂය වන එක්සත් මැලේ ජාතික සංවිධානය විසිනි.

**මියන්මාරය**

බෞද්ධ -සංස්කෘතික සම්බන්ධතා ශ්‍රී ලංකාව හා මියන්මාරය අතර පවතින සම්බන්ධතාවල ශක්තිමත් පදනමක් බවට පත්වී තිබේ. මෙම බැඳීම් තවදුරටත් ශක්තිමත් කරමින් මියන්මාරයේ ජනාධිපතිතුමන් විසින් 2014 මාර්තු මාසයේදී පූජ්‍ය මහාචාර්ය කඹුරුගමුවේ වජිර නායක හිමිපාණන්ට අග්ග මහා පණ්ඩිත නාමය ප්‍රදානය කරන ලදී. මියන්මාර් රජය 2013 මැයි මාසයේදී බෙල්ලන්විල රජ මහා විහාරයට ඇතෙකු පරිත්‍යාග කළේය. මියන්මාරයේ ශිෂ්‍යයින්ට ශිෂ්‍යත්ව තුනක් පිරිනැමීමට ශ්‍රී ලංකා රජය තීරණය කර ඇත.
ආර්ථික අවස්ථා වැඩි කිරීමෙන් ද්විපාර්ශ්වික සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් වී ඇත. බැංකු අංශයේදී මියන්මාරයේ බැංකු සේවා ආරම්භ කළ හැකි දැයි කොමර්ෂල් බැංකුව හා සම්පත් බැංකුව විමසීම් කර ඇති අතර දෙරට අතර වාණිජ කටයුතු දියුණු කිරීම සඳහා ශ්‍රී ලාංකික ව්‍යාපාරික නියෝජිත පිරිස් මියන්මාරයට ගොස් ඇත. දෙරට අතර ව්‍යාපාරික සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කිරීම අරභයා සිය නියෝජිත කාර්යාලයක් මියන්මාරයේ විවෘත කිරීම සඳහා ලංකා වාණිජ මණ්ඩලය විසින් අයදුම්පතක් ඉදිරිපත් කර ඇත.

**ඉන්දුනීසියාව**

ශ්‍රී ලංකාවත් ඉන්දුනීසියාවත් අතර රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා ආරම්භ කොට හැට වසරක් සම්පූර්ණ වීමේ සංවත්සරික උත්සවය 2013 දී පවත්වන ලද අතර මෙම සම්බන්ධතා වර්ධනය වෙමින් පවතී. දෙරට අතර පවතින ශක්තිමත් සම්බන්ධතා සනිටුහන් කරමින් ඉන්දුනීසියාව 2013 මාර්තු මාසයේ පැවති මානව හිමිකම් කවුන්සලයේ 22 වන සැසිවාරයේදී ශ්‍රී ලංකාවට පක්ෂව අදහස් දැක්වූ අතර එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේදී ශ්‍රී ලංකාවට එරෙහිව ඉදිරිපත් කරන ලද යෝජනාවට විරුද්ධව ඡන්දය පාවිච්චි කළාය.

ඉන්දුනීසියාවේ පවත්වන ලද VI(හයවන) බාලි ප්‍රජාතාන්ත්‍රික සංසදය හා අක්‍රමවත් ලෙස මුහුදු ගමන්වල යෙදෙන පුද්ගලයන් ආරක්ෂා කිරීම පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළු ඇතුළු ඉහළ මට්ටමේ ඉසව් ගණනාවකට ශ්‍රී ලංකාව සහභාගිවූවාය. බලහත්කාරයේන මිනිසුන් ප්‍රවාහනය කිරීම මැඩ පැවැත්වීම පිළිබඳ කලාපීය යාන්ත්‍රණ මගින් ශ්‍රී ලංකාව හා ඉන්දුනීසියාව එකිනෙක රටට සහයෝගය දක්වා ඇත. 2013 අප්‍රේල් මාසයේදී ඉන්දුනීසියාවේ පවත්වන ලද බලහත්කාරයෙන් මිනිසුන් ප්‍රවාහනය කිරීම, නීතිවිරෝධී මිනිස් ජාවාරම හා අදාළ දේශ සීමා ඉක්මවා යන අපරාධ පිළිබඳ බස්වන බාලි කලාපීය අමාත්‍ය සම්මේලනයට ගරු අධිකරණ අමාත්‍ය රවුෆ් හකීම් මහතා සහභාගි විය. 2014 දෙසැම්බර් 2 සිට 6 දක්වා දිනවල බාලි නගරයේදී පවයත්වන ලද ලෝක් වෙළඳ සංවිධානයේ 9 වන අමාත්‍ය රැස්වීමට කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් මහතා සහභාගි විය. 2014 ඔක්තෝබර් මස 17 සිට 24 දක්වා දිනවල ඉන්දුනීසියාවේ ජකාර්තා හි පවත්වන ලද “ ගම්මිරිස් වගාව හා කුඩා කර්මාන්ත පිළිබඳ සංවර්ධනය පිළිබඳ සම්මේලනයට” සුළු අපනයන භෝග ප්‍රවර්ධනය පිළිබඳ ගරු අමාත්‍ය රෙජිනෝල්ඩ් කුරේ මහතාගේ නායකත්වයෙන් යුත් නියෝජිත පිරිසක් සහභාගි විය.

ශ්‍රී ලංකාවේ සිටින ඉන්දුනීසියා ජනරජයේ තානාපති හරිමාවන් සුයිතිනෝ උතුමාණෝ සහ ඉන්දුනීසියාවේ නාවික අභ්‍යාස ආයතනයේ පාල රියාර් අද්මිරාල් අරි අත්මජා මහතා 2014 නොවැම්බර් මාසයේදී පැවති ගාලු සංසදයේදී ඉන්දුනීසියාව නියෝජනය කළේය.

# මැද පෙරදිග අංශය

## මැද පෙරදිග අංශය

| | |
|---|---|
| ආවරණය කරන රටවල් | -රටවල් 14<br>බහරේන්, ඉරානය, ඉරාකය, ඊශ්‍රායලය, ජෝර්දානය, කුවේට්, ලෙබනනය, ඕමානය, පලස්තීනය, කටාර්, සෞදි අරාබිය, සිරියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍ය සහ යේමනය |
| නේවාසික දූත මණ්ඩල සංඛ්‍යාව | -රටවල් 14<br>බහරේන්, ඉරානය, ඉරාකය, ඊශ්‍රායලය, ජෝර්දානය, කුවේට්, ලෙබනනය, ඕමානය, පලස්තීනය, කටාර්, සෞදි අරාබිය(රියාද් සහ ජෙඩා) සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය, (අබුඩාබි සහ ඩුබායි) |
| සමගාමීව අක්ත ගැන්වීම් | -රටවල් 02<br>සිරියාව, බීරුට් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය<br>යේමනය - මස්කට් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය |

මෙම අමාත්‍යාංශයේ මැද පෙරදිග කලාපය සඳහා දේශපාලන කටයුතු අංශය මෙම කලාපයේ රටවල් සමඟ ශ්‍රී ලංකාව පවත්වන ද්විපාර්ශ්වික සබඳතාවලට අදාළ කටයුතු ආවරණය කරයි. මැද පෙරදිග කලාපයට අයත් රටවල පවතින, ශ්‍රී ලංකාවට අදාළ වන දේශපාලන හා වෙනත් ප්‍රවණතා පිළිබඳව, මෙම අංශය අඛණ්ඩව නිරීක්ෂණය කර අදාළ බලධාරීන් වෙත වාර්තා කරයි. මෙම අංශය, ජාත්‍යන්තර සමුළුවලට සමගාමීව අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා සහ වෙනත් ගරු අමාත්‍යවරු, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු සිදු කරන ද්විපාර්ශ්වික සංචාර හා රැස්වීම් සඳහා අදාළ වන සියලු ලිපි ලේඛන පිළියෙළ කිරීම ඇතුළුව අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කර පහසුකම් සලසයි.

### බහරේන් රාජධානිය

බහරේන් සමඟ පවත්නා ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණෙන් ශ්‍රී ලංකාව බහරේන් හි නව නේවාසික තානාපති කාර්යාලය 2013 මැයි මසදී උත්සවාකාරයෙන් විවෘත කළේය. විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු නියොමාල් පෙරේරා මහතාගේ සහ බහරේන් හි විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු ඝනීම් බින් ෆාඩ්හුල් අල් බුආයිනයින් මහතාගේ අනුග්‍රහයෙන් මෙය විවෘත කරන ලදී.

ගරු අග්‍රාමාත්‍යවරයා විසින් උතුරු පළාතේ අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයන් සඳහා නිවාස ව්‍යාපෘතියක් ඉදි කිරීමට සහාය ලබා දෙන ලෙස බහරේන් රාජ්‍යයෙන් කරන ලද ඉල්ලීමකට අනුව, බහරේන් අග්‍රාමාත්‍යවරයා නිවාස 200ක් ඉදි කිරීම සඳහා අරමුදල් ලබා දීමට එකඟතාවය පළ කළේය.

මෙම වසරේ, තානාපති කාර්යාලය මෙම අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් යුතුව, නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සභාපති වන ගරු කලීෆා බින් අහ්මඩ් අල් ධරානි මහතාගේ නායකත්වයෙන් යුතු බහරේන් පාර්ලිමේන්තු නියෝජිත පිරිසකගේ ශ්‍රී ලංකා සංචාරය සංවිධානය කළේය. බහරේන් පාර්ලිමේන්තු නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූ ප්‍රථම අවස්ථාව මෙය විය.

### ඉරාන ඉස්ලාමීය ජනරජය

අතිගරු ජනාධිපතිතුමා, ඉරාන ඉස්ලාමීය ජනරජයේ අභිනවයෙන් පත්වූ ජනාධිපතිතුමා නිව් යෝර්ක් හි දී හමු විය. ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා සහ ගරු ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා අතිගරු රොහානි මැතිතුමාගේ පදවි ප්‍රාප්ති උළෙලට සහභාගීවීම සඳහා මෙම වසරේ අගෝස්තු මාසයේදී ටෙහෙරානය බලා පිටත් විය. මෙම ගරු අමාත්‍යවරු ටෙහෙරාන විදේශ කටයුතු අමාත්‍යවරයා සහ ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යවරයා සමඟ ද්විපාර්ශ්වික රැස්වීම් පැවැත්වූහ.ගරු සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා, 2013 පෙබරවාරි මස ටෙහෙරානයේ පැවති ආසියාවේ සංස්කෘතිය සහ ගෝලීයකරණය පිළිබඳ කලාපීය සමුළුව සඳහා සහභාගී විය.

ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුතු නියෝජිත කණ්ඩායමක්, 2013 මැයි මස ටෙහෙරානයේ පැවති පළමු ආසියානු පාර්ලිමේන්තු විධායක රැස්වීමට සහභාගී වීම සඳහා ඉරානය බලා පිටත්විය.

ඉරාන ඉස්ලාමීය ජනරජයේ ඛනිජ තෙල් පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය අතිගරු හොස්සෙඉන් ෆාරාහි මහතා, ද්විපාර්ශ්වික ආර්ථික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා සහ ඉරානයෙන් බොර තෙල් මිලදී ගැනීම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා මෙම වසරේ දෙවතාවක් ශ්‍රී ලංකාවට පැමිණියේය. ඉරාන ඉස්ලාමීය ජනරජයේ අධ්‍යාත්මික නායකතුමාගේ උපදේශක සහ ඉස්ලාමීය චින්තනයට ඉරානය දක්වන සමීපභාවය පිළිබඳ ලෝක සංසදයේ මහ ලේකම් ගරු අයටොල්ලා මුහම්මද් අලි ටජ්කිරි මහතා ශ්‍රී ලංකාවට පැමිණි අතර ආගමික අධ්‍යයන සහ සංස්කෘතික සහයෝගීතාව පදනම් කර ගනිමින් දෙරට අතර සබඳතා ශක්තිමත් කිරීමේ අරමුණෙන් ගරු අග්‍රාමාත්‍යතුමා සමඟ සාකච්ඡා පැවැත්විය.

## ඉරාක ජනරජය

ඉරාකය සඳහා ශ්‍රී ලංකා තානාපතිවරයා සිය රාජකාරි භාර ගැනීමත් සමඟම මෙම වසරේ ඉරාකය සමඟ ශ්‍රී ලංකාව පවත්වන සබඳතාවල වැඩි වර්ධනයක් පෙන්නුම් කරයි. සැප්තැම්බර්යේ ඉරාක කම්කරු අමාත්‍යවරයාගේ සංචාරය අතරතුර දී දෙරට අතර ශ්‍රමිකයන් සංක්‍රමණය පිළිබඳ අවබෝධතා ගිවිසුමකට ශ්‍රී ලංකාව හා ඉරාකය අත්සන් තැබීය.

ශ්‍රී ලංකාව හා ඉරාකය අතර කෘෂිකර්මය, අධිකරණය, සංචාරක කටයුතු, අධ්‍යාපන, සංස්කෘතිය, ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලනය වැනි ක්ෂේත්‍ර ගණනාවක් හා සම්බන්ධ සහයෝගීතාව පිළිබඳ කෙටුම්පත් ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් පිළිබඳව මූලික කටයුතු ආරම්භ කොට තිබේ.

කර්මාන්ත හා වාණිජ අමාත්‍ය ගරු රිෂාඩ් බදියුදීන් මහතා 2013 පෙබරවාරි හි දී ඉරාකයේ සංචාරයක නියැලුණ අතර ඉරාක කර්මාන්ත හා වාණිජ අමාත්‍යවරයා සමඟ සාකච්ඡා පැවැත්විය. බැග්ඩෑඩ් හි දී, ආර්ථික හා වෙළඳ සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ කමිටුවේ 8 වැනි සැසිවාරය පැවැත්වීමට අවශ්‍ය කටයුතු ඉරාක හා ශ්‍රී ලාංකික බලධාරීන් විසින් සිදු කරනු ලබමින් සිටියි.

## ඊශ්‍රායල රාජ්‍යය

2013 පෙබරවාරි හි දී, ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා ඊශ්‍රායලයේ සංචාරයක නිරත විය. මෙම සංචාරය අතරතුරදී, ඊශ්‍රායල ජනාධිපති ෂිමොන් පෙරෙස් මැතිතුමා සහ අග්‍රාමාත්‍ය බෙන්ජමින් නෙටන්යාහු මහතා බැහැ දුටු අතර එහිදී සාකච්ඡා පැවැත්විය. සමාලෝචනයට බඳුන්වන කාලසීමාව තුළදී ඊශ්‍රායල ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමක් කොළඹ සංචාරයක නියැළිණි.

## කුවේට් රාජ්‍යය

අතිගරු ජනාධිපතිතුමා සහ කුවේට් රාජ්‍යයේ අග්‍රාමාත්‍යතුමා අතර හමුවක් මෙම වසරේ සැප්තැම්බරයේදී නිව් යෝර්ක් හි දී පවත්වන ලදී. 2013 මාර්තු හි දී ජිනීවා හි දී පැවති මානව හිමිකම් කවුන්සිලයේ 22 වැනි සැසිවාරය ඇතුළුව ජාත්‍යන්තර සංසදවලදී කුවේට් රාජ්‍ය ශ්‍රී ලංකාවට සහාය ලබා දෙමින් සිටියි.

2013 මාර්තු හි දී පැවති ආසියානු සහයෝගීතා සංවාදයේ මහ ලේකම් කාර්යාලයේ ව්‍යුහාත්මක යාන්ත්‍රණය සඳහා යෝජනාව සාකච්ඡා කිරීම සඳහා වන ආසියා සහයෝගීතා සංවාදයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීමට විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සහභාගී විය.

## ලෙබනන් ජනරජය

ගරු විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභ සාධන අමාත්‍යවරයාගේ සංචාරය අතරතුරදී ලෙබනනයේ පුහුණු ශ්‍රමික අවශ්‍යතාවලට සරිලන ආකාරයට ශ්‍රී ලාංකිකයන් ප්‍රවර්ධනය කිරීමේ ක්‍රමෝපක්‍රම පිළිබඳව සහ මිනිස් ශ්‍රමය හා සම්බන්ධ අවබෝධතා ගිවිසුමකට එළඹීම පිළිබඳව ලෙබනනයේ කම්කරු අමාත්‍යවරයා සමඟ මූලික සාකච්ඡා පවත්වා තිබේ.

## ඕමාන සුල්තාන රාජ්‍යය

ශ්‍රී ලංකාව හා ඕමාන සුල්තාන රාජ්‍යය අතර ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් කර ගැනීමේ මූලික පියවරක් ලෙස, 2013 ජූනි 16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සියලු සේවා ලබා දෙන ඕමාන තානාපති කාර්යාලක් කොළඹ ස්ථාපනය කරන ලදී.

2013 අගෝස්තු මසදී, ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුතු හා දේශීය බැංකු පහක ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇතුළත් වූ නියෝජිත කණ්ඩායමක් ඕමාන සුල්තාන් රජයේ සංචාරයක නිරත වූ අතර ඕමානයේ මහ බැංකුවේ, මස්කට් බැංකුවේ, සොහාර් බැංකුවේ, ඕමාන නැෂනල් බැංකුවේ සහ දෝහා බැංකුවේ නිලධාරීන් ඇතුළත් ආයෝජකයන්ගේ පසුවිපරම් රැස්වීමක් පවත්වන ලදී.

## පලස්තීන රාජ්‍යය

ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා, 2013 පෙබරවාරි හි දී පලස්තීනයේ සංචාරයක නියැළිණි. මෙම සංචාරය අතරතුරදී, ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා, පලස්තීන ජනාධිපති මොහමඩ් අබ්බාස් මහතා සහ අග්‍රාමාත්‍ය ආචාර්ය සලාම් ෆායේඩ් මහතා බැහැ දුටුවේය. ගරු අමාත්‍යතුමා පලස්තීන විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය රියාඩ් අල් මල්කි මහතා හමුවී ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීය. 2013 ජූනි

හි දී බයිට් - අල් - මුකඩ්ඩිස් හි පැවති ජාත්‍යන්තර ඉස්ලාමීය සමුළුවට සහභාගී වීම සඳහා නාගරික කටයුතු සඳහා ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා ද පලස්තීනය බලා පිටත් විය.

## කටාර් රාජ්‍යය

අතිගරු ජනාධිපතිතුමා සහ කටාර් රාජ්‍යයේ එමීර්වරයා අතර හමුවක් මෙම වසරේ සැප්තැම්බර් හි දී නිව් යෝර්ක් හි දී පවත්වන ලදී. කටාර් රාජ්‍යය, 2013 මාර්තු මස ජිනීවා හි දී පැවති මානව හිමිකම් කවුන්සිලයේ 22 වැනි සැසිවාරය ඇතුළුව ජාත්‍යන්තර සංසදවලදී ශ්‍රී ලංකාවට සහාය ලබා දෙමින් සිටියි. කටාර් හා ශ්‍රී ලංකාව අතර වෙළඳ හා ආර්ථික සබඳතා අඛණ්ඩව වර්ධනය වෙමින් පවතී.

කටාර් ඩියාර් හි නියෝජිත කණ්ඩායමක් මෙම වසරේ අප්‍රේල් මස ශ්‍රී ලංකාවට පැමිණි අතර ආයෝජන හා ප්‍රවර්ධන ගරු නියෝජ්‍ය අමාත්‍යවරයා සමඟ සහ ආයෝජන මණ්ඩලයේ හා වෙනත් අදාළ අධිකාරිවල ජ්‍යෙෂ්ඨ නිලධාරීවරුන් සමඟ ඔවුහු සාකච්ඡා පැවැත්වූහ.

## සෞදි අරාබි රාජ්‍යය

සමාලෝචනයට බඳුන්වන කාල සීමාව තුළදී ශ්‍රී ලංකාව සහ සෞදි අරාබිය අතර සබඳතා අඛණ්ඩව ව්‍යාප්ත වෙමින් පැවතුණි.සෞදි අරාබියේ තෙල්, ඛනිජ තෙල් පිරිපහදුවට ගැලපෙන හා එහි තාක්ෂණික අවශ්‍යතාවලට ගැලපෙන හෙයින් සෞදි අරාබියෙන් ශ්‍රී ලංකාවට වැඩි වශයෙන් බොර තෙල් මිලදී ගැනීමට කටයුතු කෙරේ.

මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය, අපස්මාර රෝහලක් ඉදිකිරීම සහ මොරගහ කන්ද සහ කළු ගඟ සංවර්ධන ව්‍යාපෘති ඇතුළුව ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා සෞදි අරමුදල් අඛණ්ඩව ලබා දීමෙන් ශ්‍රී ලංකාවට සහාය දක්වයි. සංවර්ධනය සඳහා සෞදි අරමුදල සහ ශ්‍රී ලංකාවේ මුදල් අමාත්‍යාංශය ඇතුළුව අදාළ අමාත්‍යාංශ සහ නියෝජිතායතන අතර රැස්වීම් සම්බන්ධීකරණය කරනුයේ මෙම අමාත්‍යාංශය මඟිනි. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් යුතු නියෝජිත කණ්ඩායමක් 2013 ජූනි මාසයේදී සෞදි අරාබියේ සංචාරයක නිරත වූ අතර මෙහිදී, සංවර්ධනය සඳහා සෞදි අරමුදලේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ රැස්වීම් පවත්වන ලදී.

සෞදි අරාබියේ තාවකාලිකව වෙසෙන එහෙත් නියමිත ලියකියවිලි නොමැති සියලුම ශ්‍රී ලාංකිකයන් සඳහා, දඬුවම් ලැබීමකින් තොරව එම රටින් පිටත්වීමට හෝ ක්‍රමානුකූලව එහි රැඳී සිටීමට හෝ ඔවුනට හැකිවන පරිදි සෞදි රාජධානිය සමා කාලයක් ප්‍රදානය කළේය. අවශ්‍ය ලිපි ලේඛන නිකුත් කිරීමෙන් සහ අදළ සෞදි බලධාරීන් සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම මඟින් මෙම ශ්‍රී ලාංකිකයන්ට සහාය වීම සඳහා රියාද් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට සහ ජෙඩා හි කොන්සල් ජනරාල් කාර්යාලයට අමතර කාර්ය මණ්ඩලය ඇතුළුව අවශ්‍ය සම්පත් අමාත්‍යාංශය ලබා දී තිබේ.

## සිරියානු අරාබි ජනරජය

රුසියානු සමූහාණ්ඩුව සහ ඇමරිකා එක්සත් ජනපදය අතර නිශ්චිත කාල සීමාවකට යටත්ව ආරක්ෂාව ලබා දීම සහ සිරියාවේ රසායන අවි, රැස්කරගත් තොග විනාශ කිරීම පිළිබඳව ගිවිසුමකට එළඹීම හා එමඟින් සාමකාමී අයුරින් මෙම ගැටලුව විසඳ ගැනීමට අපේක්ෂා කිරීම පිළිබඳව සතුට පළ කරමින් ශ්‍රී ලංකාව ප්‍රකාශයක් නිකුත් කළේය.

## එක්සත් අරාබි එමීර් රාජ්‍යය

මෙම වසරේ ජනවාරි මස, ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සංචාරයක යෙදුණු අතර එහිදී එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ විදේශ කටයුතු අමාත්‍යවරයා වන ෂෙයික් අබ්දුල්ලාහ් බින් සයේඩ් අල් හහ්යාන් රජතුමා සමඟ ශ්‍රී ලංකාව හා එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර ඒකාබද්ධ කොමිෂන් සභාව ස්ථාපනය කිරීම පිළිබඳ ගිවිසුමට අත්සන් තැබීය. මෙම ඒකාබද්ධ කොමිෂන් සභාව ස්ථාපනය කිරීමේ ප්‍රධාන අරමුණු වනුයේ, දැනට පවත්නා ද්වීපාර්ශ්වික සබඳතා තවදුරටත්ශක්තිමත් කිරීම සහ අන්‍යෝන්‍ය වශයෙන් එකඟත්වයට පත් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් දෙරට අතර සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම වන අතර මෙම කොමිෂන් සභාවේ පළමු සැසිය නුදුරු අනාගතයේදී කැඳවීමට නියමිතය.

ගරු අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන්යුතු සය සාමාජික නියෝජිත කණ්ඩායමක් ඩුබායි හි පැවති මුහුදු කොල්ල කෑම මර්දනය කිරීම පිළිබඳ තෙවැනි සමුළුවට සහභාගී වීම සඳහා මෙම වසරේදී සැප්තැම්බර් හි දී එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සංචාරයක නිරත විය. මෙම සමුළුවට සමගාමීව ගරු අමාත්‍යවරයා, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ විදේශ කටයුතු අමාත්‍යවරයා සමඟ සහ විදේශ කටයුතුවල අනුබද්ධ වෙනත් අමාත්‍යවරු සමඟ ද්විපාශ්වික සාකච්ඡා පැවැත්විය.

# අප්‍රිකා අංශය

## අප්‍රිකා අංශය

**පසුබිම**

අප්‍රිකා කලාපයේ රටවල් 62ක් තිබෙන අතර ඉන් රටවල් 54ක් ස්වෛරී රාජ්‍යයන්ය. අනෙකුත් රාජ්‍ය අර්ධ වශයෙන් පිළිගත්, පිළිනොගත් රාජ්‍ය හෝ යැපුම් දේශයන්ය. ශ්‍රී ලංකාව පහත සඳහන් අප්‍රිකානු රටවල් 40 සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇති කරගෙන තිබේ.

| | | | | |
|---|---|---|---|---|
| 1.ඇන්ගෝලාව | 9. ඊජිප්තුව | 17. මාලි | 25. නයිජීරියාව | 33.දකුණු අප්‍රිකාව |
| 2.ඇල්ජීරියාව | 10. ඝානාව | 18. මොරිටේනියාව | 26. රුවන්ඩාව | 34. ස්වාසිලන්තය |
| 3.බෙනින් | 11. ගිනියා | 19. මැඩගස්කරය | 27. සී ෂෙල්ස් | 35. ටැන්සානියාව |
| 4.බොට්ස්වානාව | 12. ගිනියා-බිසවු | 20. මලාවි | 28. සෙනෙගල් | 36.කොංගෝ ජනරජය |
| 5.බර්කිනා ෆාසෝ | 13.කෙන්යාව | 21. මුරුසිය | 29. සෝමාලියාව | 37. ටියුනීසියාව |
| 6.කොංගෝ ප්‍රජාතාන්ත්‍රික ජනරජය | 14. ලෙසොතෝ | 22. මොසැම්බික් | 30. සුඩානය | 38. උගන්ඩාව |
| 7.එරිත්‍රියාව | 15. ලිබියාව | 23. මොරොක්කෝව | 31. දකුණු සුඩානය | 39. සිම්බාබ්වේ |
| 8. ඉතියෝපියාව | 16. ලයිබීරියාව | 24. නැමීබියාව | 32.සියෙරා ලියොන් | 40. සැම්බියාව |
| | | | | 41.කොට්ඩි අයිවෝර් |

අප්‍රිකා කලාපය තුළ පිහිටි පහත සඳහන් ශ්‍රී ලංකා දූත මණ්ඩල, කලාපයේ පිහිටි පහත සඳහන් රටවල් සමග සමගාමීව අක්ත ගන්වා ඇත.

1. ඊජිප්තුව - ඇල්ජීරියාව,එරිත්‍රියාව,ලිබියාව,මාලි,මොරොක්කෝව, මොරිටේනියාව,ටියුනීසියාව, සුඩානය,
2. කෙන්යාව -කොංගෝ ජනරජය,මලාවි, සහසෝමාලියාව
3. දකුණු අප්‍රිකාව-ඇන්ගෝලාව, බොට්ස්වානාව, ලෙසතෝ, මොසැම්බික්,නැමීබියාව,ස්වාසිලන්තය, සැම්බියාව සහ සිම්බාබ්වේ
4. උගන්ඩාව- බෙනින්, බර්කිනා ෆාසෝ,කොංගෝප්‍රජාතාන්ත්‍රිකජනරජය, ඉතියෝපියාව,ඝානාව,ලයිබීරියාව,රුවන්ඩාව,සෙනෙගාල්,සියෙරා ලියෝන්, දකුණු සුඩානය සහ ටැන්සානියාව
5. නයිජීරියා-, කොට් ඩි අයිවෝර්,ගිනියා,ගිනියා බිසවු,
6. සී ෂෙල්ස් - මැඩගස්කර් සහ මුරුසිය

| ආණ්ඩු ප්‍රධානීන්ගේ මට්ටමින් සහභාගි වූ රටවල් | උප ජනාධිපති මට්ටමින් සහභාගිවූ රටවල් | අමාත්‍යවරුන්ගේ මට්ටමින් සහභාගිවූ රටවල් |
|---|---|---|
| ලෙසතෝ | සානාව | බොට්ස්වානා |
| නැමීබියා | මලාවි | කැමරූන් |
| රුවන්ඩාව | නයිජීරියාව | කෙන්යාව |
| සී ෂෙල්ස් | උගන්ඩාව | මොසැම්බික් |
| දකුණු අප්‍රිකාව | සැම්බියාව | මුරුසිය |
| ස්වාසිලන්තය | | සියෙරා ලියොන් |
| ටැන්සානියාව | | |

<u>2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීමට සමගාමීව අප්‍රිකානු රටවල් සමග එළඹෙන ලද ගිවිසුම්/අවබෝධතා ගිවිසුම්</u>

2013 නොවැම්බර් 15 වැනි දින ක්‍රමෝපායික සංවාදයක්ස්ථාපනය කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුමකට ශ්‍රී ලංකාව හා නයිජීරියාව අත්සන් තැබූහ.

1. **<u>සමාලෝචනයට බඳුන් කරන කාලය තුළදී ශ්‍රී ලංකාවේ නිරතවූ හා විදේශ රටවල නිරතවූ ද්විපාර්ශ්වික සංචාර</u>**

**<u>කෙන්යාව</u>**

- අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ විශේෂ නියෝජිතයන් ලෙස, විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු නියෝමාල් පෙරේරා මහතා සහ සිවිල් ගුවන්සේවා නියෝජ්‍ය අමාත්‍ය ගරු ගීතාංජන ගුණවර්ධන මහතා, 2013 අප්‍රේල් 09 වැනි දින නයිරෝබිහීදී පැවති කෙන්යානු ජනාධිපති අතිගරු උහුරු කෙන්යාටා මහතාගේ පදවි ප්‍රාප්ත උළෙලට ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් සහභාගි වූහ.

- අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා, අතිගරු ජනාධිපති උහුරු කෙන්යත්තා මැතිතුමාගේ ආරාධනයෙන් 2013 දෙසැම්බර් 12 වන දින පැවැති කෙන්යාව නිදහස ලැබීම පිළිබඳ ස්වර්ණ ජයන්ති උත්සවයට සහභාගි වූ අතර 2013 දෙසැම්බර් 13 සහ 14 යන දෙදින රාජ්‍ය සංචාරයක ද නිරත විය. මෙම සංචාරය අතරවාරයේදී පහත සඳහන් අවබෝධතා ගිවිසුම්වලට එළඹෙන ලදී.

1. සහයෝගිතාව සඳහා කෙන්යා -ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිෂන් සභාව ස්ථාපනය කිරීම පිළිබඳ ගිවිසුම
2. ද්විපාර්ශ්වික සම්බන්ධතා පිළිබඳ අවබෝධතා ගිවිසුම,
3. ද්විපාර්ශ්වික වෙළඳාම පිළිබඳ අවබෝධතා ගිවිසුම,
4. ආර්ථික හා තාක්ෂණික සහයෝගිතාව පිළිබඳ ගිවිසුම,
5. රාජ්‍යතාන්ත්‍රික හා නිල ගමන් බලපත්‍ර හිමියන් වීසා වලින් නිදහස් කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම,
6. සංචාරක ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම,
7. සංස්කෘතික සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම,
8. ක්‍රීඩා ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම,
9. කෙන්යාවේ වාණිජ හා කර්මාන්ත මණ්ඩලය හා ලංකා වාණිජ මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුම
10. ශ්‍රී ලංකා- කෙන්යා ව්‍යාපාරික කවුන්සිලය ස්ථාපනය කිරීම

## දකුණු අප්‍රිකාව

- ජාත්‍යන්තර සබඳතා සහ ක්‍රමෝපායික අධ්‍යයනය පිළිබඳ ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය සහ දකුණු අප්‍රිකාවේ අප්‍රිකානු ආයතනය (ASIA) ජාත්‍යන්තර කටයුතු පිළිබඳ දකුණු අප්‍රිකානු ආයතනය (SAIIA) අතර අවබෝධතා ගිවිසුමකට 2013.05.13 වැනි දින ප්‍රිටෝරියාහිදී අත්සන් තැබිණ.

- ගරු කථානායක චමල් රාජපක්ෂ මහතාගේ නායකත්වයෙන් යුත් නියෝජිත කණ්ඩායමක්, ජොහැන්නස්බර්ග්හි පැවති පොදු රාජ්‍ය මණ්ඩලයීය පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායම් සමුළුවට සහභාගි විය.

- ශ්‍රී ලංකා - දකුණු අප්‍රිකා පාර්ශ්වකාරීත්ව සංසදය :ශ්‍රී ලංකා - දකුණු අප්‍රිකා පාර්ශ්වකාරීත්වසංසදයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීමේ 4 වැනි සැසිවාරය, 2013 මැයි 21 වන දින ප්‍රිටෝරියාහි දී අවසන් විය.මේ සඳහා සහභාගීවූ නියෝජිත කණ්ඩායමේ නායකත්වය, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් කේ.අමුණුගම මහතා විසින් දරනු ලැබීය.

- ආයෝජන සහයෝගීතාවය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා දකුණු අප්‍රිකාවේ පෞද්ගලික හිමිකාරිත්වයක් ඇති විශාලතම ආරක්ෂක සහ ගුවන් සේවා සමාගම වන ''පැරමවුන්ට් ගෲප්'' හි සභාපතිවරයා සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු 2013 අගෝස්තු 17 - 22 දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. මෙම නියෝජිත පිරිස මෙම සංචාරය අතරතුරදී, ගුවන් හමුදාපතිවරයා, ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරීන්, පේරාදෙණිය විශ්ව විද්‍යාලයයේ මහාචාර්ය සංගක්කාර මහතා, නැනෝ තාක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ නිලධාරීන් සහ ජාතික කෘෂි - ව්‍යාපාරික කවුන්සිලයේ නිලධාරීන් හමුවිය.

- දකුණුඅප්‍රිකාවේහිටපුජනාධිපතිනෙල්සන්මැන්ඩෙලාඅනුස්මරණයකිරීමේසේවයටසහභාගිවීම සඳහාඅතිගරුජනාධිපතිතුමා 2013 දෙසැම්බර් 10 වනදිනදකුණුඅප්‍රිකාවේසංචාරයකනිරතවිය.

## උගන්ඩාව

* උගන්ඩාවේ ජනාධිපති අතිගරු මුසවේනි මහතාගේ ආරාධනය මත අතිගරු ජනාධිපතිතුමා 2013 මැයි 11-15 දිනවලදී උගන්ඩාවේ රාජ්‍ය සංචාරයක නිරත වූ අතර, උගන්ඩාවේ කම්පාලා නුවර පැවති 7 වැනි පොදු රාජ්‍ය මණ්ඩලයීය පළාත් පාලන සංසදයට සහභාගී විය. මෙම සංචාරය අතරතුරදී දෙරටේ නායකයන් දෙපළ විසින් කම්පාලා හි ප්‍රථම ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය උත්සවාකාරයෙන් විවෘත කරන ලදී. මසුලිටා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිය අතිගරු ජනාධිපතිතුමා විසින් දියත් කරන ලද අතර, මේ පිළිබඳව වන ගිවිසුමට අතිගරු ජනාධිපති මුසවේනි මහතාගේ 2012 වසරේදී සිදුකළ ශ්‍රී ලංකා සංචාරයේදී අත්සන් තබනු ලැබිණ.

    - මුදල්හාක්‍රමසම්පාදනගරුනියෝජ්‍යඅමාත්‍ය, සරත්අමුණුගමමැතිතුමා 2013 අප්‍රේල් 11 සහ 12 දිනවලපැවති" උගන්ඩා ආයෝජන " සංසදයට සහභාගි විය.

    - ආර්ථිකසංවර්ධනයපිළිබඳගරුනියෝජ්‍යඅමාත්‍ය සුසන්තපුංචිනිලමේමැතිතුමා 2013 අප්‍රේල් 10 සිට 18 දිනදක්වාකාලයතුළඋගන්ඩාවේ සංචාරයක නිරත විය.

- 2013 ජූලි 19-24 දිනවලදීරාජ්‍යආරක්ෂකහානාගරිකසංවර්ධනලේකම්ගෝඨාභය රාජපක්ෂ මහතා උගන්ඩාවේ සංචාරයක නියැලිණි.

- උගන්ඩාවේගරුපාර්ලිමේන්තුමන්ත්‍රී, ආචාර්යසැම්ලියොමොකිමැතිතුමාගේනායකත්වයෙන්යුත්උගන්ඩානියෝජිතකණ්ඩායමක් 2013 මැයි 18 සිට 25 දක්වාකාලයතුළශ්‍රීලංකාවේසංචාරයකනිරතවිය.

- මසුලිටාභිවෘත්තීයපුහුණුආයතනගොඩනැගිල්ලටමුල්ගලතැබීමේ උත්සවයට හා ශ්‍රී ලංකා වෛද්‍ය විශේෂඥයින් විසින් මසුලිටා ළමා ගම්මානයේදී පවත්වන ලද උගන්ඩාවේ අනාථ දරුවන් ආරක්ෂා කිරීම සඳහා උත්සාහ දරන කාන්තාවන්ගේ වෛද්‍ය කඳවුරට සහභාගිවීම සඳහා ජනාධිපති ආර්යා ශිරන්ති රාජපක්ෂ මැතිනිය 2014 ජනවාරිමාසයේ 23 සිට 26 දක්වා කාලය තුළ උගන්ඩාවේ කළ සංචාරයේදී අමාත්‍යාංශය මගින් පහසුකම් සලසා දෙන ලදී.

<u>ටැන්සානියාව</u>

- ටැන්සානියානු ජනාධිපති අතිගරු ජකායා මිරිශො කික්වෙතේ මහතාගේ ආරාධනයක් මත, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා 2013 ජූනි 27-29 දිනවලදී ටැන්සානියාවේ රාජ්‍ය සංචාරයක නිරත විය. මෙම සංචාරයට සමගාමීව, දර් එස් සලාම් හි පැවති ගෝලීය 2013 "ස්මාර්ට් හවුල්කාරීත්ව සංවාදය"ටද අතිගරු ජනාධිපතිතුමා සහභාගි විය.

- සංචාරක සහ සංස්කෘතික සහයෝගීතාවය පිළිබඳ අවබෝධතා ගිවිසුමකටද, ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ ගිවිසුමකටද මෙම සංචාරය අතරතුරදී අත්සන් තැබිණ.පුළුල් පාරාසයක් ඔස්සේ කරුණු ගණනාවක් පිළිබඳව පැවති ද්විපාර්ශ්වික සාකච්ඡා, ටැන්සානියාවේ තේ, පොල් සහ ඇඟළුම් කර්මාන්ත පිළිබඳව මෙන්ම සහල් අපනයනය කිරීම පිළිබඳවද දැඩි අවධානයක් යොමු කළේය.එකිනෙක රටවල අගනුවරවල නේවාසික දූත මණ්ඩල ස්ථාපනය කිරීම පිළිබඳව ඇති හැකියාව පිළිබඳවද දෙපාර්ශ්වය සාකච්ඡා කළේය. දෙපාර්ශ්වයටම පහසු දිනයකදී ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදෙන ලෙස අතිගරු ජනාධිපතිතුමා, කික්වෙතේ ජනාධිපතිතුමාට සහ ආර්යාවට ආරාධනා කර සිටියේය.

- "2013ගෝලීය ස්මාර්ට් හවුල්කාරීත්ව සංවාදය" විවෘත කිරීමට අමතරව, අතිගරු ජනාධිපතිතුමා, ටැන්සානියානු ජනාධිපතිතුමා සමග "ස්මාර්ට් හවුල්කාරීත්වය, සමාජ ආර්ථික පරිණාමය තුළ වර්ධනයක් සඳහා තාක්ෂණය යොදාගැනීම" යන සංවාද සංසඳයද මෙහෙයවීය. මැලේසියානු අග්‍රාමාත්‍ය ඩාටෝ ශ්‍රී මොහොමඩ් නජීබ් බින් සොක් මහතා සහ ස්වාසිලන්තයේ III වන මිස්වාටි රජතුමා සමඟද අතිගරු ජනාධිපති රාජපක්ෂ මහතා ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීය.

- අතිගරුජනාධිපතිතුමාටැන්සානියාවේකළසංචාරයපිළිබඳපසුවිමසුම්කටයුතුකිරීමක්වශයෙන්පොල්කර්මාන්තය, රෙදිපිළිකර්මාන්තඅංශයේසහසුළු ජලවිදුලිබලඅංශයේකටයුතුවලට සහායවීමසඳහාගියශ්‍රීලාංකිකවිශේෂඥ කණ්ඩායමකට අමාත්‍යාංශය විසින් පහසුකම් සලසා දෙන ලදී.

## <u>සීෂෙල්ස්</u>

- සීෂෙල්ස් ජනාධිපති අතිගරු ජේම්ස් ඇලික්ස් මිෂෙල් මහතාගේ ආරාධනායක් මත, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා, සීෂෙල්ස්හි රාජ්‍ය සංචාරයක නිරත විය. මෙම සංචාරය අතරතුරදී, රාජ්‍ය නායකවරු දෙපළ පුළුල් පරාසයකට අයත් කරුණු ගණනාවක් පිළිබඳව සාකච්ඡා කළ අතර, අධ්‍යාපනය, ධීවර කර්මාන්තය, වෙළඳාම සහ ආයෝජනය, අධිකරණය සහ සෞඛ්‍ය යන ක්ෂේත්‍රවල සබඳතා ශක්තිමත් කර ගැනීමට එකඟ වූහ. ආරක්ෂක සහයෝගීතාවය පිළිබඳ අවබෝධතා ගිවිසුමකටද, ද්විපාර්ශ්වික ගුවන්සේවා ගිවිසුමකටද, වෘත්තීය පුහුණුව සහ තරුණ සංවර්ධනය පිළිබඳ අවබෝධතා ගිවිසුමකටද ජනාධිපතිවරු දෙපළ ඉදිරියේදී අත්සන් තැබිණ.

- අතිගරු ජනාධිපතිතුමා, සීෂෙල්ස්හි ජාතික සභාවේ අති විශේෂ සැසිවාරය ඇමතූ අතර, මෙම සංචාරය අතරතුරදී කෙම්පින්ස්කි රිසෝට්හීදී පැවති විශේෂයෙන් කැඳවන ලද ව්‍යාපාරික සභාවෙහි ප්‍රධාන අමුත්තා ලෙසද සහභාගි විය.

- විදේශකටයුතු අමාත්‍ය, ගරු(මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා, 2013 මාර්තු 24-27 දිනවලදී සීෂෙල්ස්හි සංචාරයක නියැලිණි.

- විදේශකටයුතුඅමාත්‍යාංශයේඅධීක්ෂණ මන්ත්‍රීගරුසජින්දවාස්ගුණවර්ධනමහතාගේ ප්‍රධානත්වයෙන් යුත් ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමක් 2013 අගෝස්තු 4-7 දිනවලදී සීෂෙල්ස්හි සංචාරයක නියැලිණි.

- සීෂෙල්ස්මහබැංකුවේඅධිපතිකැරොලින්අබෙල්මහත්මියසහකණ්ඩායමක්, 2013 මැයි 11-19 දිනවලදීශ්‍රීලංකාවේසංචාරයකනියැලුණි.

- මිහින්ලංකා, සීෂෙල්ස්වෙත 2013 නොවැම්බර් 16 දින ගුවන් ගමන් ආරම්භ කළේය.

## <u>සිනෙගල්</u>

- 2014 පළමුකාර්තුවේදී ශ්‍රී ලංකාවේ රාජ්‍ය සංචාරයක නියැලෙන ලෙස සිනෙගල් ජනාධිපතිවරයාට ආරාධනයක් කර තිබේ.

## <u>ඊජිප්තුව</u>

- ඊජිප්තු යුද හමුදාවේ කර්නල් හුසේන් මොහොමඩ් හුසේන් හසන් මහතා " ගැටුමෙන් පසු ශ්‍රී ලංකාව: අභියෝග සහ කලාපීය ස්ථාවරත්වය" යන තේමාව යටතේ 2013 වසරේ කොළඹදී පැවැති ආරක්ෂක සම්මන්ත්‍රණයට සහභාගී විය. ටියුනීසියානු හමුදා නිලධාරී, කර්නල් මේජර් ෆෙති ගැබ්සි මහතාද මෙම සම්මන්ත්‍රණයට සහභාගි විය.

- 2013 අප්‍රේල්19-25 දිනවලදී කයිරෝ හි ජාත්‍යන්තර බෙරවාදන හා පාරම්පරික කලා වැඩසටහනට ශ්‍රී ලාංකික කලාකරුවන් සහභාගී විය.

- " සංස්කෘතික සංචාරක චිත්‍රපට" සඳහා අස්වාන් ජාත්‍යන්තර උළෙල සඳහා සහභාගිත්වයට සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය සමග එක්ව මෙම අමාත්‍යාංශය පහසුකම් සලසන ලදී.

- අල්-අස්හාර් විශ්වවිද්‍යාලයේදී ශිෂ්‍යත්ව
  ප්‍රදානය සඳහා මෙම අමාත්‍යාංශය බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය සමග [illegible]
  අවශ්‍ය පහසුකම් සැලසීය.

- ආගමික දේශනා හා සුෆි සංගීතය සඳහා ජාත්‍යන්තර උළෙලේ 6, [illegible]
  මෙම අමාත්‍යාංශය බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශ සමඟ එක්ව
  අවශ්‍ය පහසුකම් සැලසීය.

## සුඩානය

- සුඩාන ජනරජයේ ආරක්ෂක අමාත්‍යාංශයේ මහලේකම්, ජනරාල් අබ්සෙල්රහමන් මොහොමඩ් සෙයිකන් අහමඩ් මහතාගේ නායකත්වයෙන් යුත් 12 දෙනෙකුගෙන් සමන්විත සුඩාන නියෝජිත කණ්ඩායමක්, ආරක්ෂක අංශයේ සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා 2013 අගෝස්තු 26 සිට 31 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

## බර්කිනා ෆාසෝ

- බර්කිනා ෆාසෝහි විදේශ කටයුතු සහ කලාපීය සහයෝගීතාවය පිළිබඳ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ෆාසෝ ඩිජිබ්රිල් යිපෙනේ බසලෝ මහතා, 2013 අප්‍රේල් 03-06 දිනවලදී ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නිරත විය. මෙම සංචාරය අතරතුරදී දෙරටේ විදේශ අමාත්‍යාංශ අතර සහයෝගීතාවය පිළිබඳව අවබෝධතා ගිවිසුමකට ද අත්සන් තැබිණ.

## වෙනත්

ශ්‍රීලංකාවඅප්‍රිකානුසංගමයේනිළ පිළිගැනීමට ලක්කරන ලෙස ඉල්ලා සිටීම-අප්‍රිකානු වන රටක් ලෙස ශ්‍රී ලංකාව අප්‍රිකානු සංගමයේ නිල පිළිගැනීමට ලක්කරන ලෙස ඉල්ලා සිටීමට පියවර ගත් අතර ඒ පිළිබඳව කටයුතු සිදුකෙරෙමින් පවතියි.

# යුරෝපා, ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු මඩුලු සහ ඇමෙරිකා අංශය

## යුරෝපා, ස්වාධීන රාජ්‍යයන්ගේ පොදුමඩුලුසහඇමෙරිකාඅංශය

දේශපාලන කටයුතු (බටහිර අංශය) භූගෝලීය කලාප තුනක එනම් යුරෝපයේ, ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු මඩුලු කලාපයේ සහ ඇමෙරිකානු මහද්වීප තුළ පිහිටා ඇති රටවල් සමඟ ශ්‍රී ලංකාව පවත්වන ද්විපාර්ශ්වික සබඳතා පිළිබඳ කටයුතු ආවරණය කරයි.

**යුරෝපය**

ආවරණය වන රටවල් : 42

ඇල්බේනියාව, ඇන්ඩෝරා, ඔස්ට්‍රියාව, බෙල්ජියම, බොස්නියා සහ හර්සගොවීනා, බල්ගේරියාව, ක්‍රොඒෂියාව, සයිප්‍රසය, චෙක් ජනරජය, ඩෙන්මාර්ක්, එස්ටෝනියාව, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, හන්ගේරියාව, අයිස්ලන්තය, අයර්ලන්තය, ඉතාලිය, ලැට්වියාව, ලිච්ටෙන්ස්ටයින්, ලිතුවේනියාව, ලක්සම්බර්ග්, මැසිඩෝනියාව, මෝල්ටාව, මොනැකො, මොන්ටෙනීග්‍රො, නෝර්වේ, පෝලන්තය, පෘතුගාලය, රොමේනියාව, සැන් මරීනා, සර්බියාව, ස්ලොවැකියාව, ස්ලෝවීනියාව, ස්පාඤ්ඤය, ස්වීඩනය, ස්විස්ටර්ලන්තය, වතිකානුව, නෙදර්ලන්තය, එක්සත් රාජධානිය, තුර්කිය

නේවාසික දූත මණ්ඩල ගණන : 12

ඔස්ට්‍රියාව, බෙල්ජියම, ප්‍රංශය, ජර්මනිය (බර්ලින් සහ ෆ්‍රැන්ක්ෆර්ට්), ඉතාලිය, නෝර්වේ, පෝලන්තය, ස්වීඩන්, නෙදර්ලන්තය, එක්සත් රාජධානිය, තුර්කිය

සමගාමී අක්තගැන්වීම් ගණන :

- වියනා හි සිට බොස්නියා සහ හර්සගොවීනා, ක්‍රොඒෂියාව, චෙක් ජනරජය, හන්ගේරියාව, මැසිඩෝනාව, සර්බියාව, ස්ලෝවැකියාව සහ ස්ලෝවීනියාව
- බ්‍රසල්ස් හි සිට ලක්සම්බර්ග් සහ යුරෝපා සංගමය
- පැරිස් හි සිට පෘතුගාලය සහ ස්පාඤ්ඤය
- බර්ලින් හි සිට ස්විස්ටර්ලන්තය
- ජිනීවා හි සිට වතිකානුව
- රෝමයේසිටඇල්බේනියාව, සයිප්‍රසය, ග්‍රීසිය, මෝල්ටාව
- වෝර්සෝ හි සිට රොමේනියාව
- ස්ටොක්හෝම් හි සිට ඩෙන්මාර්කය, එස්ටෝනියාව, ෆින්ලන්තය, අයිස්ලන්තය, ලැට්වියාව, ලිතුවේනියාව
- ලන්ඩන් හි සිට අයර්ලන්තය

බහුපාර්ශ්වීය සංවිධාන ගණන : 02

පොදු රාජ්‍ය මණ්ඩලය සහ යුරෝපා සංගමය

පසුගිය වසරක කාලය තුළ, යුරෝපීය රටවල් සමඟ පවත්වන සබඳතා පිළිබඳ මූලික අවධානය යොමු කරන ලද අතර, 2013 නොවැම්බර් මස ශ්‍රී ලංකාවේ පවත්වන ලද පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ සමුළුව සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කිරීම සම්බන්ධයෙන් ද මෙම අංශය සමීපව සම්බන්ධ වී කටයුතු කළේය.

## 2013 වසර තුළ යුරෝපය වෙත කළ ඉහළ පෙළේ සංචාර

රොමේනියානු විදේශ කටයුතු අමාත්‍යවරයා සමඟ නිල සාකච්ඡා පැවැත්වීම සඳහා ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා 2013 අප්‍රේල් මස රොමේනියාවේ සංචාරයක නිරත විය. මෙම සංචාරය අතරතුරදී, විදේශ කටයුතු අමාත්‍යවරයා රොමේනියානු සෙනට් සභාවේ සභාපතිවරයා සමඟ සාකච්ඡා පැවැත්වූ අතර, ශ්‍රී ලංකා - රොමේනියා ව්‍යාපාරික සංසදයේ සමාරම්භක අවස්ථාවටද සහභාගී විය. ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය සහ රොමේනියාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය අතර ද්විපාර්ශ්වික උපදේශන පිළිබඳව ගිවිසුමකටද රොමේනියා රාජ්‍යතාන්ත්‍රික ආයතනය සහ ජාත්‍යන්තර සබඳතා සහ ක්‍රමෝපායික අධ්‍යයනය පිළිබඳ ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය අතර ගිවිසුමකටද අත්සන් තැබීම මෙම සංචාරය අතරතුර සිදු වූ සුවිශේෂී සිදුවීමක් විය.

ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා 2013 ජූනි 08 -10 යන දිනවලදී ස්ලෝවෙවීනියාවේ සංචාරයක නිරත වූ අතර, එහිදී ස්ලෝවීනියානු නියෝජ්‍ය අග්‍රාමාත්‍ය සහ විදේශ කටයුතු අමාත්‍යවරයා, ව්‍යවස්ථාදායක සභාවේ සභාපතිවරයා සහ ජාතික සභාවේ සභාපතිවරයා හමුවී සාකච්ඡා පැවැත්වීය. මෙම සාකච්ජාවලදී, ද්විපාර්ශ්වික සබඳතා සහ වෙළඳ, ආයෝජන සහ සංස්කෘතික සබඳතා පිළිබඳව දැඩි අවධානයක් යොමු කෙරිණ.

විදේශ කටයුතු අමාත්‍යවරයා 2013 ජූනි 12 – 14 දිනවලදී ජර්මානු ෆෙඩරල් ජනරජයේ සංචාරයක නිරත විය. ජර්මානු ෆෙඩරල් ජනරජයේ විදේශ කටයුතු අමාත්‍යවරයා, ජර්මානු පාර්ලිමේන්තුවේ උපසභාපතිවරයා සහ වෙනත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ මෙම සංචාරය අතරතුරදී සාකච්ඡා පවත්වන ලදී. දෙරටම උනන්දුවක් දක්වන කරුණු සහ සංචාරක, වෙළඳ සහ ආයෝජන කටයුතු ප්‍රවර්ධනය කරන ආකාරය පිළිබඳව මෙහිදී සාකච්ඡා කෙරිණ.

නිව් යෝර්ක් හි පැවති 68 වන එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල රැස්වීමට සමගාමීව, ගරු අමාත්‍යවරයා චෙක් ජනරජයේ සහ එක්සත් රාජධානියේ විදේශ කටයුතු අමාත්‍යවරු සමඟ රැස්වීම් පැවැත්වූ අතර, ද්විපාර්ශ්වික සබඳතා පිළිබඳව සාකච්ඡා කළේය.

සමාජ සේවා අමාත්‍යවරයාගේ නායකත්වයෙන් යුත් නිල නියෝජිත කණ්ඩායමක් 2013 මාර්තු 17 – 21 යන දිනවලදී වැටිකන් සිටි හි සංචාරයක නිරත විය. ගරු විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයාද මෙම නියෝජිත කණ්ඩායමට ඇතුළත් විය. මෙම නියෝජිත කණ්ඩායම, 2013 මාර්තු මස 19 වැනි දින පැවති ශුද්ධෝත්තම ෆ්‍රැන්සිස් පාප් වහන්සේගේ පදවි ප්‍රාප්ති උළෙලට ද සහභාගී විය.

ගරු ආගමික සංවර්ධන අමාත්‍යවරයා සහ ගරු පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා 2013 මාර්තු 27 – 31 දිනවලදී චෙක් ජනරජයේ සංචාරයක නිරත වූ අතර එරටේ අදාළ අමාත්‍යවරු සමඟ සාකච්ඡා පැවැත්වූහ. ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා චෙක් ජනරජයේ කර්මාන්ත හා වෙළඳ අමාත්‍යවරයා හමුවී අන්‍යෝන්‍ය සහයෝගීතාවය පිළිබඳ සාකච්ඡා කළේය.

සබරගමුව පළාත් මහ ඇමතිතුමා 2013 මැයි 27 වැනි දින සබරගමුව සහ ගාසියන්ටෙප් අතර "සහෝදර නගර වැඩසටහනට" අත්සන් තැබීමේ උත්සවයට සහභාගී වීම සඳහා තුර්කියේ ගාසියෙන්ටෙප් හි සංචාරයක නිරත විය. ගාසියෙන්ටෙප් සහ සබරගමුව පළාත් අතර සබඳතා තවදුරටත් ශක්තිමත් හා පුළුල් කිරීමට සහ දෙරටේ පුද්ගලයන් අතර සබඳතාවය වැඩි දියුණු කිරීමට මෙම සංචාරය මඟින් පහසුකම් සැලසිණ.

## යුරෝපයෙන් ශ්‍රී ලංකාවට සිදුවූ ඉහළ පෙළේ සංචාර

එස්ටෝනියා විදේශ කටයුතු අමාත්‍යවරයා, ආර්ථික හා සංවර්ධන කටයුතු පිළිබඳ උපලේකම් (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයා) ද කැටුව 2013 පෙබරවාරි 14 – 15 යන දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා, වරාය හා මහා මාර්ග අමාත්‍යවරයා,ලේකම්/ රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ වරාය අධිකාරියේ සභාපතිවරයා සමඟ මෙම සංචාරය තුළදී සාකච්ඡා පවත්වන ලදී. එස්ටෝනියාව සහ ශ්‍රී ලංකාව අතර වෙළඳ සහ ආයෝජන ඉඩ ප්‍රස්ථා ප්‍රවර්ධනය කිරීම පිළිබඳව සහ දෙරට අතර ද්විපාර්ශ්වික සංචාර හුවමාරු කර ගැනීම පිළිබඳව මෙහිදී සාකච්ඡා පැවැත්විණ. වැඩ බලන විදේශ කටයුතු අමාත්‍යවරයා මෙම සංචාරක නියෝජිත පිරිස වෙනුවෙන් දිවා භෝජන සංග්‍රහයක් පිරිණමන ලදී.

හංගේරියානු ජාතික සභාවේ කතානායකවරයා 2013 ජනවාරි 30 - පෙබරවාරි 06 යන දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරය කළේය. මෙම සංචාරය අතරතුරදී එතුමා, අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු කතානායකතුමා, ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා, ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා සහ ගරු ජල සම්පත් හා ජලාපවහන අමාත්‍යතුමා සමඟ සාකච්ඡා පැවැත්විය. මෙම සාකච්ඡා අතරතුරදී, හංගේරියානු පාර්ශ්වය ආරක්ෂාව, ආර්ථික සහ දේශපාලන ක්ෂේත්‍ර තුළ සහයෝගීතාවය වැඩි දියුණු කිරීම පිළිබඳ උනන්දුව පල කළහ.

ඉතාලියේ පිහිටි බොල්සානෝ/ බොසෙන් යන ස්වාධීන පළාතේ සභාපතිවරයා 2013 ජනවාරි 06 – 10 දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූ අතර එතුමා ගරු කතානායකවරයා සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමඟ සාකච්ඡා පැවැත්වීය.

එක්සත් රාජධානියේ විදේශීය සහ පොදු රාජ්‍ය මණ්ඩලයීය කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු උප ලේකම්වරයා 2013 ජනවාරි 31 - පෙබරවාරි 02 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. එහිදී ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා, ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා සමඟ සාකච්ඡා පැවැත්වූ අතර, වත්මන් ද්විපාර්ශ්වික ගැටලු සමාලෝචනයට ලක් කළේය. ඒ මහතා උතුරු පළාතේ ද සංචාරයක නිරත විය.

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එලිනෝර් ලයින්ග් මෙනවියගේ නායකත්වයෙන් යුත් එක්සත් රාජධානියේ පාර්ලිමේන්තු මන්ත්‍රී නියෝජිත කණ්ඩායමක් 2013 ජුලි 21 – 24 දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. එහිදී, අමාත්‍යවරුන් සහ රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ සාකච්ඡා පවත්වන ලද අතර, එක්සත් රාජධානියේ ආධාර ලබා දෙන ව්‍යාපෘතිවලද ප්‍රගතිය නිරීක්ෂණය කරන ලදී.

එක්සත් රාජධානියේ සාමි මන්ත්‍රී මණ්ඩලය ලෝවර් ඉවියාහ් හි ඩෙනිස් රෝජන් සාමිවරයා සහ ආර්යාව, 2013 සැප්තැම්බර් 24 - ඔක්තෝබර් 05 දිනවලදී ශ්‍රී ලංකාවේසංචාරයකනිරත විය. රොජන් සාමිවරයා අතිගරු ජනාධිපතිතුමා බැහැදුටු අතර ගරු අමාත්‍යවරු සහ රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්වීය.

ජනාධිපති ලේකම්වරයා විසින් සිදු කරන ලද ආරාධනයකට අනුව, ප්‍රංශයේ ඕර්නේ හි සෙනට් සභික නැතාලි ගුලේ මෙනවිය ශ්‍රී ලංකාව සහ ප්‍රංශය අතර සබඳතා වැඩි දියුණු කිරීමේ අරමුණෙන් 2013 අගෝස්තු 17 – 21 දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. මෙහිදී තුන් අවුරුදු සැලැස්මක් නිර්මාණය කර ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති වෙත භාර දී තිබේ. ප්‍රංශයේ සෙනට් සභා ඉතිහාසයේ ප්‍රථම වතාවට ශ්‍රී ලංකා මිත්‍රත්ව කණ්ඩායමක් ස්ථාපනය කිරීමට අවසරය ලබා දෙන ලදී.

සබරගමුවපළාතහාතුර්කියේගේසියන්ටෙප්අතරඅත්සන්කරනලදද්විත්වනගරවැඩසටහනයටතේ 2013 දෙසැම්බර් 11 සිට 14 දක්වාකාලයතුළතුර්කියේඅගනගරයේනගරාධිපතිආචාර්යඅසිම්ගසෙල්බේ මහතාගේ මෙහෙයවීම යටතේ දූත පිරිසක් සබරගමුව පළාතේ සංචාරයක නිරත විය.

## යුරෝපා සංගමය

යුරෝපීය බාහිර ක්‍රියාකාරීත්ව සේවයේ සාමාජිකයන්, යුරෝපා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු, යුරෝපා සංගමයේ සාමාජික රටවල සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන්, ශ්‍රී ලංකා - යුරෝපා ඒකාබද්ධ නැවත සියරට ගෙන්වා ගැනීමේ කමිටුවේ ප්‍රථම රැස්වීම, 2013 පෙබරවාරි 18 වැනි දින කොළඹ දී කැඳවන ලදී. අතිරේක ලේකම් (කොන්සියුලර්, නැගෙනහිර ආසියා සහ පැසිෆික්) ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ නායකත්වය දරණ ලද අතර, ඒ මහතා විසින් පර්යේෂණ සඳහා ජාතික ශක්නුතා මධ්‍යස්ථානයේ (NCCR)ප්‍රතිපත්ති අනු කමිටුවේ සභාපතීත්වය ද දරනු ලබයි.

ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාවය පිළිබඳ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයාගේ සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යවරයාගේ නායකත්වයෙන් යුත් ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමක් 2013 පෙබරවාරි 17 – 22 දිනවලදී ප්‍රංශයේ සංචාරයක නිරත විය. ලංකා වාණිජ මණ්ඩලයේ ශ්‍රී ලංකා - ප්‍රංශ ව්‍යාපාරික කවුන්සිලය, ශ්‍රී ලංකා යුරෝපීය වාණිජ මණ්ඩලය හා ඒකාබද්ධව මෙම සංචාරය සඳහා පහසුකම් සැලසීය. යුරෝපා සංගමය සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික සහයෝගීතාවය සඳහා දායකත්වය ලබා දීමේ පුළුල් අරමුණ සහිතව පැවති "යුරෝපා සංගම් - ශ්‍රී ලංකා ව්‍යාපාරික සංවාදය" මෙම සංචාරයේ කැපී පෙනෙන අංගය විය.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායමක් 2013 මැයි 26 – 31 දිනවලදී බ්‍රසල්ස් හි යුරෝපා පාර්ලිමේන්තුවේ සංචාරයක නිරත විය. ගරු නියෝජ්‍ය කතානායකවරයා මෙම නියෝජිත කණ්ඩායමේ නායකත්වය දැරීය. දකුණු ආසියානු රටවල් සමඟ සබඳතා පිළිබඳ යුරෝපා පාර්ලිමේන්තුවේ නියෝජිත කණ්ඩායම, යුරෝපා පාර්ලිමේන්තුවේ සභාපති අතිගරු මාර්ටින් ශුල්ස්, යුරෝපා පාර්ලිමේන්තුවේ ශ්‍රී ලංකා මිතුරෝ කණ්ඩායම සහ ජාත්‍යන්තර වෙළඳ කමිටුවේ උප සභාපති හා යුරෝපා සංගම් - ශ්‍රී ලංකා ව්‍යාපාරික කවුන්සිලයේ සභාපති යුරෝපා පාර්ලිමේන්තුවේ මන්ත්‍රී රොබර්ට් ස්ටර්ඩි මහතා සමඟ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායම සමඟ සාකච්ඡා පවත්වන ලදී.

ඉන් අනතුරුව, දකුණු ආසියානු රටවල් සමඟ සබඳතා සඳහා යුරෝපා පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායම 2013 ජූලි 15 -19 දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූ අතර, දකුණු ආසියානු රටවල් සමඟ සබඳතා සඳහා යුරෝපා පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායමේ සභාපති ජීන් ලැම්බර්ට් මහත්මිය

මෙම නියෝජිත කණ්ඩායමේ නායකත්වය දැරීය. ශ්‍රී ලංකාවේ වර්තමාන තත්ත්වය පිළිබඳව යුරෝපා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් වෙත තොරතුරු ලබා දීම සඳහා මෙම සංචාරය ඉවහල් විය.

යුරෝපා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් වන හාන්ස් වැන් බාලෙන් මහතා සහ පිල් බෙන්නිඔන් මහතා පිළිවෙළින් 2013 ජූලි 28 - අගෝස්තු 16 දිනවලදී සහ 2013 අගෝස්තු 11 – 24 දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරවල නිරත වූ අතර, පාර්ලිමේන්තුවේ ශ්‍රී ලංකා නියෝජ්‍ය කතානායකවරයා විපක්ෂ නායකවරයා සහ ගරු අධීක්ෂණ මන්ත්‍රීවරයා සමඟ සාකච්ඡා පැවැත්වීය. බෙන්නිඔන් මහතා උතුරු පළාතේ සංචාරයක ද නිරත විය.

2013 දෙසැම්බර් මස බ්‍රසල්ස් හි පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා - යුරෝපා සංගම් ඒකාබද්ධ කොමිෂන් සභාව, ශ්‍රී ලංකා රජයේ ස්ථාවරයන් සැකසීම සඳහා නියෝජිත ආයතන අතර රැස්වීම් පහසුකම් සැලසීමෙහි නිරතව සිටියි. ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ නායකත්වය විදේශ කටයුතු ලේකම්වරයා විසින් දරනු ඇත.

යුරෝපාසංගම් - ශ්‍රීලංකාඒකාබද්ධකොමිසමේ 18 වනසැසිවාරය 2013 දෙසැම්බර් 03 වනදිනබ්‍රසල්ස්හිදීපවත්වනලදී.
විදේශකටයුතුඅමාත්‍යාංශයේලේකම්වරයාගේසභාපතිත්වයෙන්බ්‍රසල්ස්වෙතගියශ්‍රී ලංකා දූත පිරිසට විදේශ කටයුතු අමාත්‍යාංශයේ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ,නීතිපති දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා පොලියේ ත්‍රස්ත විමර්ශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 08 දෙනෙක් ඇතුළත් වූහ. 2013 දෙසැම්බර් 02 වන දින ආර්ථික හා වෙළඳ සහයෝගිතාව පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීමක් ඒකාබද්ධ කොමිෂන් සභා රැස්වීමට පෙරාතුව පැවැත්විණ.

### පොදු රාජ්‍ය මණ්ඩලය

නොවැම්බර් මස පැවති 2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීම හා සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කිරීම සඳහා සහ කටයුතු සූදානම් කිරීම සඳහා, පසුගිය වසර තුළ පොදු රාජ්‍ය මණ්ඩලයීය මහ ලේකම් කාර්යාලයේ නිලධාරීන් විසින් සංචාර ගණනාවක් සිදු කරන ලදී. මේ අතුරින් පොදු රාජ්‍ය මණ්ඩලයීය මහ ලේකම්වරයා පෙබරවාරි මස සිදු කළ සංචාරය, නියෝජ්‍ය මහ ලේකම්වරයා ජූලි මස සිදු කළ සංචාරය සුවිශේෂී වෙයි. පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීම සඳහා සිදු කෙරෙමින් පැවතුණු කටයුතු සූදානම් කිරීම් පිළිබඳවත් ඊට අමතරව, පොදු රාජ්‍ය මණ්ඩලය සමඟ ශ්‍රී ලංකාව එක්ව සිදු කරන කටයුතු පිළිබඳව ද මෙම රැස්වීමේදී පුළුල්ව සාකච්ඡා කෙරිණ.

පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ සමුළුව හා සම්බන්ධ විවිධ අවස්ථා සම්බන්ධයෙන් අංශය විසින් පහසුකම් සලසන ලදී.

68 වැනි එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයට සමගාමීව, අතිගරු ජනාධිපතිතුමා සහ ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා 2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීම සම්බන්ධයෙන් අවසන් කටයුතු සූදානම් කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලයීය මහ ලේකම්වරයා සහ මහ ලේකම් කාර්යාලයේ නිලධාරීන් හමුවුණි.

සැප්තැම්බර් මස 26 වන දින නිව් යෝර්ක් හි දී පැවති පොදු රාජ්‍ය මණ්ඩලයීය විදේශ අමාත්‍යවරුන්ගේ රැස්වීමේදී, ගරු අමාත්‍යවරයා, විදේශ අමාත්‍යවරුන් වෙත 2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ සමුළුව සඳහා කටයුතු සූදානම් කිරීම පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

ලන්ඩන් හි සිටින මහ කොමසාරිස්වරුන් වෙත සමුළුවේ පරිපාලනමය සහ සැලසුම් සංවිධාන වැඩපිළිවෙළ පිළිබඳව තොරතුරු ලබා දීම සඳහා, ගරු විදේශ කටයුතු අධීක්ෂණ මන්ත්‍රීවරයාගේ නායකත්වයෙන් යුත් පොදු රාජ්‍ය ආණ්ඩු ප්‍රධානීන්ගේ සමුළුවේ කාර්ය සාධන බලකා ලේකම් කාර්යාලයේ නියෝජිත කණ්ඩායමක් 2013 මැයි මස එක්සත් රාජධානියේ සංචාරයක නිරත විය. මෙම වැඩ පිළිවෙළ පිළිබඳව වීඩියෝ ප්‍රදර්ශනයක් ඉදිරිපත් කෙරුණු අතර, පරිපාලනමය සංදේශයක් ද බෙදා හැරිණි.

පොදු රාජ්‍ය මණ්ඩලයීය සභාපතිත්වයට පත්වීමට නියමිතව සිටි රට ලෙස, 2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීමේ නිල නිවේදනය ප්‍රථමයෙන්ම සාකච්ඡාවට ලක් කෙරුණු ඔක්තෝබර් 17 – 18 දිනවලදී ලන්ඩන් හි පැවති සමස්ත රැස්වීමේ දී (Whole Meeting) කමිටුවේ සභාපතීත්වය ශ්‍රී ලංකාව විසින් දරන ලදී. මීට සහභාගී වූ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ නායකත්වය විදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (බටහිර, එක්සත් ජාතීන්, බහු පාර්ශ්වීය කටයුතු සහ මානව හිමිකම්) විසින් දරන ලදී.

## <u>2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීම</u>

2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ 22 වන රැස්වීම 2013 නොවැම්බර් මස 15 සිට 17 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ කොළඹදී පවත්වන ලදී. 2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීම සඳහා සාර්ථක අන්දමින් සත්කාරක කටයුතු කිරීම නිසා ජාත්‍යන්තර කරලියේ ශ්‍රී ලංකාවේ පැතිකඩ උසස් තත්ත්වයකට පත්විය. මෙම ඓතිහාසික සිද්ධියෙන්තවදුරටත් සනිටුහන් වන්නේ අවුරුදු 24 කට පසුව පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීම ආසියාතික රටක පැවැත්වීමයි. 2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීම පිළිබඳ සත්කාරක කටයුතු කිරීමත් සමඟම ශ්‍රී ලංකාවට ඉදිරි දෙවර්ෂය තුළ සභාපතිත්වය හිමිවිය.

" සාධාරණත්වය සහිත වර්ධනය - සියල්ල ඇතුළත් සංවර්ධනය" යන්න ශ්‍රී ලංකාව විසින් යෝජනා කරන ලද විශේෂ තේමාවයි. මෙම තේමාව පොදු රාජ්‍ය මණ්ඩලයේ රාජ්‍යවලින් බහුතරයකට අදාළ වේ.

පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේපූර්ව විදේශ අමාත්‍ය රැස්විම 2013 නොවැම්බර් 14 වන දින දී ද, ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම් 2013 නොවැම්බර් 11-12 දිනවලද පවත්වන ලදී.ඉහත රැස්විම්වලට අමතරව, සියළුම පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවල විදේශ අමාත්‍යවරුන්ට විවෘත වූ, පොදු රාජ්‍ය මණ්ඩලයීය කුඩා රාජ්‍යවල අමාත්‍ය මට්ටමේ රැස්විමක්ද නොවැම්බර් 12 දින පවත්වන ලදී.

මෙම රැස්වීම පිළිබඳ සංවිධාන කටයුතු කිරීමෙහිලා අමාත්‍යාංශය ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළාය. ඉහත සඳහන් රැස්වීම්වලදී ශ්‍රී ලංකා නියෝජිත පිරිසට අවශ්‍ය කරුණු සකස් කිරීම ඇතුළු අනෙකුත් කටයුතු බටහිර අංශය මඟින් සම්පාදනය කරන ලදී.

පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් සාමාජික රාජ්‍ය 53න් 50ක්ම 2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීමට නියෝජිතයින් ඉදිරිපත් කළ අතර සාමාජික රාජ්‍ය 27ක් නියෝජනය කරන ලද්දේ ආණ්ඩු ප්‍රධානීන් විසිනි.

මෙහිදී, ශ්‍රී ලංකා රජය විසින් යෝජනා කරන ලද හා පොදු රාජ්‍ය මණ්ඩලයීය ලේකම් කාර්යාලය විසින් සකස් කරන ලද 2013 කොළඹ නිවේදනය සහ පහත සඳහන් ප්‍රකාශන තුන පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන් විසින් පිටසන් කරන ලදී.

1. තිරසාර, සියල්ල ඇතුළත් හා සාධාරණ සංවර්ධනය පිළිබඳ කොළඹ ප්‍රකාශය
2. තරුණ තරුණියන් වෙනුවෙන් මාගම්පුර කැපවීම

3. ජාත්‍යන්තර වෙළෙඳාම හා ආයෝජනය පිළිබඳ කෝට්ටේ ප්‍රකාශය

ව්‍යාපාරික සංසදය, තරුණ සංසදය හා ජනතා සංසදය ඇතුලු 2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීමට අදාළ සියලුම ඉසව් සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් පහසුකම් සලසා දෙන ලදී.

පොදු රාජ්‍ය මණ්ඩලයීය තරුණ සංසදය මගින් පළමු පොදු රාජ්‍ය මණ්ඩලයීය තරුණ සභාව සඳහා සහාය ලබාදෙන ලදී. තරුණයින් විසින් මෙහෙයවනු ලබන ස්වයං පාලන මණ්ඩලයක් වන මේ සඳහා පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවලට අයත් තරුණ තරුණයින් බිලියන 1.2 ක් නියෝජනය විය. මෙමගින් තරුණයින්ගේ මෙහෙයවීමෙන් සිදුකෙරෙන සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය සැලසුම් සකස් කෙරේ. හම්බන්තොටදී පොදු රාජ්‍ය මණ්ඩලයීය තරුණ සභාවේ ප්‍රථම ලේකම් කාර්යාලය සඳහා සත්කාරකත්වය ලබාදීමට ශ්‍රී ලංකා රජය ඉදිරිපත් වූ අතර එය ආණ්ඩු ප්‍රධානීන් විසින් පිළිගනු ලැබිණ.

පොදු රාජ්‍ය මණ්ඩලයීය ව්‍යාපාරික සංසදයට ජාත්‍යන්තර වශයෙන් නියෝජිතයන් 655 දෙනෙක්ද දේශීය වශයෙන් නියෝජිතයන් 749 දෙනෙක්ද සහභාගි වූහ. පොදු රාජ්‍ය මණ්ඩලයීය ව්‍යාපාරික සංසදයේදී එක්සත් ජනපද ඩොලර් බිලියන2.55ක් වටිනා අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් අත්සන් කර ඇතැයි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ඇස්තමේන්තු කර ඇත.

# එක්සත් ජාතීන්ගේ, බහු පාර්ශ්වීය කටයුතු, මානව හිමිකම් සහ සමුළු අංශය

## එක්සත් ජාතීන්ගේ, බහු පාර්ශ්වීය කටයුතු, හා මානව හිමිකම් සහ සමුළු අංශය

විදේශ කටයුතු අමාත්‍යාංශයේ බහු පාර්ශ්වීය කටයුතු, මානව හිමිකම් සහ සමුළු අංශයට සුවිශාල වගකීම් සම්භාරයක් පැවරී තිබේ. ගෝලීය ප්‍රජාවගේ වගකිව යුතු සාමාජිකයෙකු වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ හා එහි අනුබද්ධ ආයතනයන් තුළ ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ජාත්‍යන්තර වගකීම් ඉටු කිරීම් පිළිබඳ කටයුතු මෙම වගකීම් සම්භාරයට ඇතුළත් වේ.

### ගැටුම්වලට පසුව අවධියේ සංවර්ධන කටයුතුවලට අදාළ කරුණු

පසුගිය වර්ෂ කිහිපය තුළදී අංශයේ අවධානය ප්‍රධාන වශයෙන් යොමු වී තිබුණේ ගැටුම්වලින් පසු අවධියේ දී ශ්‍රී ලංකාවේ සිදු වූ සංවර්ධනය කෙරෙහිය. 2009 මැයි මාසයේදී ගැටුම් අවසාන වීමෙන් පසුව මෙම කාරණය කෙරෙහි ජාත්‍යන්තර අවධානය ද යොමු විය. ගැටුම්වලින් පසු අවධියේ දී ජාත්‍යන්තර ප්‍රජාව විසින් නගනු ලබන විවිධ විමසීම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරකම්වලදී ක්‍රමෝපක්‍රම යොදවා, විශේෂයෙන්ම ජාත්‍යන්තර ප්‍රජාවගෙන් ශ්‍රී ලංකාවට අහිතකර බලපෑම් සිදුවීමේ අවස්ථා වැළැක්වීමේ වගකීම මෙම අංශයට පැවරී තිබේ. මේ තත්ත්වය යටතේ අදාළ තොරතුරු රැස් කොට එම තොරතුරු ජිනීවා හි, මානව හිමිකම් කවුන්සිලය, එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල්, ජාත්‍යන්තර සිවිල් සමාජ නියෝජිතයින් වෙත මෙන්ම ජාත්‍යන්තර මාධ්‍යයට යැවීමෙහි ලා කටයුතු මෙම අංශය විසින් කරනු ලැබේ. මේ රටේ මානව හිමිකම්වලට අදාළ ප්‍රශ්න පිළිබඳ තත්ත්වය තමන් අක්ත ගන්වා ඇති අගනගරවලට දැනුම්දීම පිණිස එම තොරතුරු අඩංගු දෑ ශ්‍රී ලංකා දූත මණ්ඩලය වෙත යවනු ලැබේ. ගැටුම්වලට පසු අවධියේ ශ්‍රී ලංකාවේ සිදු වී ඇති සංවර්ධනය සහ ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය පිළිබඳ තත්ත්වය අලලා රාජ්‍යතාන්ත්‍රික ප්‍රජාව, ශ්‍රී ලංකාව පදනම් කර ගෙන සිටින දේශීය හා ජාත්‍යන්තර මාධ්‍ය සඳහා තොරතුරු ගරු විදේශ කටයුතු අමාත්‍යතුමන් විසින් පිළියෙල කර දී තිබේ.

### එක්සත් ජාතීන්ගේ මහා සභාවේ කටයුතුවලට සහභාගී වීම.

2013 සැප්තැම්බර් මාසයේදී නිව් යෝර්ක් හි දී ආරම්භ වූ එක්සත් ජාතීන්ගේ මහා සභාවේ 68 වන සැසිවාරයට සහභාගී වීම පිළිබඳ ප්‍රාරම්භක කටයුතු මෙම අංශය මඟින් සංවිධානය කරන ලදී. මෙම සැසිවාරයේ ඉහළම කොටසෙහි ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායම මෙහෙයවන ලද්දේ අතිගරු ජනාධිපතිතුමන් විසිනි. විදේශ කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය මහාචාර්ය ජී.එල්. පීරිස්, වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණය පිළිබඳ ගරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා, තරුණ කටයුතු හා කුසලතා සංවර්ධනය පිළිබඳ ගරු අමාත්‍ය ඩලස් අලහප්පෙරුම, විදේශ කටයුතු අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රී සජින් ද වාස් ගුණවර්ධන, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ලොහාන් රත්වත්ත, ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග යන මහත්වරුන්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා නිව් යෝර්ක් හි එක්සත් ජාතීන්ගේ නිත්‍ය දූත මණ්ඩලයේ සාමාජිකයින් ශ්‍රී ලංකා දූත මණ්ඩලයේ සෙසු සාමජිකයෝ වූහ. ධරණීය සංවර්ධනය තේමා කරගෙන ජනාධිපතතුමා එක්සත් ජාතීන්ගේ මහා සභාව සහ ඉහළ මට්ටමේ දේශපාලන සංසඳය ඇමතීය. එක්සත් ජාතීන්ගේ මහා සභාවේ 68 වැනි සැසිවාරය අතරවාරයේ අතිගරු ජනාධිපතිතුමා, එක්සත් ජාතීන්ගේ මහා ලේකම්, නයිජීරියාවේ ජනාධිපති, කුවේට් හි ආණ්ඩුප්‍රධානියා, කටාර් රාජ්‍යයේ අග්‍රාමාත්‍යවරයා, සයිප්‍රස් ජනාධිපති, පකිස්තානයේ අග්‍රාමාත්‍යවරයා, නවසීලන්තයේ අග්‍රාමාත්‍යවරයා, කෙන්යා ජනරජයේ ජනාධිපති, මොසැම්බික් ජනරජයේ ජනාධිපති සහ ඝානාවේ ජනාධිපතිනිය යන අය සමඟ ද්විපාර්ශ්වික රැස්වීම් පැවැත්වීය.

ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා සහස්‍ර සංවර්ධන ඉලක්කවලට අදාළ විශේෂ සිද්ධීන් අරභයා නියෝජිතයින් සියලු දෙනාම සහභාගී වන රැස්වීම්වලට න්‍යෂ්ටික නිරායුධ කිරීම පිළිබඳ ඉහළ මට්ටමේ රැස්වීමට, න්‍යෂ්ටික නිරායුධ කිරීම් පිළිබඳ ඉහළ මට්ටමේ රැස්වීමට G – 77 සහ චීනයේ ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යවරුන්ගේ 37 වැනි වාර්ෂික රැස්වීමට, නොබැඳි ව්‍යාපාරයේ අමාත්‍ය රැස්වීමට, සාර්ක් සංගමයේ අමාත්‍ය රැස්වීමට, ආසියා සහයෝගීතා සංවාදයේ විදේශ අමාත්‍යවරුන්ගේ උදේ ආහාර වේලාව තුළදී පවත්වන ලද රැස්වීමට සහ G – 15 අමාත්‍යවරුන්ගේ රැස්වීමට සහභාගී විය. එක්සත් ජාතීන්ගේ මහා සභා රැස්වීමේ 68 වන සැසිවාරය අතරවාරයේ දී ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා පොදු රාජ්‍ය මණ්ඩලයේ මහ ලේකම්වරයා, ඉස්ලාමීය රටවල සංවිධානයේ (OIC) මහ ලේකම්වරයා, ජාත්‍යන්තර රතුකුරුස සංගමයේ සභාපතිවරයා, එක්සත් රාජධානියේ විදේශ හා පොදු රාජ්‍ය මණ්ඩල කටයුතු පිළිබඳ රාජ්‍ය ලේකම්වරයා සහ ඕස්ට්‍රේලියාව, ඉන්දුනීසියාව, එල් සැල්වදෝරය, සූඩානය, සිංගප්පූරුව, ගබෝන්, බංගලාදේශය, ඉරානය, ගිනියා සමූහාණ්ඩුව, බොට්ස්වානා, රුසියානු සමූහාණ්ඩුව යන රටවල විදේශ කටයුතු අමාත්‍යවරුන් සමඟ ද්විපාර්ශ්වික රැස්වීම්වලට සහභාගී විය.

නිව් යෝර්ක්හි නිත්‍ය දූත පිරිසේ සහාය ඇතිව මෙම සංචාරයේ කරුණු පැහැදිලි කිරීමේ දේශන, සැපයුම් කටයුතු ආදිය සම්බන්ධයෙන් සහභාගී වූවන් අතර සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මඟින් ඉටු කරන ලදී. කමිටු අවස්ථාවල සාකච්ඡා සඳහා ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සපයන ලද්දේ ද මෙම අංශය මඟිනි.

## මානව හිමිකම් කවුන්සිලයේ සැසිවාරවලට සහභාගී වීම.

මානව හිමිකම් කවුන්සියලයේ පිළිවෙලින් 2013 මාර්තු, ජූනි හා සැප්තැම්බර් මාසවලදී පවත්වන්නට යෙදුනු 22 වැනි, 23 වැනි හා 24 වැනි සැසිවාරවලදී ශ්‍රී ලංකා සහභාගීත්වය පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය කරන ලද්දේ මෙම අංශය මඟිනි. මෙහිදී අදාළ අමාත්‍යාංශවල සහ ආයතනවල සම්බන්ධීකරණයෙන් ද්‍රව්‍ය හා වෙනත් සම්පත් ආදිය ලබාදීමෙන් මෙම අංශය මඟින් දායකත්වය සපයන ලදී.

කවුන්සිලයේ 22 වැනි සැසිවාරයේ දී ඇමරිකා එක්සත් ජනපදය විසින් ශ්‍රී ලංකාවට එරෙහිව ඉදිරිපත් කරන ලද යෝජනාව (22/1 යෝජනාව) සම්බන්ධයෙන් කටයුතු කිරීමේ උපාය මාර්ග සකස් කිරීමේ කටයුතු මෙම අංශය මඟින් සිදු කරන ලදී. සැසිවාරය දක්වා කාලය තුළ හා සැසිවාරය තුළ දී මෙම කාර්යය සඳහා සහයෝගය ඉල්ලා සිටීමේ කටයුතු සිදු කරන ලද්දේ මෙම අංශය මඟිනි. අවසාන ප්‍රතිඵලය අනුව මානව හිමිකම් කවුන්සලයේ සාමාජික රටවල් 47 අතුරින් රටවල් 13ක් යෝජනාවට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් ශ්‍රී ලංකාවට සහාය පළ කළහ. රටවල් 8ක් ඡන්දය පාවිච්චි කිරීමෙන් වැලකී සිටි අතර රටවල් 25ක් ඡන්දය ප්‍රකාශ කළේ යෝජනාවට පක්ෂව ය.

අනෙකුත් කටයුතු අතර අදාළ රේඛීය නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකරමින්, කරුණු සකසමින්, අන්තර් ක්‍රියා සඳහා පහසුකම් සළසමින් සහ තෝරාගත් රටවලට අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ නියෝජිතයන් යවමින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 25 වන සැසිවාරය සඳහා කටයුතු සූදානම් කරන ලදී.

### මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරියගේ ශ්‍රී ලංකා සංචාරය

මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලත්, මානව හිමිකම් යාන්ත්‍රණයත් සමඟ නොකඩවා කටයුතු කරන ශ්‍රී ලංකාව ඒ අතරවාරයේදී, එනම් 2011 අප්‍රේල් මාසයේදී එම කොමිෂන් සභාවේ මහ ලේකම් නවනීදන් පිල්ලේ මහත්මියට ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වන ලෙස ආරාධනය කරන ලද අතර 2013 අගෝස්තු 26 දින සිට 31 වන දින දක්වා කාලය තුළ එම සංචාරයේ නිරත වීටම ඇය කැමැත්ත පළ කළාය.

මෙම දින හතේ සංචාරයේදී ඇය අතිගරු ජනාධිපතිතුමා සමඟ සුහද හමුවකට සහභාගී වූ අතර විදේශ කටයුතු අමාත්‍යවරයා, අධිකරණ අමාත්‍යවරයා, ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා, ජාතික භාෂා සහ සමාජ ඒකාග්‍රතාව පිළිබඳ අමාත්‍යවරයා, තරුණ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා සහ මානව හිමිකම් පිළිබඳ ජනාධිපතිතුමාගේ විශේෂ නියෝජිතයා ද වූ වැවිලි කර්මාන්ත ඇමතිවරයා ඇතුළු රජයේ ජොෂ්ඨ සාමාජිකයින් සමඟ සාකච්ඡා පැවැත්විය.

මීට අමතරව ආරක්ෂක ලේකම් අග්‍රවිශ්වයකාරවරයා, නීතිපතිවරයා, පාර්ලිමේන්තුවේ සභානායකවරයා සහ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ කටයුතු මෙහෙය වීම සඳහා වූ කාර්ය බලකායේ ප්‍රධානියා වශයෙන් ජනාධිපතිතුමන් විසින් පත් කරනු ලැබූ නිලධාරියා ද වන ජනාධිපති ලේකම්වරයා යන අය සමඟ ඇය හමුවීම් පැවැත්වූවාය.

මෙම සංචාරයේ දී ශ්‍රී ලංකාවේ සෑම ස්ථානයකටම අවහිරතාවයෙන් තොරව ප්‍රවේශවීම් රජය මඟින් ඇයට අවකාශ සලසා දුන් අතර එය ඇගේ ප්‍රශංසාවට ලක්විය. ශ්‍රී ලංකාව ලබා ඇති බහු ආංශික ප්‍රගතිය කෙළින්ම දැක බලා ගෙන නිශ්චයකට එළඹීමට මෙයින් මහ කොමසාරිස්වරියට අවස්ථාව සැලසුණි.

### එක්සත් ජාතීන්ගේ ගිවිසුම් මණ්ඩල වෙත සහ එක්සත් ජාතීන්ගේ වෙනත් යාන්ත්‍රණයන් වෙත වාර්තා සැපයීම සඳහා ශ්‍රී ලංකාවට පැවරී ඇති වගකීම.

### විශ්ව වාර සමාලෝචනය

2012 නොවැම්බර් 01 වැනි දින පවත්වන ලද විශ්ව වාර සමාලෝචනයේ දෙවැනි වටයේදී ශ්‍රී ලංකාවට නිර්දේශ 204ක් ලැබුණි. මෙම නිර්දේශ අතුරින් 113කට ශ්‍රී ලංකාවේ සහයෝගය ලැබෙන අතර නිර්දේශ 91ක් ප්‍රතික්ෂේප විය. මෙයට අමතරව වගකීම් 19ක් ඉටු කිරීමට ශ්‍රී ලංකාව ස්වේච්ඡාවෙන් භාර ගත්තාය. මානව හිමිකම් කවුන්සිලයේ 22 වැනි සැසිය පැවැත්වුණ කාලයේදී, එනම් 2013 මාර්තු මාසයේදී මානව හිමිකම් කවුන්සිලය මඟින් ශ්‍රී ලංකාවේ විශ්ව වාර සමාලෝචන වාර්තාව පිළිගන්නා ලදී.

රැස්වීම් සමාලෝචන අවස්ථාවේදී රටේ මානව හිමිකම් පිළිබඳ සමස්ත තත්ත්වය ඉදිරිපත් කරන ලදී. විශ්ව වාර සමාලෝචනයේ 2 වැනි වටයට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකාව විසින් ඉටු කළ යුතු වැඩ කොටස පිළිබඳ වගකීම, විශේෂයෙන්ම ජාතික මානව හිමිකම් පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම (NHRAP) සහ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ (LLRC) වාර්තාව ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගතිය වාර්තා කිරීමේ වගකීම අතිගරු ජනාධිපතිතුමාගේ මානව හිමිකම් පිළිබඳ විශේෂ නියෝජිත ගරු මහින්ද සමරසිංහ මැතිතුමාට පවරන ලදී.

## වදහිංසාවලට එරෙහි කමිටුව (CAT)

ශ්‍රී ලංකාව පිළිබඳව පළමු 3 වැනි හා 4 වැනි ඒකාබද්ධ වාර වාර්තා සැලකිල්ලට ගනිමින් වද හිංසා වැළැක්වීමේ කමිටුවේ අවසාන නිරීක්ෂණවලට ශ්‍රී ලංකාවේ ප්‍රතිචාර දැක්වීම සඳහා කරන කටයුතු මෙම අංශය මඟින් සම්බන්ධීකරණය කරන ලදී. 2015 නොවැම්බර් 25 වැනිදාට පෙර වද හිංසා වැළැක්වීමේ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට නියමිත ශ්‍රී ලංකාවේ 5 වැනි වාර වාර්තාව සම්බන්ධයෙන් කරනු ලබන කටයුතු ද මෙම අංශය මඟින් සම්බන්ධීකරණය කරනු ලැබේ.

## කාන්තාවන්ට වෙනස් කොට සැලකීමට එරෙහි ජාත්‍යන්තර සම්මුතිය (CADEW)

කාන්තාවන්ට වෙනස් කොට සැලකීමට එරෙහිව ජාත්‍යන්තර සම්මුතිය වෙත ඉදිරිපත්කරන ලද ශ්‍රී ලංකාවේ වාර වාර්තාව පිළිබඳ නිරීක්ෂණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රතිචාර මෙම අංශය මඟින් 2013 සැප්තැම්බර් මාසයේදී ඉදිරිපත් කරන ලදී.

## ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය

ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ කමිටුව වෙත ශ්‍රී ලංකාවේ 5 වැනි වාර වාර්තාව ඉදිරිපත් කිරීම වස් අවශ්‍ය තොරතුරු සම්පාදනය කර ගැනීම සඳහා මෙම අංශය මඟින් අන්තර් අමාත්‍යාංශ රැස්වීම් දෙකක් පවත්වන ලදී. පළමු වන ප්‍රතිචාර කෙටුම්පත සම්පාදනය කර ඇති අතර ඒ පිළිබඳව කටයුතු කර ගෙන යනු ලැබේ.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශේෂ කාර්ය පරිපාටිවලට අනුකූලව ශ්‍රී ලංකාව කරන අන්‍යෝන්‍ය ක්‍රියාකාරකම් සමායෝජනය කිරීම පිළිබඳ කටයුතු මෙම අංශය මඟින් කරනු ලැබේ.

## විශේෂ වරම් ලැබූවන්

බලහත්කාරයෙන් හෝ සිය කැමැත්තෙන් තොරව අතුරුදහන් වූවන් පිළිබඳ කාරක කණ්ඩායම මඟින් අවධානයට ලක් කරන ලද පරිදි අතුරුදහන් වූයේ යැයි කියන පුද්ගලයන් 463 දෙනෙකු සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශ්වකරුවන්ගෙන් විමසා ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව දක්වන ප්‍රතිචාර සටහන් මෙම අංශය මඟින් සකස් කරනු ලදුව ඉදිරිපත්කරන ලදී.

බලහත්කාරයෙන් හෝ සිය කැමැත්තෙන් තොරව අතුරුදහන් වූවන් පිළිබඳ කාරක කණ්ඩායම මඟින් ශ්‍රී ලංකාණ්ඩුවේ අවධානයට ලක් කරන ලද අතුරුදහන්වූයේ යැයි කියන පුද්ගලයින් සම්බන්ධයෙන් දක්වන ප්‍රතිචාර පිළිබඳ කටයුතු අදාළ නියෝජිතායතනවලින් හා අමාත්‍යාංශවලින් විමසා මෙම අංශය මඟින් කරගෙන යනු ලැබේ.

ශ්‍රී ලංකාවේ සංචාරය කරන ලෙස විශේෂ වරම් ලැබූ පහත සඳහන් කණ්ඩායම්වලට ශ්‍රී ලංකාවෙන් ඇරයුම් ලැබී තිබේ.

(අ) අභ්‍යන්තරව අවතැන්වූවන් පිළිබඳ විශේෂ වාර්තාකරුවන්, 2013 දෙසැම්බර් 02 – 09
(ආ) අධ්‍යාපනය පිළිබඳ විශේෂ වාර්තාකරුවන්, 2014 ජනවාරි 15 – 31

**අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයන්ගේ මානව හිමිකම් පිළිබඳ විශේෂ වාර්තාකරුගේ පැමිණීම**

අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයන්ගේ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු, ආචාර්ය චාලෝකා බෙයනි මහතාගේ 2013 දෙසැම්බර් මස 2 සිට 6 දක්වා වූ ශ්‍රී ලංකා සංචාරය මෙම අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී. විශේෂ වාර්තාකරු ආචාර්ය බෙයනි මහතා, අමාත්‍යවරු/නිලධාරීන්/දේශපාලන නායකයන් සමඟ සාකච්ඡා පවත්වන ලද අතර, උතුරු පළාතේ ක්ෂේත්‍ර චාරිකාවකද නිරත විය.

## මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

එක්සත් ජාතීන්ගේ සංගමයේ මානව හිමිකම් අංශයේ ආසියා, ශාන්තිකර, මැදපෙරදිග සහ උතුරු අප්‍රිකා ශාඛා ප්‍රධානී හානි මෙගල්ලි මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් නිලධාරී කණ්ඩායමක් 2012 සැප්තැම්බර් 14 – 21 දිනවල ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූහ. මෙම පිරිස පැමිණියේ ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වන ලෙස 2011 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ඇරයුම් ලැබ සිටි මානව හිමිකම් මහ කොමසාරිස්වරියගේ සංචාරයට පෙරගාමී වශයෙනි. මෙම සංචාරයේ නිරත වූ දූත පිරිස ශ්‍රී ලංකාණ්ඩුවේ නියෝජිතයින්, රාජ්‍යතාන්ත්‍රික ප්‍රජාවගේ සහ සිවිල් සමාජයේ සාමාජිකයින් ඇතුළු උනන්දුවක් දක්වන පාර්ශ්වකරුවන් විශාල පිරිසක් හමු වූහ. මෙයට අමතරව උතුරු පළාතේ යාපනය, කිලිනොච්චිය, මුලතිව් සහ වව්නියා යන ප්‍රදේශවල සංචාරය කළ මෙම පිරිස එම ප්‍රදේශවල නොයෙකුත් තරාතිරමේ පාර්ශ්වකරුවන් හමුවී කතාබහ කළහ. මෙම සංචාරක වැඩසටහන නිමාවට පත් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංගමයේ අදාළ නිලධාරීන්ගේ කටයුතු සමායෝජනය කළ එක්සත් ජාතීන්ගේ අංශය එමඟින් එම පිරිසට පහසුකම් සලසා දෙන ලදී.

## වැදගත් වන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ තත්ත්වය බහු අංශීය සංසදවලට පැහැදිලිව ප්‍රකාශ කිරීම.

දේශගුණික විපර්යාස, තිරසාර සංවර්ධනය හා නිරායුධ කිරීම වැනි වැදගත් වන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ තත්ත්වය බහු ආංශීය සංසදවලට පැහැදිලිව ප්‍රකාශ කිරීම සඳහා සහභාගී වූ පාර්ශ්වකරුවන් සමඟ මෙම අංශය විසින් රැස්වීම් පවත්වන ලදී. තනතුරු සඳහා අපේක්ෂකත්වය ඉදිරිපත් කොට ඇති අවස්ථාවලදී, යෝජනාවලදී හා වෙනත් ජාතික වැදගත්කමින් යුත් ප්‍රශ්නවලදී අන්‍යෝන්‍ය වශයෙන් පක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් හා වෙනත් ආකාරයේ සහයෝගය ලබා දීමෙන් ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ වෙනත් සාමාජික රටවල් සමඟ සම්බන්ධකම් පවත්වාගෙන යන්නීය.

## එක්සත් ජාතීන්ගේ සාම සාධක කටයුතුවදී ශ්‍රී ලංකාවේ දායකත්වය ලබා දීම.

එක්සත් ජාතීන්ගේ සාම සාධක කටයුතුවලදී ධජ රැගත් නෞකා ව්‍යාපාරයට ශ්‍රී ලංකාව දිගින් දිගටම සහාය ලබා දුන්නාය. මෙම අංශය, ආරක්ෂක අංශයත්, පොලිස් දෙපාර්තමේන්තුවත්, ත්‍රිවිධ හමුදාවත් සමඟ මෙන්ම නිව් යෝර්ක් හි එක්සත් ජාතීන් සඳහා නිත්‍ය නියෝජිත කාර්යාලය සමඟ කටයුතු සමායෝජනය කරයි. එසේ කරන්නේ ශ්‍රී ලංකාවේ සහභාගීත්වය තහවුරු කර ගැනීමටත් භට කණ්ඩායම් යෙදවීමේ කටයුතු පහසුකර ගැනීමත් සඳහාය. හයිටි, ඉරාකය, චැඩ්, මධ්‍යම අප්‍රිකා ජනරජය, ටිමෝරය, සූඩානය, දකුණු සූඩානය, කොන්ගෝ, බටහිර සහරාව, ලෙබනනය, ලයිබීරියාව, කොටේඩිමොරි, සෝමාලියාව, බෙරුන්ඩි, සියරා ලියෝන්, ඉතියෝපියාව, සයිප්‍රස්, ගිනියාව, කොසෝවෝ, බ්‍රින්ඩිසි (ඉතාලිය), මාලි (මිනුස්මා) සහ මොන්ගෝලියාව යන රටවලට ශ්‍රී ලංකා බට සේනා යවා ඇත.

## බහු පාර්ශ්වීය සංසඳවලදී ශ්‍රී ලංකාවේ නියෝජනයන්

මෙම අංශය පරිසරිය, නිරායුධකරණය සහ සෞඛ්‍යය හා සම්බන්ධ එක්සත් ජාතීන්ගේ සමුළු සඳහා සහභාගී වූ නියෝජිත කණ්ඩායමේ නියෝජනය කර තිබෙන අතර අදාළ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වන ගෝලීය ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් මේවා පිළිබඳව ශ්‍රී ලංකාවේ ස්ථාවරය සැකසීමෙහි ලා ජාතික කේන්ද්‍රස්ථානවලට සහාය ලබා දී ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කරන ලද ජාත්‍යන්තර තරුණ වර්ෂය වෙනුවෙන් යෞවන කටයුතු අමාත්‍යාංශයට මෙම අංශය පහසුකම් සැලසීමෙන් සහාය ලබා දී තිබේ. මීට අමතරව, 2014 මැයි මස 06 සිට 10 දක්වාශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිත යෞවන යෞවනියන් පිළිබඳ ලෝක සමුළුව සම්බන්ධයෙන් සිදු කරන පෙර සූදානම් කටයුතුවලදී නිව් යෝර්ක් හි පිහිටි එක්සත් ජාතීන් සඳහා නිත්‍ය නියෝජිත කාර්යාලය සමඟ සාකච්ඡා කිරීමෙන් යෞවන කටයුතු හා නිපුණතා ප්‍රවර්ධන අමාත්‍යාංශයට මෙම අංශය සහාය ලබා දෙමින් සිටී. දූෂණයට එරෙහිව එක්සත් ජාතීන්ගේ සම්මුතිය යටතේ සිදු කරන බාහිර කටයුතු පිළිබඳව සමාලෝචනය සඳහා පහසුකම් සැලසීමෙහිලා අදාළ රේඛීය අමාත්‍යාංශවලටද මෙම අංශය සහාය ලබා දෙයි. විවිධ ජාත්‍යන්තර රැස්වීම්, සමුළු, වැඩමුළු නියෝජනයන් සිදු කරන වෙනත් අමාත්‍යාංශ/ කේන්ද්‍රස්ථාන මඟින් ලබාදෙන සහභාගීත්වයන් සඳහා මෙම අංශය පහසුකම් සලසා තිබේ. මේ සම්බන්ධයෙන්, මෙම අංශය, පසුගිය වසර තුළදී මෙම නියෝජිත කණ්ඩායම් වෙත නිර්දේශ ලිපි 27ක් නිකුත් කොට තිබේ.

## <u>බහුපාර්ශ්වීය සම්බන්ධතා සන්දර්භය තුළ ශ්‍රී ලංකාව විසින් සත්කාරකත්වය දැරූ වැදගත් ඉසව්</u>

මෙම අංශය මඟින් වෙනත් කටයුතු අතර, 2013 නොවැම්බර් 10 සිට 17 දක්වා පැවති පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීමට සැළකිය යුතු මට්ටමකින් දායකත්වය ලබාදුන්නේය.

## එක්සත් ජාතීන්ගේ හා සම්බන්ධ ආයතනවල ඡන්ද විමසීම්

එක්සත් ජාතීන්ගේ සංවිධානය හා සම්බන්ධ ආයතනවල ඡන්ද විමසීම් පිළිබඳව පහත සඳහන් ක්‍රියාකාරකම් මෙම අංශය ඉටු කොට තිබේ.

- එක්සත් ජාතීන්ගේ සංවිධානය ආශ්‍රිත ආයතනවල සියලුම ඡන්ද විමසීම් සම්බන්ධයෙන් දූත මණ්ඩලවලට උපදෙස් ලබා දීම.

- එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ සිදු කරන ඡන්ද විමසීම්/ තනතුරු පිළිබඳ තීරණ ගැනීමේදී අදාළ අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- එක්සත් ජාතීන්ගේ ආයතනවල ඡන්ද විමසීම්වලදී ශ්‍රී ලංකාව ඡන්දය ලබා දෙන ආකාරය පිළිබඳ දත්ත පාදකයන් පවත්වාගෙන යාම.

### සමුළු සහ වීසා බලපත්

සමාලෝචනයට බඳුන් කළ කාල සීමාව තුළදී, ශ්‍රී ලංකාවේ පැවැත්වෙන විවිධ ජාත්‍යන්තර සමුළුවලට සහ රැස්වීම්වලට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන් සඳහා වීසා බලපත් 1200ක් ලබා දීම සඳහා එක්සත් ජාතීන්ගේ හා බහු පාර්ශ්වීය අංශය සහාය ලබා දී තිබේ. ශ්‍රී ලංකාවේ පිහිටි එක්සත් ජාතීන්ගේ දූත මණ්ඩල සඳහා පත් කරන ලද විදේශීය කාර්ය මණ්ඩලය සඳහා වීසා බලපත් ලබා ගැනීම සඳහා මෙම අංශය නිරීක්ෂණ/ අනුමැති ලබා දී තිබේ. ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් වීසා බලපත් නිකුත් කිරීමේ ක්‍රියාවලියට එක්සත් ජාතීන්ගේ සංවිධානය/ වෙනත් ජාත්‍යන්තර සංවිධාන සමඟ සම්බන්ධීකරණ කටයුතු විශාල ප්‍රමාණයක් කිරීමට සිදුවෙයි. මෙම සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම ද මෙම අංශය ඉටු කරන සාමාන්‍ය රාජකාරි අතර වෙයි.

### රාජ්‍යනොවන සංවිධාන ලියාපදිංචි කිරීම

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපනය කර ඇති රාජ්‍ය නොවන අංශය සඳහා මධ්‍යස්ථානයෙන් (CNGS) සහ රාජ්‍ය නොවන සංවිධාන සඳහා ජාතික ලේකම් කාර්යාලයෙන් රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත් මෙම අංශය වෙත ලැබෙයි.

අදාළ රාජ්‍ය නොවන සංවිධානයට විදේශ අරමුදල් සංරචකයන් ඇති විට එම රාජ්‍ය නොවන සංවිධාන ශ්‍රී ලංකාවේ ලියා පදිංචි කිරීම හා අදාළ වන කරුණු පිළිබඳව නිරීක්ෂණ මෙම අංශය මඟින් ලබා දෙනු ලැබේ.

### එක්සත් ජාතීන්ගේ පුරප්පාඩු හා දායකත්වය

මෙම අංශය එක්සත් ජාතීන් හා සම්බන්ධ ආයතනවල පවත්නා විවිධ පුරප්පාඩු සම්බන්ධයෙන් තොරතුරු ලද විටදී එම තොරතුරු අදාළ රේඛීය අමාත්‍යාංශ හා ආයතනවලට යොමු කරයි. එක්සත් ජාතීන්ගේ ආයතනවල ශ්‍රී ලංකාවේ සාමාජිකත්වය වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන වෙත ගෙවිය යුතු මුදල් පිළිබඳව අදාළ අමාත්‍යාංශය සහ ආයතන සමඟ කටයුතු සම්බන්ධීකරණ කරනුයේද මෙම අංශයයි.

# ආර්ථික කටයුතු අංශය

## ආර්ථික කටයුතු අංශය

ආර්ථික කටයුතු අංශය, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ද්විපාර්ශ්වික හා බහු පාර්ශ්වික ආර්ථික හා වෙළඳ කටයුතු සිදු කරන කේන්ද්‍රස්ථානය වෙයි. මීට අමතරව, රේඛීය නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව මෙම අංශය, වෙළඳ ප්‍රදර්ශන, සමුළු, වැඩමුළු වැනි ජාතික හා ජාත්‍යන්තර කටයුතු සංවිධානයෙහි ලා පහසුකම් සලස්වයි. පෙබරවාරි මසට යෙදෙන නිදහස් දිනයට සමගාමීව වාර්ෂිකව පවත්වනු ලබන දැයට කිරුළ ප්‍රදර්ශනය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය සමඟ කටයුතු කරන මෙම අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වනුයේද ආර්ථික කටයුතු අංශයයි.

2013 වසරේදී, මෙම අංශය වෙත විශේෂ කාර්යභාරයක් පවරන ලදී. එනම් පොදු රාජ්‍ය මණ්ඩලයීය ව්‍යාපාරික සංසදයේ (CBF)කටයුතු සම්බන්ධයෙන් පොදු රාජ්‍ය මණ්ඩලයීය ව්‍යාපාරික මණ්ඩලය (CBF) සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමයි. ව්‍යාපාරික ඉඩප්‍රස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් හා අයත් නොවන රටවල ව්‍යාපාරික ප්‍රජාවන් හමුවන වේදිකාව වනුයේ මෙයයි.

මෙම අංශය, බහු පාර්ශ්වීය ආර්ථික සහයෝගීතාව යටතේ, ක්ෂේත්‍ර විශාල සංඛ්‍යාවක් හා සම්බන්ධයෙන් ජාත්‍යන්තර සංවිධාන සමඟ නිරන්තරයෙන් සම්බන්ධීකරණ කටයුතු සිදු කරයි. ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ඉන්දියානු සාගර ටූනා මත්ස්‍ය කොමිෂන් සභාව (IOTC), ලෝක වෙළඳ සංවිධානය (WTO), වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සහයෝගීතාව (UNCTAD) සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) යන සංවිධාන මෙම අංශයේ විෂය පථය යටතේ එන වෙළඳාම හා සම්බන්ධ ජාත්‍යන්තර සංවිධාන අතර වෙයි. මීට අමතරව, 15 කණ්ඩායම (G-15), 11 කණ්ඩායම (G-11), 77 කණ්ඩායම (G-77), ආසියා සහයෝගීතා සංවාදය (ACD), ආසියා හා ෆැසිෆික් සඳහා ආර්ථික සහ සමාජයීය කොමිෂන් සභාව (ESCAP), බහු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව සඳහා බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල සංවිධානය (BIMSTEC),කලාපීය සහයෝගීතාව සඳහා ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (IOR-ARC) ඇතුළු බහුපාර්ශ්වීය සංවිධාන සහ අදාළ රේඛීය නියෝජිතායතන අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කරනුයේද මෙම අංශයයි.

ආර්ථික ආරක්ෂක ගැටලු සඳහා විසඳුම් සෙවීමේදී, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සහ වෙනත් සංවිධානවල සංක්‍රමණික හා සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් මෙම අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකාව, විදේශීය රටවල සේවය කරන ශ්‍රී ලාංකික ප්‍රජාව විසින් උපයනු ලබන ආදායම මත විශාල වශයෙන් යැපෙන රටක් වන හෙයින් මෙය සුවිශේෂී වෙයි. මෙම අංශය, ජාතික ආර්ථිකය සඳහා විශාල විදේශ විනිමය ප්‍රමාණයක් උපයා දීමට විදේශ රැකියා ඉඩප්‍රස්ථා ප්‍රමාණය වැඩි කිරීමට සහ මිනිස් බල ගිවිසුම් සඳහා පහසුකම් සලසමින් විදේශීය රටවල සේවය කරන ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන මට්ටම් ඉහළ දැමීමට පියවර ගැනීම සඳහා විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරයි.

## ද්විපාර්ශ්වික සබඳතා

ද්විපාර්ශ්වික වෙළඳ සබඳතා හා සම්බන්ධ කාර්ය කටයුතු ආර්ථික කටයුතු අංශයට පැවරී තිබේ. 2013 වසර තුළ දී ආර්ථික කටයුතු අංශය, විදේශ රටවල පැවති ශ්‍රී ලාංකික ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වූ වෙළඳ නියෝජිත කණ්ඩායම් රැසකට පහසුකම් සැලසීය. එමෙන්ම, ශ්‍රී ලංකාවට පැමිණි විදේශීය වෙළඳ නියෝජිත කණ්ඩායම්වල ශ්‍රී ලංකා සංචාර සම්බන්ධයෙන් ද මෙම අංශය සම්බන්ධීකරණ කටයුතු සිදු කළේය. සැලකිල්ලට බඳුන්වන මාස 09 තුළදී පහත සඳහන් වෙළඳ නියෝජිත කණ්ඩායම් ශ්‍රී ලාංකික ප්‍රවර්ධන වැඩසටහන් පවත්වා තිබේ.

01. 2013 ජූනි 24 දින සිට ජූලි 01 දක්වා දිනවලදී අතිගරු ජනාධිපතිතුමා සමඟ වෙළඳ නියෝජිත කණ්ඩායමක් සීෂෙල්ස් හි සංචාරයක නියැලුණහ.

02. 2013 අගෝස්තු 04- 06 දිනවලදී විදේශ කටයුතු අධීක්ෂණ මන්ත්‍රී ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා විසින් ප්‍රධානත්වය දරන ලද විශේෂ වෙළඳ නියෝජිත පිරිසක් සීෂෙල්ස් හි සංචාරයක නියැලිණ. මෙම සංචාරයෙන් අනතුරුව, සීෂෙල්ස් හි වික්ටෝරියා හි දී ලංකා බැංකු ශාඛාවක් සහ රක්ෂණ සමාගම් ශාඛාවක් විවෘත කිරීමට තීරණය කරන ලදී.

03. ආයෝජන මණ්ඩලය සහ සංචාරක මණ්ඩලය ඇතුළත් වූ වෙළඳ නියෝජිත කණ්ඩායමක් අතිගරු ජනාධිපතිතුමා සමඟ බෙලාරුස් හි සංචාරයක නියැලිණි. මෙම සංචාරය අතරතුරදී මෙම නියෝජිත කණ්ඩායම මින්ක් හි පැවති ව්‍යාපාරික සංසදයට සහභාගී වූ අතර ආයෝජන සඳහා ශ්‍රී ලංකාවේ ඇති ඉඩප්‍රස්ථා හුවා දක්වමින් බෙලාරුස් ව්‍යාපාරික ප්‍රජාව වෙත කරුණු ඉදිරිපත් කිරීම් කළේය.

පහතසඳහන්ව්‍යාපාරිකනියෝජිතකණ්ඩායම්ශ්‍රී ලංකාවේසංචාරයකළඅතරඑහිදීඅදාළරේඛීයනියෝජිතායතනසමඟසම්බන්ධීකරණකටයුතු සිදු කිරීම තුළින් ආර්ථික කටයුතු අංශය ඊට සහාය දැක්විය.

(අ) 2013 අගෝස්තු 25 – 31 දිනවලදී, ඊශ්‍රායලයේ වෙළඳ නියෝජිත කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලුණේය. මෙම අමාත්‍යාංශය ඔවුන් සඳහා සංසදයක් සහ සුප්‍රසිද්ධ ව්‍යාපාරික ව්‍යවසායකයන් වෙත කළ ක්ෂේත්‍ර චාරිකා සංවිධානයෙහි ලා අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කළේය.

(ආ) 2013 අගෝස්තු 08 – 14 කාලය තුළ දී බ්‍රසීල සහයෝගිතා නියෝජිතායතනයේ (ACB) විශේෂඥයින් කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. මෙම සංචාරය සංවිධානය කරන ලද්දේ බ්‍රසීල තාක්ෂණික සහාය වැඩසටහන යටතේය. සුළු භෝග ප්‍රවර්ධන හා කෘෂිකර්ම යන අමාත්‍යාංශවල සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහාය ඇතිව මෙම අංශය රැස්වීම් ගණනාවක් සංවිධානය කළේය. පැමිණි නියෝජිත පිරිස, ඩෙංගු තුරන් කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳව සහ සුළු භෝග සංවර්ධනය පිළිබඳව ශ්‍රී ලාංකික විශේෂඥයින් සමඟ මෙහිදී අදහස් හා මත හුවමාරු කර ගත්හ.

(ඇ) 2013 පෙබරවාරි 14 – 15 දිනවලදී එස්තෝනියාවේ විදේශ අමාත්‍ය ගරු අර්මස් පැයට් මහතා ව්‍යාපාරික නියෝජිත පිරිසක් සමඟ ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලුණේය. මෙම අංශය, ශ්‍රී ලංකාවේ ඇති අදාළ මණ්ඩල සමඟ සහ වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් රැස්වීම් සඳහා පහසුකම් සැලසීය.

## බහු පාර්ශ්වීය සබඳතා

බහු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව සඳහා බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල සංවිධානය (බිම්ස්ටෙක්), ශ්‍රී ලංකාව ඇතුළුව රටවල් 7කින් සමන්විත වන කලාපීය සංවිධානයකි. මෙම සංවිධානය ස්ථාපනය කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ, සාමාජික රටවල් අතර තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව ඇති කිරීම හා වැඩි දියුණු කිරීමයි. සමාලෝචනයට බඳුන් වන කාලය තුළ දී, පහත සඳහන් බිම්ස්ටෙක් රැස්වීම් ශ්‍රී ලංකාව විසින් පවත්වන ලදී. මෙම රැස්වීම් සංවිධානය කරන ලද්දේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය සහිතව රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසිනි.

01. 6 වැනි ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම (JWG)– 2013 මැයි 6 – 8 දක්වා කාලය තුළ දී පැවති ත්‍රස්තවාදය සහ දේශ සීමා ඉක්මවා සිදු කරන අපරාධ මැඩපැවත්වීම (CTTC), පිළිබඳ රැස්වීම සහ බුද්ධිමය තොරතුරු හුවමාරු කිරීම පිළිබඳ 3 වැනි උප කණ්ඩායම.

02. 2013 මැයි 6 වැනි දින පැවති බුද්ධි තොරතුරු හුවමාරු කිරීම පිළිබඳ උප කණ්ඩායමේ 3 වැනි රැස්වීම (SGIS), 2013 ජනවාරි 8 -9 දිනවලදී නව දිල්ලි නුවර පැවති 5 වැනි බිම්ස්ටෙක් ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම - ත්‍රස්තවාදය හා දේශ සීමා ඉක්මවා සිදු කරන අපරාධ මැඩපැවැත්වීම පිළිබඳ රැස්වීම (CTTC) සඳහා සහභාගී විය. මෙම සැසිවාරයේ දී සාපරාධී කටයුතු මැඩපැවැත්වීම සඳහා අන්‍යෝන්‍ය සහාය පිළිබඳ සම්මුතිය හා සම්බන්ධ සාකච්ඡා පැවැත්වූ අතර සම්මුතියේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

ආර්ථික කටයුතු අංශය විසින් ඉන්දියානු සාගර ආශ්‍රිතව දේශසීමා පිහිටි සාමාජික රටවල්වලින් සමන්විත වන සංවිධානයක් වන කලාපීය සහයෝගීතාව සඳහා ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය හා සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී. සමාලෝචනයට බඳුන්වන කාල සීමාව තුළදී, ශ්‍රී ලංකාව එම සංවිධානයයේ පහත සඳහන් රැස්වීම්වලට සහභාගී වී තිබේ.

01. 2013 ජූලි 4 – 5 දිනවලදී මුරුසියේ පැවති පළමු ආර්ථික හා ව්‍යාපාරික සමුළුව:
කර්මාන්ත හා වාණිජ අමාත්‍ය ගරු රිෂාඩ් බදියුදීන් මහතා, ව්‍යාපාරික නියෝජිත පිරිසක් ද සමඟ මෙයට සහභාගී විය.

02. අගෝස්තු 20 – 21 දිනවලදී මුරුසියේ දී පැවති ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ 3 වැනි අර්ධ වාර්ෂික කමිටුව:
අධ්‍යක්ෂ ජනරාල්/ ආර්ථික කටයුතු විසින් මෙහිදී විදේශ කටයුතු අමාත්‍යාංශය නියෝජනය කරන ලදී.

ආසියානුසහයෝගිතාසංවාදයයනුඅන්‍යෝන්‍යආර්ථිකසංවර්ධනවැඩිදියුණුකිරීමසඳහාමෙමමහද්වීපයේ රටවල්අතරවඩවඩාත්බැඳීම්ඇතිකරනආකාරයේසබඳතාවක්ගොඩනැගීමේඅරමුණින්ආසියානුරටවල් අතර ස්ථාපනය කරනු ලැබ ඇති සාමාජික රටවල් 31කින් සමන්විත සංසදයකි. ටජිකිස්ථානයේ දූෂාන්බේ හි පැවති 11 වැනි ආසියානු සහයෝගීතා සංවාදයට අයත් රටවල අමාත්‍යවරුන්ගේ රැස්වීමේදී, විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු නියෝමාල් පෙරේරා මහතා විසින් ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදි. නියෝජ්‍ය අමාත්‍යවරයා සමඟ ආර්ථික කටයුතු අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද මීට සහභාගි වූ අතර ශ්‍රී ලංකාවේ ස්ථාවරය ප්‍රක්ෂේපණය කිරීමේදී ඊට සහාය දැක්වීය.

## ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO)

ආර්ථික කටයුතු අංශය, ලෝක බුද්ධිමය දේපළ සංවිධානය සමඟ කටයුතු කරන ජාතික කේන්ද්‍රස්ථානයයි. ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ෆ්‍රැන්සිස් ගරී මහතා 2013 නොවැම්බරයේ ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිතය. මෙම අංශය විසින් ජිනීවා හි ශ්‍රී ලංකා දූත මණ්ඩලය හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය (MIPO) සමඟ එක්ව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මෙම සංචාරයේ වැදගත් අංග සංවිධානය කරනු ලබයි. අතිගරු ජනාධිපතිතුමා සහ ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා බැහැදැකීම සහ බුද්ධිමය දේපළ පිළිබඳ වැඩමුළුවක් ඇමතීම මේ අතර වෙයි. මීට අමතරව, ආර්ථික කටයුතු අංශය, ජිනීවා හි ශ්‍රී ලංකා දූත මණ්ඩලය සහ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සමඟ එක්ව ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ රැස්වීම්වලට ශ්‍රී ලාංකිකයන්ට සහභාගීවීම සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කර තිබේ. මෙම අංශය වෙනත් පාර්ශ්වකරුවන් සමඟ එක්ව් ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සම්බන්ධයෙන් පවත්නා ක්‍රමය වැඩි දියුණු කිරීමෙහි ලා සහාය වී තිබේ.

## 15 කණ්ඩායම (G-15)

ශ්‍රී ලංකාව වර්තමාන සභාපතිත්වය උසුලන 15 කණ්ඩායම සඳහා ජාතික කේන්ද්‍රස්ථානය වනුයේ ආර්ථික කටයුතු අංශයයි. ආර්ථික කටයුතු අංශය, ජනීවා හි හා නිව්යෝර්ක් හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ එක්ව, නිව්යෝර්ක් හි පැවති එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනයට සමගාමීව මෙම කණ්ඩායමේ 36 වැනි අමාත්‍ය මට්ටමේ රැස්වීම සඳහා කටයුතු සංවිධානය කළේය. ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා මෙම රැස්වීමේ මුලසුන හෙබවූ අතර මීළඟ සමුළුව අප රටේ පැවැත්වීමට ශ්‍රී ලංකාවේ ඇති කැමැත්ත මෙහිදී ප්‍රකාශ කර සිටියේය. 2014 දී 15 කණ්ඩායමේ මීළඟ රාජ්‍ය නායක සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වීම සඳහා අවශ්‍ය මූලික වැඩ කටයුතු සඳහා අවශ්‍ය වන සංවිධානාත්මක ක්‍රියාවලියෙ හි මෙම අංශය දැන් නිරතව සිටියි.

නායකවරු 17 දෙනෙකු ඒකරාශී කරන මෙම රාජ්‍ය නායක සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වීම ශ්‍රී ලාංකික ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් වනු ඇත. 2014 දී ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිත විශාලතම ජාත්‍යන්තර සමුළුව මෙය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## ආසියා හා පැසිෆික් කලාප සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජයීය කොමිෂන් සභාව (UNESCAP)

ආසියා හා පැසිෆික් කලාප සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජයීය කොමිෂන් සභාව හා සම්බන්ධ කටයුතු සඳහා අමාත්‍යාංශ කේන්ද්‍රස්ථානය වනුයේද ආර්ථික කටයුතු අංශයයි. මෙම කොමිෂන් සභාවේ 69 වැනි වාර්ෂික සැසිවාරය සඳහා සහභාගි වන නියෝජිත කණ්ඩායම හා සම්බන්ධ කටයුතු සහ ඒ සඳහා ජාතික ප්‍රතිපත්ති සැකසීමේ කටයුතුවල මෙම අංශය නියැලිණි. මීට අමතරව, මෙම කොමිෂන් සභාව සහ වෙනත් ජාතික කේන්ද්‍රස්ථාන අතර විශේෂයෙන් ශ්‍රී ලංකාව සාමාජිකයෙකු වන කමිටුවල පාලක මණ්ඩල තුනට අනුයුක්ත කොට ඇති ජාතික කේන්ද්‍රස්ථානය අතර සම්බන්ධීකාරකවරයා ලෙස මෙම අංශය කටයුතු කරයි. මෙම කමිටු තුන වනුයේ, සංඛ්‍යාලේඛන පිළිබඳ කමිටුව, තාක්ෂණ මාරු කිරීම සඳහා ආසියා පැසිෆික් මධ්‍යස්ථානය පිළිබඳ කමිටුව (APCTT) සහ ධරණීය කෘෂිකර්මය තුළින් දිළිඳුභාවය තුරන් කිරීම සඳහා මධ්‍යස්ථානය පිළිබඳ කමිටුවයි. මෙම

කොමිෂන් සභාව හා සම්බන්ධ රැස්වීම්, වැඩමුළු ආදිය සඳහා ශ්‍රී ලාංකික නියෝජිත පිරිසගේ සහභාගිත්වය සම්බන්ධීකරණය කරනුයේ ද මෙම අංශයයි.

" කොළඹ ක්‍රියාදාමය"

සංක්‍රමණික කම්කරුවන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද පිළිබඳ සොයා බැලීමේ" කොළඹ ක්‍රියාදාමය" නමැති ජාතීන්ගේ කණ්ඩායම පිළිබඳ කටයුතු ද සංක්‍රමණය හා සංවර්ධන යන විෂය සම්බන්ධයෙන් ද අමාත්‍යාංශයේ කේන්ද්‍රස්ථානය වූයේ මෙම අංශයයි.

වෙනත් ජාත්‍යන්තර සංවිධාන

ආසියානු සංවර්ධන බැංකුව,ලෝක බැංකුව,ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය ආදියෙහි නිලධාරීන්ට කෙටිකාලීන ගමන් බලපත්‍ර නිකුත් කළේද, රජයේ නියෝජිතායන මඟින් සංවිධානය කරන ලද වැඩ මුළුවලට හා සම්මන්ත්‍රණ වලට සහභාගිවූ නිලධාරීන්ට පහසුකම් සලසා දෙන ලද්දේද මෙම අංශය මඟිනි. ශ්‍රී ලාංකික ශිෂ්‍යයින්ට, වෘත්තිකයින්ට හා රජයේ නිලධාරීන්ට කොළඹ ක්‍රමය, සිංගප්පූර් කාර්මික සහයෝගිතා වැඩසටහන, මැලේසියානු කාර්මික සහයෝගිතා වැඩසටහන, ආසියා හා ශාන්තිකර කලාපීය ආර්ථික හා සමාජයීය කොමිෂන් සභාව හා කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය මඟින් කෙටිකාලීන හා දිගුකාලීන ශිෂ්‍යත්ව පහසුකම් සලසා දෙන ලද්දේද මෙම අංශයෙනි.

## විදේශීය ආයෝජන

අබුඩාබි හි සිටින තානාපතිතුමාගේ නිර්දේශ මත "ග්හැන්ටූට් ගෲප්" හි කළමනාකරණ අධ්‍යක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු නියෝජිත කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලිණි. පැමිණ සිටි නියෝජිත කණ්ඩායමට අදාළ රාජ්‍ය නියෝජිතායතන සමඟ යෝග්‍ය වූ අන්‍යෝන්‍ය කටයුතු ඇති කර ගැනීම සඳහා ආර්ථික කටයුතු අංශය සහාය විය. මේ හා සමානවම දෝහා රාජ්‍යයේ රජය වෙත දෝහා හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ලබා දුන් නිර්දේශ මත ශ්‍රී ලංකාවේ හෝටල් ක්ෂේත්‍රයේ ආයෝජනය කිරීමට උනන්දුවක් දැක්වූ "කටාර් ඩියාර්" ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලිණි. ආර්ථික කටයුතු අංශය, ආයෝජන මණ්ඩලයේ සහාය ඇතිව කරුණු විනිශ්චය කර ගැනීම සඳහා පැමිණි කණ්ඩායමේ සංචාරය සඳහා සහාය දැක්වීය.

මේ වන විට, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ශ්‍රී ලංකා තානාපතිතුමා විසින් විදුලිබල උත්පාදන ක්ෂේත්‍රයේ ආයෝජනය කිරීමට කැමැත්ත දක්වන සමාගමක් ලෙස නිර්දේශ කර ඇති "තායාබ් ගෲප්" සමඟ සාකච්ඡා පවත්වමින් සිටියි.

## වෙළඳ ප්‍රවර්ධනය

පොදු රාජ්‍ය මණ්ඩලයීය ව්‍යාපාරික සංසදය සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ කේන්ද්‍රස්ථානය ලෙස ආර්ථික කටයුතු අංශය මෙම සංසදය ප්‍රවර්ධනය කිරීමෙහි ලා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

ව්‍යාපාරික සංසදය ප්‍රවර්ධනය කිරීමෙහි ලා අවශ්‍ය සියලුම දෑ ආර්ථික කටයුතු අංශය විසින් විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට ලබා දෙනු ලබයි. පොදු රාජ්‍ය මණ්ඩලයීය ව්‍යාපාරික සංසදයේ උප කමිටුවේ සම්බන්ධීකාරක රැස්වීම් කැඳවා ඒ සඳහා සහසුකම් සලසන ලදී.

සාමාන්‍යයෙන්, ආර්ථික කටයුතු අංශය, විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා ශ්‍රී ලාංකික වෙළඳ ප්‍රවර්ධන අවස්ථා පිළිබඳව තොරතුරු පළ කර හරියි. තවද, විදේශ රටවල පවත්වන වෙළඳ ප්‍රවර්ධන අවස්ථා පිළිබඳව තොරතුරු වාණිජ මණ්ඩල හරහා ශ්‍රී ලංකාවේ සිටින ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්ව වෙත දැනුම් දෙනු ලැබේ.

# සන්ධාන අංශය

## සන්ධාන අංශය

### 1. සන්ධාන අංශයේ කාර්ය කටයුතු පහත දැක්වෙන ප්‍රධාන අංශ යටතේ වර්ග කළ හැකිය.

(අ). චාරිත්‍රානුකූල උත්සව අවස්ථා පැවැත්වීම

(ආ). ශ්‍රී ලංකාව සඳහා අක්ත ගන්වා ඇති විදේශීය රාජ්‍යතාන්ත්‍රික නියෝජිතයන්ට සහ ජාත්‍යන්තර සංවිධානවලට පහසුකම් සැලැස්වීම සහ රාජ්‍යතාන්ත්‍රික වරප්‍රසාද සහ විනිර්මුක්තීන් ප්‍රදානය කිරීම

(ඇ). ශ්‍රී ලංකාව සඳහා අක්ත ගන්වා ඇති දූත මණ්ඩල ප්‍රධානීන් සඳහා අවශ්‍ය කටයුතු සඳහා පහසුකම් සැලසීම (කොළඹ සිටින සහ වෙනත් ස්ථානවලින් සමගාමීව අක්ත ගන්වන ලද)

(ඈ). ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ජාත්‍යන්තර සමුළු සඳහා සැපයුම් හා සන්ධාන කටයුතු සඳහා පහසුකම් සැලසීම.

### 2. චාරිත්‍රානුකූල උත්සව අවස්ථා

චාරිත්‍රානුකූල උත්සව අවස්ථා පැවැත්වීම හා සම්බන්ධ කේන්ද්‍රස්ථානය වනුයේ සන්ධාන අංශයයි. රාජ්‍ය නායකයන් ආණ්ඩු ප්‍රධානීන්, අමාත්‍යවරුන්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ වෙනත් සම්භාවනීය පුද්ගලයන් ශ්‍රී ලංකාවේ නිරතවන සංචාර සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය සැපයුම් හා සන්ධාන කටයුතු සිදු කරනුයේ සන්ධාන අංශයයි. අතිගරු ජනාධිපතිතුමා, ගරු අමාත්‍යතුමා සහ ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා, විදේශීය සම්භාවනීය පුද්ගලයන් සඳහා පවත්වන උත්සව අවස්ථා සඳහා අවශ්‍ය සහාය ලබාදීමේ වගකීම දරනු ලබන්නේද සන්ධාන අංශය විසිනි. විදේශීය රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල සහ විදේශීය රටවල් සම්බන්ධවන අවස්ථාවලදී අදාළ රේඛීය අමාත්‍යාංශ විසින් සංවිධානය කරනු ලබන උත්සව අවස්ථා සඳහා ඔවුන්ගේ ඉල්ලීම මත අවශ්‍ය සන්ධාන සහාය ලබාදෙනු ලැබේ.

2.1.1 අතිසම්භාවනීය පුද්ගලයන්/සම්භාවනීය පුද්ගලයන් ශ්‍රී ලංකාවේ නිරත වන සංචාර පිළිබඳව කටයුතු කිරීම (‘අ’ ඇමුණුමෙහි විස්තර වශයෙන් දක්වා ඇත).

| | | |
|---|---|---|
| රාජ්‍ය නායකයන්/අග්‍රාමාත්‍යවරුන් සහ වෙනත් අති සම්භාවනීය පුද්ගලයන් | - | 13 |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සහ වෙනත් ජාත්‍යන්තර සංවිධානවල නායකයන් | - | 03 |
| විශේෂ නියෝජිතයන් | - | 03 |
| විදේශ අමාත්‍යවරුන් | - | 06 |
| කැබිනට් අමාත්‍යවරුන් | - | 09 |
| වෙනත් විදේශීය සම්භාවනීය පුද්ගලයන් | - | 37 |
| රැස්වීම්/සමුළු සඳහා නියෝජිත කණ්ඩායම් | - | 02 |
| 2.1.2 විදේශ රටවල සිටින ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල්වරුන් පත් කිරීම් | - | 19 |
| ශ්‍රී ලංකාවේ සිටින විදේශ රටවල් වෙනුවෙන් පෙනී සිටින නිර්වේතනික කොන්සල්වරුන්ගේ පත් කිරීම සඳහා අදාළ දේශීය අනුමැතිය ලබා දීම. | - | නැත |

2.2 අතිගරු ජනාධිපතිතුමාගේ ගරු අග්‍රාමාත්‍යතුමාගේ සහ ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සංචාර පිළිබඳව සංවිධාන කටයුතුවලදී සියලුම සන්ධාන හා සැපයුම් කටයුතුවලදී අඩු ලුහුඩුකම්වලින් තොර මනා සම්බන්ධීකරණයකින් යුතුව සිදුවන බවට තහවුරු කිරීමට විදේශ රටවල පිහිටි අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ විදේශ රටවල විදේශීය නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකරමින් සන්ධාන අංශය ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටු කරයි.

2.2.1 ශ්‍රී ලාංකික අති සම්භාවනීය පුද්ගලයන්ගේ විදේශ සංචාර

| | |
|---|---|
| අතිගරු ජනාධිපතිතුමාගේ රාජ්‍ය සංචාර | - 14 (‘ආ’ ඇමුණුමෙහි විස්තර දක්වා ඇත) |
| ගරු අමාත්‍යතුමාගේ සංචාර | - නැත (‘ඇ’ ඇමුණුමෙහි විස්තර දක්වා ඇත) |
| ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සංචාර | - 26 (‘ඈ’ ඇමුණුමෙහි විස්තර දක්වා ඇත) |

## 3. වරප්‍රසාද සහ විනිර්මුක්තීන්

3.1 රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිළිබඳ 1961 වියනා සම්මුතිය, කොන්සියුලර් කටයුතු පිළිබඳ 1963 වියනා සම්මුතිය, එක්සත් ජාතීන්ගේ වරප්‍රසාද සහ විනිර්මුක්තීන් පිළිබඳ 1946 සම්මුතිය සහ විශේෂිත නියෝජිතායතනවල වරප්‍රසාද සහ විනිර්මුක්තීන් පිලිබඳ 1947 සම්මුතිය ප්‍රකාරව රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල, ජාත්‍යන්තර සංවිධාන සහ ඒවායේ කාර්ය මණ්ඩල සඳහා වරප්‍රසාද සහ විනර්මුක්තීන් ප්‍රදානය කිරීමේ සහ ඒ සඳහා පහසුකම් සැලසීමේ වගකීම දරන්නේද සන්ධාන අංශයයි.

සමාලෝචනයට භාජනය වන කාලය තුළදී සන්ධාන අංශයේ වරප්‍රසාද සහ විනිර්මුක්තීන් පිළිබඳ ඒකකය විසින් ඉටු කරන ලද කාර්ය කටයුතු මෙසේය.

| | | |
|---|---|---|
| 3.2.1 නිෂ්කාශන සහතික නිකුත් කිරීම | - | 1965 |
| 3.2.2 ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ දූත මණ්ඩල සඳහා සහ කාර්ය මණ්ඩල සාමාජිකයන් මෙරටට පැමිණීමේදී සහ පිටවන අවස්ථාවලදී ලබාදුන් රේගු පහසුකම් | - | 135 |
| 3.2.3 රාජ්‍යතාන්ත්‍රික වාහන | | |
| වාහන විකිණීම | - | 265 |
| වාහන ලියාපදිංචි කිරීම | - | 078 |
| ආදායම් බලපත්‍ර නිකුත් කිරීම | - | 895 |
| රියදුරු බලපත්‍ර නිකුත් කිරීම | - | 53 |
| පෙට්‍රල් කූපන් පත් නිකුත් කිරීම | - | 366 |
| 3.2.4 වීසා බලපත්‍ර (විදේශීය දූත මණ්ඩල සහ එක්සත් ජාතීන් හා සම්බන්ධ සංවිධාන) | - | 1432 |
| 3.2.5 ගුවන් තොටුපළ අවසරපත් (ස්ථිර සහ තාවකාලික) | - | 149 |
| සම්භාවනීය පුද්ගලයන්ගේ පර්යන්තය සඳහා අවසරපත් | - | 1496 |
| 3.2.6 රාජ්‍යතාන්ත්‍රික නිෂ්කාශන (විදේශීය ගුවන්යානා සහ නැව්) | - | 174 |
| 3.2.7 ජාතික දින සුභාශිංසන පණිවුඩ | - | 82 |

## 4. අක්තගැන්වීම්

ශ්‍රී ලංකාව සඳහා අක්තගන්වා ඇති විදේශීය තානාපතිවරුන්ගේ අක්තපත්‍ර පිරිනැමීමේ උත්සව සංවිධානය කිරීම, වෙනත් රටවල් සඳහා පත් කරනු ලැබූ ශ්‍රී ලාංකික තානාපතිවරුන්/ මහ කොමසාරිස්වරුන් සඳහා ඔවුන් පිළිගන්නා බව දන්වන ලිපිය ලබාගැනීම, ශ්‍රී ලංකාවේ සිටින විදේශීය රාජ්‍යතාන්ත්‍රිකයන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම සහ ඔවුන් මෙරටින් නික්ම යන අවස්ථාවේදී සිදුකළ යුතුවන ක්‍රියාපිළිවෙත් සිදුකිරිම යනාදී කටයුතු සන්ධාන අංශයට අදාළ කටයුතු අතර වේ. මෙම කාල සීමාව තුළදී මීට අදාළව මෙම අංශය විසින් ඉටු කරන ලද කාර්ය කටයුතු පහත දැක්වේ.

4.1.2 හැඳුනුම්පත් (රාජ්‍යතාන්ත්‍රික - 338 සහ වෙනත් 326)

4.1.2 ශ්‍රී ලංකාව සඳහා විදේශීය දූත මණ්ඩල ප්‍රධානීන් පත් කිරීම් - 32

## 5. ජාත්‍යන්තර සමුළු

5.1 සැපයුම් සහ සන්ධාන ක්ෂේත්‍ර පිළිබඳව සලකා බලන කල්හි, ජාත්‍යන්තර සමුළු පැවැත්වීම සඳහා සිත්ගන්නා සුළු රටක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධන කිරීමේදී සන්ධාන අංශය දිගින් දිගටම ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. මෙහිදී, අවශ්‍ය කටයුතු සම්පාදනයෙහි ලා සන්ධාන අංශය අදාළ රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සමඟ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරයි.

5.2 එවැනි ජාත්‍යන්තර සමුළු හා සම්බන්ධ සන්ධාන හා සැපයුම් කටයුතු ඉටුකිරීම සඳහා සන්ධාන අංශය, අදාළ රේඛීය නියෝජිතායතනවල කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙත අවශ්‍ය සහාය හා මාර්ගෝපදේශ ලබාදෙයි. විදේශ කටයුතු අමාත්‍යාංශයේ සන්ධාන අංශයේ සහාය ඇතිව උක්ත කාලය තුළ ශ්‍රී ලංකාවේ පවත්වන ලද ජාත්‍යන්තර සමුළු පහත දැක්වේ.

1. 2013 අගෝස්තු 22 වැනි දින සිට දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුමේ 8 වැනි රැස්වීම.
2. 2013 අගෝස්තු 23 දින දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුමට අයත් රටවල අමාත්‍යවරුන්ගේ 7 වැනි රැස්වීම.
3. 2013 අගෝස්තු 29 වැනි දින සාර්ක් මුදල් අමාත්‍යාංශ සහ මුදල් ලේකම්වරුන්ගේ 06 වැනි රැස්වීම.
4. 2013 අගෝස්තු 11-14 දක්වා දකුණු ආසියා කොන්සියුලර් සමුළුව, 2 වැනි FICAS

**‘අ’ ඇමුණුම**

**රාජ්‍ය නායකයන්/ අග්‍රාමාත්‍යවරුන් සහ වෙනත් අතිසම්භාවනීය පුද්ගලයින්**

01. හංගේරියාවේ ජාතික සභාවේ කථානායක අතිගරු ආචාර්ය ලස්ලෝ කොවර් මැතිතුමාගේ සංචාරය - 2013 ජනවාරි 30 - පෙබරවාරි 05
02. ජපානයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය අතිගරු ටාරෝ අසෝ මැතිතුමාගේ සංචාරය 2013 මැයි 01 - 02
03. මජ්ලිස් අල්-නුවාබ් (නියෝජිතවරුන්ගේ සභාව - 2 වැනි මණ්ඩලය) හි කතානායක අතිගරු බලීෆා අල් ඩහ්රානි මැතිතුමන්ගේ සංචාරය - 2013 අප්‍රේල් 23 - 28
04. තායිලන්තයේ අග්‍රාමාත්‍ය අතිගරු ඉන්ග්ලක් ෂිනවත්‍රා මැතිතුමියගේ සංචාරය - 2013 මැයි 31 – ජූනි 01
05. තායිලන්තයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍ය සහ විදේශ කටයුතු අමාත්‍ය අතිගරු සුරපොන්ග් ටොව්චයිකුල් මැතිතුමාගේ සංචාරය - 2013 මැයි 02 – 04 සහ ශ්‍රී ලංකාතායිලන්ත 3 වැනි ඒකාබද්ධ කොමිෂන් සභාව 2013 අප්‍රේල් 30 - මැයි 04
06. උගන්ඩා ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා මෙහි ගතකළ සංක්‍රාන්ති අවස්ථාවේදී සිදු කළ සංචාරය - 2013 මැයි 29 සහ ජූනි 03
07. ජෝජියා ආර්යාවගේ ශ්‍රී ලංකා සංචාරය - 2013 ජූනි 17 – 22
08. මාලදිවයින් ජනරජයේ ජනාධිපති අතිගරු ආචාර්ය මොහමඩ් වහීඩ් හසන් මැතිතුමාගේ සංචාරය - 2013 ජූලි 05 – 07
09. වනවටු හි ටිසුගුකෝ රජ කුමරිය සහ නියෝජිත කණ්ඩායමේ සංචාරය 2013 අගෝස්තු 19 – 23
10. කොරියා ජනරජයේ අග්‍රාමාත්‍ය අතිගරු චුන්ග් හැන්ග් වොන් මැතිතුමාගේ ශ්‍රී ලංකා නිල සංචාරය - 2013 අගෝස්තු 28 – 31
11. මාලදිවයිනේ හිටපු ජනාධිපති අතිගරු මොහොමඩ් නෂීඩ් මැතිතුමා සහ නියෝජිත කණ්ඩායමේ සංචාරය - 2013 අගෝස්තු 17 – 08
12. ඉන්දියා විදේශ කටයුතු අමාත්‍ය ගරු සල්මන් කුර්ෂිඩ් මහතාගේ ශ්‍රී ලංකා නිල සංචාර - 2013 ඔක්තොම්බර් 07 - 08

**එක්සත් ජාතීන්ගේ සංවිධානය හා වෙනත් ජාත්‍යන්තර සංවිධානවල ප්‍රධානීන් - 03**

01. ජාත්‍යන්තර සබඳතා හා ක්‍රමෝපායික අධ්‍යයන සඳහා ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය විසින් සංවිධානය කරන ලද ඒකාබද්ධ සමුළුව සඳහා පකිස්තාන නියෝජිත කණ්ඩායමේ සංචාරය - 2013 පෙබරවාරි 09 – 12
02. පොදු රාජ්‍ය මණ්ඩලයීය මහලේකම්වරයා සහ නියෝජිත කණ්ඩායමේ ශ්‍රී ලංකා සංචාරය - 2013 පෙබරවාරි 06 – 13
03. පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීමේ ජනතා සංසදයේ සංවිධාන කටයුතු සඳහා පොදු රාජ්‍ය මණ්ඩලයීය පදනමේ කාර්ය මණ්ඩලයේ සංචාරය - 2013 අගෝස්තු 23 – 19

**විශේෂ නියෝජිතයින් - 03**

01. ඉන්දියානු විදේශ කටයුතු අමාත්‍යාංශයේ විශේෂ අමුත්තකු වන එස් ස්වාමි මහතාගේ සහ සාමාජිකයන් දෙදෙනෙකුගෙන් යුත් නියෝජිත කණ්ඩායමේ සංචාරය
02. ඉරානයේ ජනාධිපති උපදේශක සහ නොබැඳි ජාතීන්ගේ ලේකම් කාර්යාලයේ සභාපති අස්ෆැන් ඩියර් රෂ්මි මැකේයි මහතාගේ සංචාරය
03. එක්සත් රාජධානියේ පාර්ලිමේන්තුවේ සාම මණ්ඩලයේ සාමාජික හා ශ්‍රී ලංකාව පිළිබඳ සර්වපාර්ශ්වික පාර්ලිමේන්තු කණ්ඩායමේ සාමාජික ලෝවර් ඉවේග්හි රෝගන් සාමිවරයා සහ එම මැතිනියගේ සංචාරය - 2013 සැප්තැම්බර් 24 - ඔක්තෝබර් 05

**විදේශ අමාත්‍යවරු - 06**

01. විදේශ කටයුතු අමාත්‍ය අතිගරු අර්මස් පැයෙට් මැතිතුමා සහ නියෝජිත කණ්ඩායමේ ශ්‍රී ලංකා සංචාරය - 2013 පෙබරවාරි 14 – 15
02. ඉරාන විදේශ අමාත්‍ය අතිගරු ආචාර්ය අලී අක්බාර් සලෙහි මැතිතුමාගේ සංචාරය - 2013 මාර්තු 15 – 16
03. ඇසර්බයිජාන් විදේශ කටයුතු අමාත්‍ය අතිගරු එල්මර් මම්මාඩියරෝව් මැතිතුමාගේ සංචාරය - 2013 මැයි 05 – 07
04. විදේශ කටයුතු අමාත්‍ය ගරු මුරේ මැක්කාුලි මහතාගේ සංචාරය - 2013 ජූලි 04 – 05
05. මොරිටේනියාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු හමාඩි ඔවුල්ඩ් බාබා ඔවුල්ඩ් හමාඩි මැතිතුමාගේ සංචාරය - 2013 ජූනි 29 - ජූලි 01
06. නවසීලන්තයේ විදේශ කටයුතු අමාත්‍ය මුරේ මැක්කාුලි මැතිතුමාගේ සංචාරය - 2013

# කොන්සියුලර් අංශය

## කොන්සියුලර් අංශය

2006 අංක 18 දරන පනතින් සංශෝධනය වූ 1981 අංක 4 දරන කොන්සියුලර් කටයුතු පිළිබඳ පනත මඟින් ස්ථාපනය කරන ලද කොන්සියුලර් අංශය, මහජන සම්බන්ධතා කාර්යයෙහි ලා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ඉතාමත් ජනප්‍රිය අංශය බවට පත්වී තිබේ.

2006 අංක 18 දරන පනතින් සංශෝධිත 1981 අංක 4 දරන කොන්සියුලර් කර්තව්‍ය පනත මගින් ස්ථාපනය කරන ලද කොන්සියුලර් කටයුතු අංශය, මහජනතාව සම්බන්ධයෙන් සලකා බලනවිට විදේශ කටයුතු අමාත්‍යාංශයේ වඩාත්ම ජනප්‍රිය අංශය වෙයි. ශ්‍රී ලාංකිකයන් විදේශීය රටවලට පිටත්ව යාමට පෙර හා පිටත්ව යාමෙන් පසු අවශ්‍ය වන ලිපිලේඛන සම්බන්ධයෙන් හා වෙනත් අවශ්‍යතා සම්බන්ධයෙන් මෙම අංශය පහසුකම් සලසයි.

මහජනතාවගේ පහසුව සඳහා සහ කාර්යක්ෂම සේවයක් සඳහා මෙම අංශය වායුසමීකර කරන ලද අතර 2011 වසරේදී එහි වැඩ කටයුතු පරිගණකගත කරන ලදී. මීට අමතරව, එහි රැඳී සිටින කාලය තුළදී ඇතිවන ඒකාකාරී බව නැති කිරීම සඳහා රූපවාහිනී යන්ත්‍ර සවිකරන ලදී.

ආදායම් උපයන එකම අංශය වනුයේ කොන්සියුලර් කටයුතු අංශයයි. 2013 දෙසැම්බර් 31 දක්වා ශ්‍රී.ලං.රු.328,840,091.38ක මුදලක් රැස් කරන ලදී.

කොන්සියුලර් කටයුතු අංශය පහත සඳහන් උප අංශවලට බෙදා ඇත.

01. ලිපි ලේඛන සහතික කිරීමේ අනු අංශය
02. වන්දි ලබා දීමේ අනු අංශය
03. මරණ පිළිබඳ අනු අංශය
04. නැවත සියරට ගෙන්වා ගැනීමේ අනු අංශය
05. අධ්‍යාපන සහතික අනු අංශය
06. විවිධ කටයුතු අනු අංශය (ධීවර යාත්‍රා, උප්පැන්න ලියාපදිංචි කිරීම හා වෙනත් කටයුතු)

### ලිපි ලේඛන සහතික කිරීමේ අනු අංශය

තම ලිපි ලේඛන සහතික කරවා ගැනීම සඳහා දිනපතාම විශාල පිරිසක් ලිපි ලේඛන සහතික කිරීමේ අනු අංශයට පැමිණෙන නිසා එම අනු අංශයට වැදගත් තැනක් ලැබී තිබේ. ශ්‍රී ලංකාවේ අදාළ නිලධාරීන් විසින් නිකුත් කරනු ලබන උප්පැන්න සහතික, විවාහ සහතික, මරණ සහතික, වෛද්‍ය සහතික, අධ්‍යාපන සහතික, පොලිස් වාර්තා, අපනයන ලියවිලි, දිවුරුම් පෙත්සම්, ඇටෝර්නි බලය පැවරීමේ ලියවිලි යනාදිය නිරතුරුවම සහතික කරනු ලබන ලියකියවිලිය.

සමාලෝචනයට භාජනය වන කාලය තුළදී ශ්‍රී ලංකා රුපියල් 101,541,000.00 මුළු ආදායමක් උපයාගෙන තිබේ.

## වන්දි ලබා දීමේ අනු අංශය

අදාළ පාර්ශ්වකරුවන්ට වන්දි මුදල් ලබාගැනීමට හැකිවන ආකාරයෙන් උසාවිවල විසඳන නඩු කටයුතුවලදී විපතට පත් පුද්ගලයින්ට පහසුකම් සලසාදීම වන්දි ලබාදීමේ අනු අංශයේ වගකීමකි. වැටුප් නොගෙවීම හා පීඩාවට ලක්කිරීම සම්බන්ධයෙන් කම්කරු අරගලවලදී මැදිහත්වීමද මෙම අනු අංශය විසින් කරනු ලබන මෙහෙයකි. ශ්‍රී ලාංකිකයෙකු විදේශීය රටකදී සේවායා විසින් හෝ එකට වැඩකරන පිරිස් විසින් හෝ මරණයට පත්කරනු ලැබුවහොත් හෝ ශාරීරික ආබාධයකට ලක්කරනු ලැබුවහොත් හෝ පීඩාකාරී තත්ත්වයකට මුහුණදීමට සැලසුවහොත් හෝ අදාළ පුද්ගලයින්ට එරෙහිව නඩු මාර්ගයෙන් කටයුතු කොට පීඩාවට පත් පාර්ශවයට වන්දි, ඔවුන්ට හිමි වැටුප්, පරිත්‍යාගයන් හෝ රක්ෂණ ආවරණ ලබාගැනීම සඳහා මෙම අනු අංශය මඟින් ක්‍රියාකරනු ලැබේ.

මිනී මැරුමකදී, අපරාධය මඟින් උපයාගත් මුදල් ඝාතකයාගෙන් ලබාගනු ලැබේ. අපරාධයක් මඟින් උපයාගත් මුදල් හෝ ලේ සල්ලි ඉල්ලා පවරන ලද සුප්‍රකට නඩු දෙකක් දැනට විභාග වෙමින් පවතී. අමරලතා ස්ලේටන් මිනී මැරුම් නඩුව මින් එකකි. මෙහිදී ඇමරිකානු ස්වාමිපුරුෂයා විසින් ශ්‍රී ලාංකික භාර්යාව ඝාතනය කරන ලදී. මෙහිදී ඉල්ලා ඇති ලේ මුදල ඇමරිකන් ඩොලර් මිලියන එකකි. අනෙක් නඩුව එච්.ඒ.චම්පික තුෂාර නැමැත්තා බෙමිනා හෙන්නදිගේ සුජිත් මයිකල් ජයන්ත පීරිස් නැමැත්තා විසින් ඝාතනය කිරීමේ සිද්ධියට අදාළ එකකි. මෙහිදී ඉල්ලා ඇති ලේ සල්ලි ශ්‍රී ලංකා රුපියල් මිලියන දහයකි.

සේවයට අදාළ හේතූන් නිසා ලෙඩ රෝග සිදුවීම, සේවයේ යෙදී සිටියදී ස්වාභාවික හේතූන් නිසා හෝ හදිසි අනතුරු නිසා මරණයට පත්වීම, සේවා කාලයෙන් පිටතදී හදිසියේ මරණයට පත්වීම යන අවස්ථාවලදීද වන්දි මුදල් ලබාගනු ලැබේ.

සමාලෝචනයට භාජනය වන කාලය තුළදී කොරියාවෙන් විශාල ප්‍රමාණයේ වන්දි මුදලක් ගෙවා ඇත. මෙම වන්දි මුදල ගෙවා ඇත්තේ නිවසක් බවට පරිවර්තනය කර ගත් බහලුවක (කන්ටේනරයක) නිදා සිටියදී වැරදි ලෙස සවිකර තිබූ විදුලි රැහැන් නිසා හටගත් ගින්නකින් පිළිස්සී මිය ගිය පුද්ගලයින් දෙදෙනෙකු වෙනුවෙනි.

නොගෙවූ වැටුප්, ආධාර ආදියද ඉල්ලා සිටිනු ලැබේ. සියලුම ලියකියවිලි මෙම අනු අංශයේදී කෙටුම්පත් කොට නීතිමය කටයුතු කරනු ලැබේ. මුදල් ලබන රටක් සමඟ ගාස්තු බෙදා හදා ගැනීමේ පදනම මත ප්‍රවීණ නීතිඥවරුන්ගේ සේවය ලබා ගනු ලැබේ. දැනට 1% සිට 20% දක්වා ගාස්තු ගෙවනු ලැබේ.

ජයග්‍රහණ ලැබූ නඩුවලින්, 2013 දෙසැම්බර් 31 වැනි දින වන විට රුපියල් මිලියන 213 කට අධික මුදලක් රැස් කරගන්නා ලදී. එක් පුද්ගලයෙකු වෙනුවෙන් ලැබූ ඉහළම ගෙවීම, කුවේට් වලින් වාර්තා වූ මරණයක් සම්බන්ධයෙන් ලද රු.7,767,442.00 ක් විය.

### මරණ පිළිබඳ අනු අංශය

මරණ පිළිබඳ අනු අංශයේ මූලික කාර්යභාරය වන්නේ මරණයට පත් වූ තැනැත්තාගේ ළඟම නෑයා සඳහා පහසුකම් සලසා දීමය. මෙයට විකල්ප වශයෙන් කරන්නේ ළඟම නෑයාගේ කැමැත්ත පරිදි භූමිදානය කිරීම සඳහා හෝ ආදාහනය කිරීම සඳහා උපදෙස් නිකුත් කිරීමය.

සමාලෝචනයට භාජනය වූ කාලය තුළදී විදේශවලදී මරණයට පත්වූ පුද්ගලයින් 501 දෙනෙකුගේ මළ සිරුරු ශ්‍රී ලංකාවට ගෙනවිත් ඇත. එකම රටකින් ගෙන්වන ලද වැඩිම මළ සිරුරු සංඛ්‍යාව 159කි. ඒ සෞදි අරාබියෙනි. මෙයට අමතරව කටාර් රාජ්‍යයෙන් මළ සිරුරු 61ක්ද, කුවේට් රටින් 51ක්ද, ඉතාලියෙන් 48ක්ද, එක්සත් අරාබි එමිරේට් රටින් 41ක්ද, ඉන්දියාවෙන් මළ සිරුරු 4ක්ද, අනෙකුත් සියලුම රටවලින් මළ සිරුරු 137ක්ද ගෙන්වා ඇත.

සිදු වී ඇති 501ක් මරණ අතුරෙන් 270 ක් ලෙඩ රෝග නිසාද,103ක් හදිසි අනතුරුවලින්ද, 28ක් සියදිවි හානි කර ගැනීමෙන්ද, මිනීමැරුම් නිසා 12ක් , 88 ක් නිශ්චය කර නොගත් හේතූන් නිසා ද සිදුව ඇත.

### විදේශ රටවල සේවය සඳහා ගොස් සිටින ශ්‍රී ලාංකිකයින් නැවත සිය රටට ගෙන්වා ගැනීමේ අනු අංශය

අතරමං වූ හෝ රඳවා ගනු ලැබූ හෝ අත් අඩංගුවට ගනු ලැබූ හෝ ශ්‍රී ලාංකිකයින් ශ්‍රී ලංකා විදේශ සේවා දූත මණ්ඩලවල, සංක්‍රමිකයන් සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය හෝ වෙනත් සංවිධානවල සහාය ඇතිව සිය රටට ගෙන්වා ගැනීම කොන්සියුලර් අංශයේ වැදගත් කාර්යභාරයකි.

සමාලෝචනය භාජනය වන කාලය තුළදී මෙම අනු අංශය මඟින් සිදු කරන ලද ශ්‍රී ලාංකිකයින් නැවත සිය රටට ගෙන්වා ගැනීම පිළිබඳ සංඛ්‍යා ලේඛන පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| පෞද්ගලික හෝ සෞඛ්‍ය හේතූන් නිසා විදේශ ගත ශ්‍රී ලාංකිකයින් | වාර්තා වූ සංඛ්‍යාව 802 | කටයුතු නිම කළ සංඛ්‍යාව 268 | කටයුතු සිදු කෙරෙමින් පවතින සංඛ්‍යාව 534 |
| රඳවා ගනු ලැබීම, අත් අඩංගුවට ගනු ලැබීම හෝ සිරගත කරනු ලැබීම නිසා ආපසු ගෙන්වා ගත් ශ්‍රී ලාංකිකයින් | 371 | 88 | 230 |
| **එකතුව** | **1173** | **366** | **764** |

### අධ්‍යාපන සහතික අනු අංශය

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පරීක්ෂා කිරීමේ හා ඇගයීමේ අංශය මඟින් නිකුත් කරන ලද අ.පො.ස. (සා/ පෙළ) හා අ.පො.ස. (උ/ පෙළ) සහතික පත් මෙම අනු අංශය මඟින් සහතික කර දෙනු ලැබේ. මෙයට අමතරව, උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ සහතික, අපනයන ලියකියවිලි හා වෙනත් ලියකියවිලි සහතික කිරීම සම්බන්ධයෙන් ද ගෙවීම් මෙම අනු අංශය මඟින් භාර ගනු ලැබේ.

සමාලෝචනයට භාජනය වූ කාලය තුළදී මෙම අනු අංශය මඟින් උපයාගන්නා ලද ආදායම ශ්‍රී ලංකා රුපියල් 13,710,250ක මුදලකි.

## විවිධකටයුතුඅංශය

ඉහත දැක්වූ අංශ 05 යටතට නොගැනෙන සියලු කටයුතු මෙම අංශය මඟින් ආවරණය කෙරේ. විවිධ කටයුතු අංශය ලෙස නම් කළද, මෙම අංශයට පැවරෙන රාජකාරි වෙනස්වන සුළු අතර, දෛනිකව බොහෝ සිද්ධීන් ප්‍රමාණයක් සම්බන්ධයෙන් කටයුතු කෙරේ. මනුෂ්‍ය ඝාතනයකදී , ඊට අදාළ දෙපාර්ශ්වයම ශ්‍රී ලාංකික පුරවැසියන් නම්, වන්දි ලබාදීමේ අංශය විසින් පීඩාවට පත් පාර්ශ්වයේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් පෙනී සිටින අතර, චූදිත පාර්ශ්වයේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් පෙනී සිටින්නේ මෙම විවිධ කටයුතු අංශයයි.

මෙම අංශය දැල් එළන බෝට්ටු හා ධීවර යාත්‍රා පිළිබඳවද කටයුතු කරයි. ඉන්දියාව මඟින් ධීවර යාත්‍රා 63ක් රඳවා තබාගෙන නැව් කාර්ය මණ්ඩල සාමාජිකයන් 333ක් අත්අඩංගුවේ තබාගෙන සිටියදී ඒවා නිදහස් කරගැනීමට ගත හැකි සියලුම ක්‍රියාමාර්ග ගන්නා ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචනයට භාජනය කරන කාලසීමාව තුළදී නැව් කාර්ය මණ්ඩල සාමාජිකයන් 121 දෙනෙකු නිදහස් කරගැනීමට හැකියාව ලැබී ඇත. සෝමාලි මුහුදු කොල්ලකරුවන් විසින් අල්ලා ගනු ලැබූ ශ්‍රී ලාංකික නැව්කරුවන්/ධීවරයන්ට අදාළ සිද්ධීන් පිළිබඳව මෙම අංශය කටයුතු කරයි. සමාලෝචනයට භාජනය වන කාලසීමාව ඇතුළත, මැලේසියානු ධජය යටතේ ( පෙනන්ග්-පූලාන්-මැලෝන්ස්-මැලේසියාව) යාත්‍රා කරමින් තිබූ එම්වී ඇල්බෙඩෝ නැවේ කාර්ය මණ්ඩල සාමාජිකයන් 6 දෙනෙකු අල්ලා ගනු ලැබ තිබිණ. ඔවුන් අල්ලා ගනු ලැබූ දිනය 2010.11.26 වන අතර, මුහුදු කොල්ලකරුවන් විසින් කප්පමක් ඉල්ලා සිටින බැවින් ඒ පිළිබඳ කටයුතු තවමත් සිදුවෙමින් පවතී. විදේශ රටවලදී මරණ දඬුවමට, ජීවිතාන්තය තෙක් සිර දඬුවම් විඳීමට සහ දීර්ඝකාලීනව බන්ධනාගාරගත කිරීමේ කොන්දේසිවලට යටත්වූ ශ්‍රී ලාංකිකයන්ට අදාළ සිද්ධීන් පිළිබඳවද මෙම අංශය කටයුතු කරයි.

## උප්පැන්න සහතික

සමාලෝචනයට භාජනය වන කාලසීමාව ඇතුළත, විදේශවල වෙසෙන ශ්‍රී ලාංකිකයින්ට ලැබුණු දරුවන් වෙනුවෙන් අපගේ දූත මණ්ඩල කාර්යාල විසින් නිකුත් කළ උප්පැන්න සහතික 1326 ක් විවිධ කටයුතු අංශය වෙත ලැබී ඇත.

ඇමුණුම 01

<u>ලිපි ලේඛන සහතික කිරීමේ හා නිර්ව්‍යාජභාවය පරීක්ෂා කිරීමේ අංශය</u>

| මාස (2013) | ආදායම (රුපියල්) |
|---|---|
| 1.ජනවාරි | 10,340,750.00 |
| 2.පෙබරවාරි | 8,578,750.00 |
| 3.මාර්තු | 8,603,750.00 |
| 4.අප්‍රේල් | 7,766,500.00 |
| 5. මැයි | 7,764,000.00 |
| 6.ජුනි | 8,345,500.00 |
| 7.ජූලි | 8,604,750.00 |
| 8.අගෝස්තු | 7,852,250,00 |
| 9.සැප්තැම්බර් | 8,321,500.00 |
| 10. ඔක්තෝබර් | 8,739,750.00 |
| 11.නොවැම්බර් | 8,370,250.00 |
| 12.දෙසැම්බර් | 9,088,625.00 |
| **එකතුව** | **101,541,000.00** |

ඇමුණුම 02

## වන්දි ලබා දීම

| යොමුව | රට | අගය(රුපියල්) |
|---|---|---|
| 1 | සවුදි අරාබිය | 39,612,512.78 |
| 2 | කටාර් | 30,445,670.00 |
| 3 | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 20,170,988.44 |
| 4 | කුවේට් | 30,771,284.00 |
| 5 | ලෙබනන් | 2,221,875.00 |
| 6 | ජොර්දාන් | 17,119,407.90 |
| 7 | ඕමාන් | 5,041,398.47 |
| 8 | කෙන්යාව | 135,389.10 |
| 9 | දකුණු අප්‍රිකාව | 1,252,496.53 |

| | | |
|---|---|---|
| 10 | සිංගප්පූරුව | 5,359,206.24 |
| 11 | රෝමය | 2,559,942.00 |
| 12 | බහරේන් | 115,580.00 |
| 13 | ඩුබායි | 7,678,097.00 |
| 14 | ජෙඩා | 5,380,566.44 |
| 15 | ජෝර්දාන් | 1.084,200.00 |
| 16 | කෙන්යා | 68,302.72 |
| 17 | කුවේට් | 18,100,680.00 |
| 18 | කටාර් | 20,605,710.00 |
| 19 | රියාද් | 5,223,984.46 |
| 20 | මැලේසියා | 642,329.55 |
| | **එකතුව** | **213,588,841.38** |

**ඇමුණුම 03**

**2013 දෙසැම්බර් 31 දක්වා වාර්තා වූ මරණ**

| රට | මරණ ගණන |
|---|---|
| රියාද් | 115 |
| ජෙඩා | 44 |
| කුවේට් | 51 |
| කටාර් | 61 |
| රෝමය | 48 |
| ඉන්දියාව | 04 |
| එක්සත් අරාබි එමීර් | 41 |
| වෙනත් රටවල් | 137 |
| **එකතුව** | **501** |

| මරණ සඳහා හේතු | මරණ ගණන |
|---|---|
| හදිසි අනතුරු | 103 |
| අසනීප | 270 |
| සියදිවි නසා ගැනීම | 28 |
| මිනි මැරීම් | 12 |
| හේතු රහිත | 88 |
| **එකතුව** | **501** |

මරණ ගණන2009  - 435

මරණ ගණන2010 -  474

මරණ ගණන2011 – 430

මරණ ගණන2012 – 431

මරණ ගණන 2013 - 501

# පොදු සන්නිවේදන අංශය

# පොදු සන්නිවේදන අංශය

පොදු සන්නිවේදන අංශය අමාත්‍යාංශයේ මෙහෙයුම් අංශයක් වන අතර තොරතුරු පතුරුවා හැරීම හා ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ආරක්ෂා කරමින් එම ප්‍රතිරූපය විදේශ රටවල් වෙත ප්‍රක්ෂේපණය කිරීම තුළින් රජයක් බාහිර ක්‍රියාකාරකමුත් අතර මනා සම්බන්ධතාවයක් පවත්වාගෙන යාමේ කාර්යභාරය මෙම අංශයට පැවරී ඇත. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියට හා ජාත්‍යන්තර සම්බන්ධතාවලට අදාළව අමාත්‍යාංශය තුළ හා පොදුවේ මුළු මහත් රට තුළම හට ගන්නා සිදුවීම්/ උදාවන තත්ත්වයන් මත මෙම අංශයේ වැඩ කටයුතු රඳා පවතී.

## 2013 වර්ෂය තුළ පොදු සන්නිවේදන අංශයේ වැඩ කටයුතු

### අතිසම්භාවනීය පුද්ගලයින්ගේ/ ඉතා වැදගත් පුද්ගලයින්ගේ සංචාර

1. අතිගරු ජනාධිපතිතුමා 2013 පෙබරවාරි මාසයේදී කසකස්ථානයේ කළ සංචාරය, මාර්තු මාසයේ ජපානයේ කළ සංචාරය, මැයි මාසයේ උගන්ඩාවේ හා චීනයේ කළ සංචාර, ජූනි මාසයේ ටැන්සානියාවේ කළ සංචාරය, ජූලි මාසයේ සීෂෙල්ස් හි කළ සංචාරය හා අගෝස්තු මාසයේ බෙලාරුස්හි කළ  සංචාරය යන සංචාර පිළිබඳ මාධ්‍යආවරණ කටයුතු මෙම අංශය විසින් සම්බන්ධීකරණය කර ඇත.

2. ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා 2013 ජනවාරි මාසයේදී එක්සත් අරාබි එමිරේඩ්හි හා ඉන්දියාවේද, පෙබරවාරි මාසයේදී  බ්‍රසීලය, බංගලාදේශය, සිංගප්පූරුව,ඊශ්‍රායලය හා පලස්තීනය යන රටවලද, මාර්තු මාසයේ ජපානය හා සී ෂෙල්ස් යන රටවලද අප්‍රේල් මාසයේ මාලදිවයින, රොමේනියාව සහ එක්සත් රාජධානිය යන රටවලද, මැයි මාසයේදී උගන්ඩාව සහ චීනය යන රටවලද, ජූනි මාසයේදී ස්ලෝවීනාය, ඔස්ට්‍රියාව,ජර්මනිය,ඕස්ට්‍රේලියාව, නෙදර්ලන්තය, තන්සේනියාව සහ සී ෂෙල්ස් යන රටවලද, ජූලි මාසයේදී පිලිපීනය, සිංගප්පූරුව හා ඉරානය යන රටවලද, සැප්තැම්බර් මාසයේදී එක්සත් රාජධානිය, එක්සත් අරාබි එමිරේඩ්ස් සහ ඇමෙරිකා එක්සත් ජනපදයේද, ඔක්තෝබර් මාසයේදි දකුණු කොරියාව හා මැලේසියාව යන රටවලද, නොවැම්බර් මාසයේදී ඕස්ට්‍රේලියාවේද කළසංචාර පිළිබඳ මාධ්‍ය ආවරණ කටයුතු මෙම අංශය මඟින් සම්බන්ධීකරණය කරන ලදී.

3. ශ්‍රී ලංකාවට සම්භාවනීය පුද්ගලයන්ගේ සංචාර සඳහා මාධ්‍ය ආවරණ පහසුකම් මෙම අංශය මඟින් සලසා දෙන ලදී.

### නිල නියෝජිත කණ්ඩායම්

4. වෙනත් රටවල නියෝජිත කණ්ඩායම් 26ක් ශ්‍රී ලංකාවේ සිදු කළ නිල සංචාර පිළිබඳ මාධ්‍ය ආවරණ සඳහා මෙම අංශය මඟින් පහසුකම් සලසා  දී ඇත. (විස්තර 1 වැනි ඇමුණුමෙහි දක්වා ඇත).

### විදේශ මාධ්‍යවේදීන්ගේ හා චිත්‍රපට රූගත කරන්නන්ගේ සංචාර

5. තොරතුරු ආවරණය කිරීම සඳහා විදේශ මාධ්‍යවේදීන් මෙරටෙහි සිදුකළ සංචාර 473ක් හා චිත්‍රපට රූගත කිරීමේ ව්‍යාපෘති 50ක් සඳහා මෙම අංශය මඟින් පහසුකම් සලසා දී ඇත.

මතු ප්‍රයෝජනය සඳහා සංචාරක මාධ්‍යවේදීන් විසින් කරන ලද වැඩකටයුතු පිළිබඳව මෙම අංශය මඟින් දිගින් දිගටම වාර්තා පවත්වාගෙන යනු ලැබේ.  (විස්තර 1 වැනි ඇමුණුමෙහි දක්වා ඇත).

6. අති සම්භාවනීය පුද්ගලයින් හා රාජ්‍ය නිලධාරීන් හමුවීමට පැමිණෙන සංචාරක මාධ්‍යවේදීන් සඳහා වේලාවන් හා අවස්ථාවන් සලසා දීමේ සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මඟින් සිදු කර ඇත.

## මාධ්‍යයට හා රාජ්‍යතාන්ත්‍රිකයින් වෙත සිදුකරන කරුණු පැහැදිලි කිරීම්

7. සමාලෝචනයට භාජනය වන කාලය තුළදී මෙම අංශය මඟින්, අමාත්‍යාංශය වෙනුවෙන් රාජ්‍යතාන්ත්‍රිකයින් වෙත කරුණු පැහැදිලි කිරීමේ සාකච්ඡා 08ක් ද, ප්‍රවෘත්ති සාකච්ඡා 23 ක්ද සංවිධානය කළ අතර අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙනුවෙන් මාධ්‍ය නිවේදන 240ක් නිකුත් කර ඇත.

## වෙනත් කාර්යයන්:

8. අමාත්‍යාංශයේ මාධ්‍ය ප්‍රකාශක වශයෙන්, අතිරේක ලේකම්/පොදු සන්නිවේදන අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා තොරතුරු ලබාදෙන අතර දේශීය හා විදේශීය මාධ්‍ය මඟින් කෙරෙන විමසීම්වලට ප්‍රතිචාර දක්වයි.

9. භාෂාත්‍රයෙන් පළවෙන ප්‍රධාන දේශීය පුවත්පත් හා වෙබ් අඩවි මෙම අංශය මඟින් දෛනිකව අධීක්ෂණය කෙරෙන අතර මාධ්‍ය වාර්තාවල ශ්‍රී ලංකාවට අදාළව පළ කෙරෙන තොරතුරු අඩංගු දෛනික වාර්තාවක් සකස් කොට ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, විදේශ කටයුතු පිළිබඳ ගරු අධීක්ෂණ මන්ත්‍රීතුමා, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, අමාත්‍යාංශයේ වෙනත් අංශවල ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල හා රේඛීය නියෝජිතායතනවල තෝරාගත් නිලධාරීන් වෙත යවනු ලැබේ.

10. ශ්‍රී ලංකාවට අහිතකර වන ප්‍රචාරක කටයුතු සිදුවන අවස්ථාවලදී ඒවට එරෙහිව කටයුතු කිරීම සඳහා වත්මන් ප්‍රවණතා, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ කටයුතුවල ප්‍රගතිය, පශ්චාත් ගැටුම් කටයුතු, කම්කරු සුභසාධනය, සංස්කෘතික කටයුතු හා සංචාරක කටයුතු ආදිය පිළිබඳ තොරතුරු අවශ්‍ය අවස්ථාවලදී ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙත ලබාදීමෙහිලා මෙම අංශය ශ්‍රී ලංකාවේ අදාළ රාජ්‍ය සංවිධාන හා ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත.

11. ශ්‍රී ලංකාවට අදාළව කෙරෙන විමසීම් සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා ශ්‍රී ලංකාවේ එදිනෙදා සිදුවීම් පිළිබඳව විදේශ දූත මණ්ඩල යාවත්කාලීන කරනු ලැබූ අතර රජයේ ප්‍රකාශනවල/ මාධ්‍ය නිවේදනවල පිටපත් විදේශ දූත මණ්ඩල ඇතුළු අවශ්‍ය අංශ අතර බෙදා හරින ලදී.

12. වැදගත් තොරතුරු අඩංගු ප්‍රකාශන ශ්‍රී ලංකාවේ සිට විදේශ දූත මණ්ඩලවලට නිතිපතා යැවීමේ කටයුතු මෙම අංශය මඟින් සම්බන්ධීකරණය කරන ලදී.

13. දැයට කිරුළ ප්‍රදර්ශන හා ජාතික දිනය නිමිත්තෙන් විශේෂ ප්‍රකාශ/ වාර්තා හා ශ්‍රව්‍ය දෘෂ්‍ය ප්‍රදර්ශන ද්‍රව්‍ය මෙම අංශය මින් සකස් කරන ලදී. මෙයට අමතරව පාර්ලිමේන්තුව වෙත යවනු ලබන විශේෂ විස්තර පත්‍රිකා සහ අමාත්‍යාංශයේ අයවැය පිළිබඳ වාර්තාව මෙම අංශය මින් සකස් කරන ලදී.

14. 2013 මාර්තු 23 වැනි දින සිට 30 වැනි දින දක්වා කාලය තුළ අම්පාර නගරයේදී පවත්වන ලද දැයට කිරුළ ප්‍රදර්ශනයේදී විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රදර්ශන කුටිය පවත්වාගෙනයාම පිළිබඳ කටයුතු මෙම අංශය මින් සම්බන්ධීකරණය කරන ලදී.

15. එක්සත් ජාතීන්ගේ ඉ - රාජ්‍ය සංවර්ධන දශකය පිළිබඳ නිර්නායකවලට අනුකූලව මෙම අංශය මඟින් 2011 ජූලි 18 දිනැති www.mea.gov.lkයන ඩොමේන් නාමය යටතේ අමාත්‍යාංශ වෙබ් අඩවිය නවීකරණය කර නැවත දියත් කරන ලදී. තොරතුරු/දත්ත භාෂා තුනෙන්ම සකස් කොට අමාත්‍යාංශ වෙබ් අඩවියට එක් කොට තිබේ. මාධ්‍ය නිවේදන සහ විදේශ දූත මණ්ඩල කටයුතු ඇතුළත් කොට වෙබ් පිටුව දෛනිකව යාවත්කාලීන කෙරේ.

16. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ ඊ-රාජ්‍ය වැඩ පිළිවෙලේ දෙවන අදියර නිමා කොට ඇති අතර මෙම අංශය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ ඩොමේන් නාමය යටතේ ඇති රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයෙහි වෙබ් අඩවියෙහි අමාත්‍යාංශයේ වෙබ් පිටුව අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ. මෙම අමාත්‍යාංශය 2013 ඉ-රාජ්‍ය පාලනය සම්බන්ධයෙන් වන දත්ත එකතුවට ඇතුළත් වන අමාත්‍යාංශ හයෙන් එකකි.

17. එල්.ටී.ටී.ඊ. ක්‍රියාකාරකම්, සර්ව පාර්ශ්වික නියෝජිත කමිටුව, නවනීදන් පිල්ලේගේ සංචාරය, 4 වැනි නාලිකාව ආදිය පිළිබඳ අදාළ ලිපිගොනු පහසුවෙන් සොයා ගැනීමේ අරමුණෙන් තැන්පත් කර තැබීම සඳහා තොරතුරු සම්පත් ඒකකය පොදු සන්නිවේදන අංශය මඟින් අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ.පර්යේෂකයින්ට හා අදාළ වෙනත් පාර්ශ්වවලට අන්තර්ජාලය මඟින් මෙම තොරතුරු ලබාගත හැකි වන ආකාරයෙන් තොරතුරු සම්පත් ඒකකය මගින් ත්‍රස්තවාදය හා සම්බන්ධ තොරතුරු අන්තර්ජාලයට නිතිපතා එක් කරනු ලැබේ.

18. විදේශ දූත මණ්ඩල සමඟ සන්නිවේදන සබඳතා සහ තොරතුරු බෙදා හදා ගැනීමේ කටයුතු ශක්තිමත් කිරීම සඳහා මෙම අංශය මඟින් ලියකියවිලි කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයක් ආරම්භ කරන ලදී.

19. විදේශිකයින්ගේ මෙරට සංචාර සම්බන්ධයෙන්, විදේශ රටවලින් නිකුත් කරන උපදේශන මාලා මෙම අංශය මඟින් අධීක්ෂණය කරනු ලබන අතර, යම් රටක් විසින් මෙරටට අයහපතක් වන ආකාරයේ උපදෙස් නිකුත් කර ඇත්නම් එම රට සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීම තුළින් එම උපදේශක මාලා සංශෝධනය කර ගැනීමේ අරමුණෙන් එවැනි අයහපත් බලපෑම් එල්ල කරන උපදේශන සම්බන්ධයෙන් විදේශ දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණ කටයුතු කරනු ලැබේ. චිත්‍රපට උළෙල, සංස්කෘතික උළෙල හා සංචාරක කර්මාන්තයට අදාළ කටයුතු සංවිධානය කිරීමේදී මෙම අංශය රේඛීය නියෝජිතායතන හා විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණ කටයුතු කරයි.

20. අමාත්‍යාංශයට අවශ්‍ය සිංහල හා දෙමළ භාෂා පරිවර්තන කටයුතු මෙම අංශය මඟින් සිදුකර දෙනු ලැබේ.

21. ශ්‍රී ලංකාවට පැමිණෙන මාධ්‍යවේදීන් පිළිබඳ දත්ත සමුදායක් පිහිටුවීමේ කටයුතු මෙම අංශය මඟින් සිදු කෙරෙමින් පවතී. මේ මඟින් පරිශීලනය පහසුවන අතර ලිපිගොනු තැන්පත් කර තැබීම සඳහා ඉඩකඩ පහසුකම් නොමැතිවීමේ ප්‍රශ්නයටද විසඳුමක් ලැබේ.

22. 2013 නොවැම්බර් 15/17 දිනවලදී ශ්‍රී ලංකාවේ පවත්වන ලද පොදු රාජ්‍ය මණ්ඩලීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීම හා සම්බන්ධ වැඩ කටයුතු වල සාර්ථක ලෙස නියැලුණු අතර, පොදු සන්නිවේදන අංශය, විශේෂයෙන් ඉහත රැස්වීම ආවරණය කිරීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණි විදේශීය මාධ්‍යවේදීන්ට අදාළ වන කරුණු පිළිබඳව සහාය ලබාදුණි.

**1 වන ඇමුණුම**

## 2013 දී අති සම්භාවනීය පුද්ගලයින්ගේ සංචාර

01. උගන්ඩා ජනරජයේ ජනාධිපති අතිගරු යුවේරි මුසවෙනි මැතිතුමා, 2013 මැයි 28 සිට ජූනි 03 දක්වා කළ සංචාරය
02. තායිලන්තයේ අග්‍රාමාත්‍ය අතිගරු යින්ග්ලූ ෂිනවර්තා මැතිනිය, මැයි 31, ජූනි 01 වන දිනවල කළ සංචාරය
03. උගන්ඩා ජනරජයේ ජනාධිපති අතිගරු යොවේරි මුසවෙනි මැතිතුමාගේ 2013 ජූනි 04 වැනි දින සංක්‍රමණික සංචාරය
04. අල්වලීඩ් බින් ටලාල් බින් අබ්දුල් අසීස් අල් සවුද් රජකුමරාගේ සංචාරය- 2013 ජූලි 04 වැනි දින
05. මාලදිවයින් ජනරජයේ ජනාධිපති අතිගරු ආචාර්ය මොහොමඩ් වහීඩ් හසන් මැතිතුමාගේ සහ ජනාධිපති ආර්යා ඉල්හම් හුසේන් මැතිනියගේ 2013 ජූලි 05-07 දිනවල සංචාරය
06. තායිලන්තයේ මහා චක්‍රී සිරින්ධොර්න් රජ කුමරියගේ 2013 අගෝස්තු 18-23 දක්වා දිනවල සංචාරය
07. ජපානයේ තකමදෝහි වසුගුකො රජකුමරියගේ අගොස්තු 19 සිට 23 දක්වා දිනවල සංචාරය
08. කොරියා ජනරජයේ අග්‍රමාත්‍යා අතිගරු චුන් හොංග් - වොන් මැතිතුමාගේ 2013 අගෝස්තු 28 සිට 30 දක්වා දිනවල සංචාරය

## 2013 ඉතා වැදගත් පුද්ගලයින්ගේ සංචාර

01. බර්කිනා ෆාසෝ විදේශ කටයුතු අමාත්‍යවරයාගේ 2013 අප්‍රේල් 3 - 5 දිනවල සංචාරය
02. පකිස්තාන් විදේශ ලේකම්, ජලීල් අබ්බාස් ජීලානි මහතාගේ 2013 අප්‍රේල් 04- 05 දිනවල සංචාරය
03. බංග්ලාදේශයේ විදේශ ලේකම් සහිදුල් හේග් මහතාගේ 2013 අප්‍රේල් 21 වන දින සංචාරය
04. අසර්බයිජාන්හි විදේශ කටයුතු අමාත්‍ය අතිගරු එල්මර් මන්මදියාරෝව් මහතාගේ 2013 මැයි 05-08 දිනවල සංචාරය
05. ප්‍රංශයේ ඕර්නි සෙනේට් සභික නතලී ගොව්ලට් මහත්මියගේ 2013 අගෝස්තු 17 සිට 21 දින දක්වා සංචාරය
06. ඉන්දියාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු සල්මන් කුර්ෂිඩ් මහතාගේ සංචාරය 2013 ඔක්තෝබර් 07,08
07. වියට්නාමයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍ය සහ විදේශ අමාත්‍ය ගරු ප්යම් බින්හ් මින්හ් මහතාගේ සංචාරය, 2013 ඔක්තෝබර් 24,26
08. චෙක් ජනරජයේ විදේශ අමාත්‍ය ගරු ජෑන් කොහොට් මහතාගේ සංචාරය,2013 නොවැම්බර් 06,07

## 2013 නියෝජිත පිරිස්වල සංචාර

1. 2013 ජූනි 06 වැනි දින රොමේනියානු නියෝජිත කණ්ඩායමේ සංචාරය

2. එක්සත් රාජධානියේ පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායමේ 2013 ජූලි 21 සිට 27 දක්වා සංචාරය

3. බ්‍රසීලයේ සමූපකාර ආයතනයේ නියෝජිත පිරිසගේ 2013 අගෝස්තු 08 සිට 14 දින දක්වා කාලය තුළසංචාරය

4. චීනයේ කොමියුනිස්ට් පක්ෂයේ නියෝජිත පිරිසගේ 2013 අගෝස්තු 14 සිට 23 දින දක්වා කාලය තුළ සංචාරය

5. ඉන්දියානු නියෝජිත කණ්ඩායමේ සංචාරය, 2013 ඔක්තෝබර් 7- 8

6. අභ්‍යන්තර වශයෙන් අවතැන්වූවන්ගේ මානව හිමිකම් පිළිබඳ විශේෂ වාර්තාකරු ආචාර්ය චාලෝකා බෙයනි මහතාගේ ශ්‍රී ලංකා සංචාරය, 2013 දෙසැම්බර් 02-06

7. ජපානයේ යසුෂි අකාශි මහතාගේ සංචාරය, දෙසැම්බර් 08-13

**II වන ඇමුණුම**

| විෂය | විස්තරය | වෙනත් |
|---|---|---|
| විදේශීය මාධ්‍යවේදීන්ට මාධ්‍ය බලය පැවැරීම | මෙරටට පැමිණෙන විදේශීය මාධ්‍යවේදීන්, මාධ්‍යකරුවන් හා රූගත කරන කණ්ඩායම් සඳහා නිර්දේශ මෙම අංශය මඟින් නිකුත් කෙරේ. | මාධ්‍යවේදීන් හා මාධ්‍ය සේවා පිරිස් කණ්ඩායම් 473 කට මෙම අංශය මඟින් නිර්දේශ නිකුත් කර ඇත. |
| | | |
| රූගත කිරීමේ කණ්ඩායම්වලට පහසුකම් සලසාදීම | රේඛීය නියෝජිතයන් සමඟ සම්බන්ධකම් පවත්වා සිය රූගත කිරීමේ කටයුතු සඳහා ඉඩ සලසා දීමෙන් මෙම අංශය විදේශීය රූගත කිරීමේ කණ්ඩායම්වලට පහසුකම් සලසා දෙයි. | සමාලෝචනයට භාජනය වන කාලය තුළදී මෙම අංශය මඟින් රූගත කිරීමේ කණ්ඩායම් 50කට සහන සලසා දී ඇත. |
| මාධ්‍ය නිවේදන නිකුත් කිරීම හා පුවත්පත්වලට තොරතුරු ලබාදීමේ කටයුතු සංවිධානය කිරීම | අමාත්‍යාංශයට අදාළ කටයුතු සඳහා මාධ්‍ය ආවරණය කිරීමේ කටයුතු පුවත්පත් සාකච්ඡා ආදිය සංවිධානය කරන මෙම අංශය අමාත්‍යාංශය වෙනුවෙන් පුවත්පත් නිවේදන නිකුත් කරයි. | සමාලෝචනයට භාජනය වන කාලය තුළදී රාජ්‍යතාන්ත්‍රික සාකච්ඡා 08 ක්ද,මාධ්‍ය සාකච්ඡා 23සංවිධානය කළ මෙම අංශය අමාත්‍යාංශය වෙනුවෙන් මාධ්‍ය නිවේදන 240ක් නිකුත් කර ඇත. |
| ඉතා වැදගත් පුද්ගලයින් සහ අති සම්මානනීය පුද්ගලයින් සඳහා මාධ්‍ය ආවරණය කිරීම | අති සම්මානනීය සංචාරකයින් සඳහා මාධ්‍ය ආවරණ කටයුතු සංවිධානය කරන මෙම අංශය ඔවුන් සමඟ පැමිණෙන මාධ්‍ය නියෝජිතයන්ට සහාය සලසා දෙයි. | මාධ්‍ය ආවරණ 23ක් ඉතා වැදගත් පුද්ගලයින්ගේ සංචාර ආවරණය කිරීම් 08ක්, අති සම්මානනීය පුද්ගලයින්ගේ සංචාර ආවරණය කිරීම් 08ක් හා නියෝජිත කණ්ඩායම්වල සංචාර ආවරණය කිරීම් 07ක් මෙම අංශය මඟින් සංවිධානය කර ඇත. |

# නීති අංශය

## <u>නීති අංශය</u>

### නීති අංශයේ කාර්ය කටයුතුවල වැදගත් ක්ෂේත්‍ර පිළිබඳ සාමාන්‍ය විස්තරයක්

විදේශ කටයුතු අමාත්‍යාංශයේ නීති අංශය ස්ථාපනය කරන ලද්දේ 1967 වර්ෂයේදීය. විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මඟින් ගරු අමාත්‍යතුමාටත්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ වෙනත් අංශවලටත්, විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලටත්, ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති විදේශ රටවල දූත මණ්ඩලවලටත්, වෙනත් අමාත්‍යාංශවලටත් ජාත්‍යන්තර නීතිය පිළිබඳ නෛතික උපදෙස් සැපයීම නීති අංශයේ කාර්යභාරයවේ.

### උපදෙස් ලබාදෙන ප්‍රධාන විෂය ක්ෂේත්‍ර

සියලුම ප්‍රතිපත්ති තීරණවල නෛතික පැතිකඩ සම්බන්ධයෙන්, විශේෂයෙන්ම, දේශ සීමා පිළිබඳ හිමිකම් සහ මායිම්, ගිවිසුම් සම්බන්ධතා පිළිගැනීම, රාජතාන්ත්‍රික විනිර්මුක්ති හා වරප්‍රසාද යනාදිය තුළින් කලින් කල උදාවන ජාත්‍යන්තර ප්‍රශ්න සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම නීති අංශයේ කාර්යභාරය වේ.

නාවික කටයුතු, සිවිල් ගුවන් සේවය, ජාත්‍යන්තර වෙළඳාම හා ආයෝජන වැනි පුළුල් විෂය ක්ෂේත්‍ර ආවරණය කරමින් විදේශ ගනුදෙනුවල නිරතවන අනෙකුත් සියලුම අමාත්‍යාංශවලට හා රජයේ දෙපාර්තමේන්තුවලට විදේශ කටයුතු අමාත්‍යාංශයේ නීති අංශය මඟින් ජාත්‍යන්තර නීතියට අදාළව උපදෙස් ලබා දෙනු ලැබේ. තවද, උදර්පනය, සාපරාධී සිවිල් හා වාණිජ කටයුතු සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය නෛතික සහාය ද්විත්ව බදුකරණය වැළැක්වීම සඳහා කටයුතු කිරීම, ආයෝජන සුරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය, සිරකරුවන් හුවමාරු කරගැනීම, ආපසු භාරගැනීම, සංක්‍රමණ, කම්කරු හා මිනිස් බලය සහ සාගර නීතිය ආදී කරුණු සම්බන්ධයෙන් අධික්ෂණ සහයෝගීතාවට එළඹීම පිළිබඳ, සාකච්ඡාවලට කැඳවීම, සාකච්ඡා පැවැත්වීම සහ ගිවිසුම් පිළිබඳ කටයුතු නිම කිරීම යන කාර්ය කටයුතුවල නීති අංශය නිරත වේ.

ශ්‍රී ලංකා විදේශ සේවයට අදාළ වන අමාත්‍යාංශ උපදෙස් මාලාව, විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල මඟින් ඇති කරගන්නා කොන්ත්‍රාත් හා ගිවිසුම් අර්ථකථනය කිරීම, අපගේ දූත මණ්ඩල මඟින් ස්ථානීයව කම්කරුවන් බඳවා ගැනීම, විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල මෙන්ම ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන දූත මණ්ඩලවල රාජතාන්ත්‍රික හා කොන්සියුලර් වරප්‍රසාද සහ විනිර්මුක්තිවලට අදාළ ප්‍රශ්න මෙම අංශයෙන් විමසීම් කරන කේෂ්ත්‍ර කීපයකි. විදේශ කටයුතු අමාත්‍යාංශයේ සියලුම ද්විපාර්ශ්වික රැස්වීම්වලදී වැදගත් හා ක්‍රියාශීලී කාර්යභාරයක් ඉටු කරන නීති අංශය ආයෝජන ප්‍රවර්ධනය, විදේශවල සේවයට ගොස් වැරදිකරුවන් බවට පත්වන ශ්‍රී ලාංකිකයන් ආපසු භාර ගැනීම ආදී කේෂ්ත්‍ර පිළිබඳ ද්විපාර්ශ්වික සාකච්ඡා මෙම අංශය මඟින් මෙහෙය වනු ලැබේ.

### ගුවන් සේවා

කොරියාව, අසර්බයිජාන්, සීෂෙල්ස්, කසකස්ථාන් සහ ඉන්දියාව යන රටවල් සමඟ පවත්වනු ලබන ද්විපාර්ශ්වික ගුවන් සේවා සාකච්ඡා අතරවාරයේදී නියෝජිත පිරිස් එකඟත්වයට එළඹ ඇත. නව ගුවන් සේවා ගිවිසුම්වල මාතෘකා පාඨ සම්බන්ධයෙන් හා ගුවන් ගමන් වාර වැඩිකිරීම සම්බන්ධයෙන්

එකඟත්වයකට එළඹීමට සීෂෙල්ස්, අසර්බයිජාන්, කසකස්ථාන් හා ඉන්දියාව යන රටවල් සමඟ කරන ලද ද්වීපාර්ශ්වික ගුවන් සේවා සාකච්ඡාවලදී නියෝජිත පිරිස් සමත් වී ඇත.

## ආයෝජන ප්‍රවර්ධනය

මෙම ක්ෂේත්‍රයේ දී ලොව පුරා විශාල වශයෙන් සිදුවී ඇති සංවර්ධනය ගැන සලකා බලා අන්‍යෝන්‍ය වශයෙන් ආයෝජන ප්‍රවර්ධනය කිරීම හා සුරක්ෂා කිරීම පිළිබඳ ගිවිසුමේ නව ආකෘතියක් කෙටුම්පත් කරන ලදී. නීති උපදේශකගේ සහභාගීත්වය යටතේ නීතිපති දෙපාර්තමේන්තුවේ ආයෝජන මණ්ඩලයේ, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් විසින් ගිවිසුමේ නව ආකෘතිය කෙටුම්පත් කරන ලදී.

ගිවිසුමේ නව ආකෘතිය කෙටුම්පත් කිරීමේදී හිටපු නීති උපදේශක ආචාර්ය රොහාන් පෙරේරා මහතාගෙන් විමසීම් කරන ලදී. මෙම ආකෘතිය යෝග්‍ය රටවලට ඉදිරිපත් කිරීම සඳහා දේශපාලන සංස්කරණ අංශ වෙත ඉදිරිපත් කරන ලදී.

## ද්විත්ව බදුකරණය

ශ්‍රී ලංකාව මෙම වර්ෂය තුළදී ඉන්දියාව, ලක්සම්බර්ග් සහ බෙලරුස් යන රටවල් සමඟ ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම්වලට එළඹුණේය. ඕමානය සමඟ කළ ගිවිසුම් සාකච්ඡාව ඇතුළුව මෙම වර්ෂය තුළදී පවත්වන ලද ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම පිළිබඳ සියලුම සාකච්ඡාවලට නීති අංශයේ නියෝජිතයා සහභාගී විය.

## ආපසු භාරගැනීම

සිය රටට ආපසු භාරගැනීම පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුවේ අමාත්‍යාංශ කේන්ද්‍රස්ථානය වනුයේ නීති අංශයයි. ආපසු භාරගැනීම පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුවේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා පත් කරන ලද අනු කමිටු දෙකක් නීති අංශය මඟින් නියෝජනය වේ. ප්‍රතිපත්ති අනු කමිටුවේ සභාපතිත්වය උසුලන්නේ නීති උපදේශකවරයායි. යුරෝපා සංගමය සමඟ ආපසු භාරගැනීමේ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සඳහා පවත්වන ලද ආපසු භාරගැනීම පිළිබඳ ප්‍රථම ඒකාබද්ධ කමිටු රැස්වීමේදී නීති අංශය මඟින් ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටුකර ඇත. යුරෝපා සංගමය සමඟ ඇති කරගන්නා ලද ආපසු භාරගැනීමේ ගිවිසුම පිළිබඳ සන්ධාන කටයුතු නිම කරගැනීම සඳහා පවත්වන ලද අන්තර් අමාත්‍යාංශ සාකච්ඡාවලදී නීති අංශය ක්‍රියාකාරී අන්දමේ කාර්යභාරයක් ඉටුකළාය. ආපසු භාරගැනීම පිළිබඳ ප්‍රංශය හා බෙනලක්ස් රටවල් සමඟ ඇතිකරගන්නා ලද ගිවිසුම් ක්‍රියාත්මක කිරීමේ සන්ධාන කටයුතු පිළිබඳ නිරීක්ෂණ දැනටමත් ඉදිරිපත් කර ඇත. ආපසු භාරගැනීම පිළිබඳ ස්විට්සර්ලන්තය හා රුසියාව සමඟ ඇතිකරගන්නා ලද ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට අදාළ සන්ධාන කටයුතු නිමාවට පත්වී තිබේ.

## සමුද්‍රික/සාගර නීතිය

සාගර නීතියට අදාළ සියලුම සාකච්ඡාවලට නීති අංශය ක්‍රියාකාරීව සහභාගීවී තිබෙන අතර, මහද්වීපික තටක සම්බන්ධයෙන් එක්සත් ජාතීන් වෙත ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳව විශේෂ උනන්දුවක් දක්වා ඇත.

මහද්වීපික තටක සීමා පිළිබඳ කොමිෂන් සභාව වෙත මූලික කරුණු 2025 දී හෝ ඊට පෙර ඉදිරිපත් කිරීමෙන් ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු සනාථ කර ගැනීම සඳහා සිද්ධිදායක ක්‍රමෝපාය සකස් කර ගැනීමේ අරමුණෙන් නීති අංශය දැනට අදාළ නිලධාරීන්/ අධිකාරීන් සමඟ සාකච්ඡා කරමින් සිටී.

ශ්‍රී ලංකා වරායට යුද නැව් ඇතුල්කරගැනීම පිළිබඳ ගිවිසුමට අදාළ දෙවැනි වටයේ සාකච්ඡා පවත්වා ඇති අතර ගිවිසුමේ මාතෘකා පාඨ නීති උපදේශකගේ සභාපතීත්වයෙන් යුත් සාකච්ඡාවලදී සුනිශ්චිත කරගන්නා ලදී.

## වාණිජ හා වෙළඳ කටයුතු

වාණිජ හා වෙළඳ කටයුතු පිළිබඳ ද්වීපාර්ශ්වික හා බහුපාර්ශ්වික ගිවිසුම් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේදී, අංශය, වාණිජ දෙපාර්තමේන්තුව සමඟ සමීපව කටයුතු කර තිබේ. මෙම වසරේදී 2014 සිට, GSP+ සහනය ලබාගැනීම සඳහා ඉල්ලීමක් කිරීමට අවශ්‍ය වන නෛතික කරුණු ඉදිරිපත් කිරීම් සැකසීමෙහිලා ක්‍රියාකාරීව කටයුතු කළේය.

## අධිකරණ සහයෝගීතාව - අපරාධ පිළිබඳ කරුණු, දඬුවම් නියමවූ පුද්ගලයින් හුවමාරු කරගැනීම හා උදර්පනය

නෛතික සහයෝගීතාව හා උදර්පනය ඵලදායක අන්දමින් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම වර්ෂය තුළදී ගිවිසුම් ගණනාවක් පිළිබඳ සාකච්ඡා පවත්වා ඒ පිළිබඳ කටයුතු නිමකර තිබේ.එම සාකච්ඡා පවත්වන්නේ අධිකරණ අමාත්‍යාංශය හා නීතිපති දෙපාර්තමේන්තුව සමඟය.උදර්පනය හා අන්‍යෝන්‍ය නෛතික සහාය සඳහා සියලුම අයදුම්පත් මෙම අමාත්‍යාංශයේ නීති අංශය මඟින් යවනු ලබන අතර ගිවිසුම් පිළිබඳ සාකච්ඡාවට භාජනයකොට තීරණවලට එළඹීමෙහිලා සක්‍රියව කටයුතු කරයි.

මෙයට අමතරව, විදේශවල සිටින අයට සිතාසි භාරදීම, විදේශීය සිතාසි ශ්‍රී ලංකාවේදී භාරදීම පිළිබඳව මෙහෙයුම් කටයුතු අධිකරණ අමාත්‍යාංශයේ සහාය ඇතිව සිදුකරන්නේ නීති අංශය මඟිනි.

## එක්සත් ජාතීන්

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ අංක 1267 සහ 1373 දරන යෝජනාවලි ක්‍රියාත්මක කිරීම පිළිබඳ අන්තර් අමාත්‍යාංශීය කමිටුවේ සාමාජිකයෙකු වන නීති අංශය ආරක්ෂක අමාත්‍යාංශයේදී පවත්වන ලද මාසික රැස්වීම්වලට සහභාගීවී එම රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කරන ලද සාකච්ඡාවලට සක්‍රීය ලෙස සහභාගී විය.

මූල්‍යමය බුද්ධි ඒකකයේ (FIU) විදේශ කටයුතු අමාත්‍යාංශයේ නියෝජිතයා ලෙස කටයුතු කරන්නේ නීති අංශයයි. ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම විසින් හඳුනාගන්නා ලදුව පෙන්වා දී ඇති පරිදි මුදල් විශුද්ධිකරණය පිළිබඳ ව්‍යවස්ථාවල පවතින අඩුපාඩු මඟහරවා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීමත්, මූල්‍යමය බුද්ධි ඒකකයේ උපදේශක මණ්ඩලය මඟින් පත්කරන ලද නෛතික සමාලෝචන කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ කටයුතු පහසු කිරීමක් සඳහා, මූල්‍යමය බුද්ධි ඒකකයේ උපදේශක මණ්ඩලය මඟින් පත්කරන ලද නෛතික සමාලෝචන කමිටුවේ නිර්දේශ මත,ත්‍රස්තවාදයට මුදල් රැස්කිරීමේ කටයුතු මැඩ පැවැත්වීමේ පනතේ පොදු සම්මත පිළිබඳ 2013 අංක 3 දරන සංශෝධිත පනත සම්බන්ධීකරණය කිරීමේ කටයුතු නීති අංශය මඟින් සම්බන්ධීකරණය කරන ලදී.

එක්සත් ජාතීන්ගේ මහා සභාවේ 68 වැනි සැසිවාරයේ 6 වැනි කමිටුව වෙත රටේ තත්ත්ව සඳහන් කරමින් විස්තර වාර්තාවක් සකස් කිරීමේ කර්තව්‍යය පැවරුනේද නීති අංශයටයි.

## ජාත්‍යන්තර මානුෂික නීතිය

විදේශ කටයුතු අමාත්‍යාංශයේ නීති අංශය අමාත්‍යාංශීය කමිටුවක් වන ජාත්‍යන්තර මානුෂීය නීති කමිටුවේ කේන්ද්‍රස්ථානයයි. වර්ෂය තුළදී රැස්වූ කමිටුව ජිනීවා සම්මුතියේ සහ ඊට අදාළ නීති දෙකක නිල නොවන පරිවර්තන පිළිබඳ කටයුතු නිම කරන ලද අතර, එම පරිවර්තන ජාත්‍යන්තර රතු කුරුස සංගමය මඟින් ප්‍රකාශයට පත් කරන ලදුව ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ විද්වතුන්හා වෘත්තිකයින් අතර බෙදා හරින ලදී.

ජාත්‍යන්තර මානුෂීය නීතියේ ක්‍රියාත්මක වූ කොටස් හා ක්‍රියාත්මක නොවූ කොටස් අතර ඇති පරතරය විශ්ලේෂණය කිරීම සඳහා ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සහාය ඇතිව පර්යේෂණ නිලධාරියකුගේ සේවය ලබා ගැනීමට මෙම කමිටුව විසින් තීරණය කර ඇත. එම තීරණයට ශ්‍රී ලංකාව එකඟ වී ඇත. මෙම තීරණයේ අරමුණ වන්නේ ක්‍රියාත්මක කිරීමේ නීති කෙටුම්පත් කිරීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමය.

ජාත්‍යන්තර රතු කුරුසසංගමයේ මානුෂීය නීතිය ගවේෂණය කිරීමේ අධ්‍යයනයෙහි ඇති තොරතුරු සලකා බැලූ කමිටුව ජාත්‍යන්තර මානුෂීය නීතියේ මූලධර්ම පාසැල්වල ප්‍රාථමික හා ද්විතීය මට්ටම්වල විෂය ධාරාවට ඇතුළත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා ආරම්භ කිරීමට තීරණය කර තිබේ.

## ද්වීපාර්ශ්වික/බහුපාර්ශ්වික/කලාපීය ගිවිසුම්

මෙම කාලය තුළ අත්සන් කරන ලද, ගිවිසුම්වල/අවබෝධතා ගිවිසුම්වල පිටපත් යාකොට ඇත. මෙම ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් සම්බන්ධයෙන් නිරීක්ෂණ සපයා අවසාන පිටපත් අත්සනට යවා ඇත්තේ නීති අංශය මඟිනි.

# විදේශ දූත මණ්ඩල පාලන අංශය

## විදේශ දූත මණ්ඩල පාලන අංශය

විදේශ දූත මණ්ඩලපාලන අංශයේ මූලික කාර්ය වනුයේ, විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාල සඳහා සේවා පිරිස් හා පරිපාලන කාර්ය කටයුතු සම්බන්ධයෙන් මාර්ගෝපදේශ ඇතුළුව අවශ්‍ය සම්පත් සැපයීම මගින් එම කාර්යාලවලට සහයවීමයි. ශ්‍රී ලංකා විදේශ සේවයට බඳවාගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය සහ රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් සහ පෞද්ගලික සහකාරවරුන් තෝරා ගැනීම සඳහා වන විභාග පැවැත්වීමෙහිලා මෙම අංශය පහසුකම් සලසයි. මෙම විභාගවලින් තෝරාගන්නා නිලධාරීන් අමාත්‍යාංශයේ සහ විදේශ රටවල පිහිටි දූත මණ්ඩල/දූත කාර්යාලවල සේවය කිරීම සඳහා පත්කරනු ලැබේ.

**ශ්‍රී ලංකා විදේශ සේවය සඳහා බඳවා ගැනීම**

2012 මැයි - ජූනි මාසවලදී පවත්වන ලද විභාගයෙන් 2013 අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකා විදේශ සේවයේ III වැනි ශ්‍රේණිය සඳහා නිලධාරීන් 25 දෙනෙකුගෙන් යුත් නව කණ්ඩායමක් බඳවා ගන්නා ලදී. අමාත්‍යාංශයේ විවිධ අංශවලට අනුයුක්ත කිරීම, ඔවුන් සඳහා අවශ්‍ය පුහුණු හා හුරුපුරුදුවීමේ වැඩසටහන් මෙම අංශය විසින් සංවිධානය කරනු ලබයි.

විභාග දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, 2014 වසරේදී ශ්‍රී ලංකා විදේශ සේවයේ III වැනි ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමට සහ ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීමට කටයුතු සම්පාදනය කර තිබේ.

**නව දූත මණ්ඩල ප්‍රධානීන් පත්කිරීම**

2014 වසරේදී දූත මණ්ඩල ප්‍රධානීන් පහළොස්(15) දෙනෙකු පත් කරන ලදී. මෙම දූත මණ්ඩල ප්‍රධානීන් වෙනුවෙන් රේඛීය අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන සහ පුද්ගලික අංශ සංවිධාන සමඟ එක්ව පරිපූර්ණ පුහුණු හා හුරුපුරුදුවීමේ වැඩසටහන් පවත්වන ලදී.

**රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් සහ පෞද්ගලික සහකාරවරුන් තෝරාගැනීම හා මාරුකිරීම**

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාලවල සියරට පේරු පදනමින් බඳවාගන්නා කළමනාකරණ සහකාර සේවා සේවක සංඛ්‍යාවේ පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා වන විවෘත තරඟ විභාගයෙන් තෝරාගත් සාර්ථක අපේක්ෂකයින් සඳහා 2013 මාර්තුහිදී පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත පත්වීම් ලබාදෙන ලදී.

විභාග දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, 2014 වසරේදී රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් සහ පෞද්ගලික සහකාරවරුන් තෝරාගැනීම සඳහා විභාග පැවැත්වීමට කටයුතු සම්පාදනය කරන ලදී. මෙම අංශය, විදේශ රටවල පිහිටි දූත මණ්ඩල/දූත කාර්යාලවලට ස්ථානීයව කොන්ත්‍රාත් පදනම මත සිදුකරන බඳවා ගැනීම් සඳහා පහසුකම් සැලසීය.

**ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා ශිෂ්‍යත්ව/පුහුණු පහසුකම්**

ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන්ට විදේශීය පුහුණු වැඩසටහන/වැඩමුළු වලට සහභාගීවීම සඳහා මෙම විදේශ දූත මණ්ඩල පාලන අංශය පහසුකම් සලසා තිබේ. රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන්ගේ වෘත්තිය සංවර්ධනය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව, ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික රාජ්‍යතාන්ත්‍රික කටයුතු, ජාත්‍යන්තර නීතිය, මානව හිමිකම් හා ආරක්ෂක අධ්‍යයන කටයුතු සහ ජාත්‍යන්තර වෙළඳාම හා සාකච්ඡා යන ක්ෂේත්‍ර කිහිපයක් ආවරණය වන පරිදි මෙම වැඩසටහන් සකසන ලදී. ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලය සහ මොනෑෂ් විශ්ව විද්‍යාලය වැනි විශ්ව විද්‍යාලවල ඕස්ට්‍රේලියානු සංවර්ධන

ආධාර වැඩසටහන යටතේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා ද කටයුතු සම්පාදනය කරන ලදී. සිංගප්පූරුවේ ලී කුවැන් යේ අධි ශිෂ්‍යත්වය යටතේ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය සඳහා නිලධාරියෙකුගේ සහභාගිත්වයට අවශ්‍ය පහසුකම් සලසන ලදී.

**නව රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල විවෘත කිරීම**

2013 වසරේදී පහත දැක්වෙන නව දූත මණ්ඩල සහ දූත කාර්යාල විවෘත කරන ලදී.

- ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය - මෙල්බර්න්/ඕස්ට්‍රේලියාව
- ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය - කම්පාලා/උගන්ඩාව
- ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය - අබූජා/නයිජීරියාව
- ශ්‍රී ලංකා තානාපති කාර්යාලය - මැනමා,බහරේන්
- ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය - සිෂෙල්ස්
- ඇෆ්ගනිස්ථානයේ කාබුල් නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් විවෘත කිරීම සඳහා අවශ්‍ය මූලික පියවර ද මෙම අංශය විසින් ගෙන තිබේ.

**විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සඳහා ගොඩනැගිලි මිළදී ගැනීම, ඉදිකිරීම සහ අලුත්වැඩියා කිරීම**

මෙම අංශය, විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාල සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, දේපළ මිළදී ගැනීමට සහ ශ්‍රී ලංකා රජයට අයත් දේපළ අලුත්වැඩියා කිරීමට පියවර ගෙන තිබේ. රජයේ තීරණවලට අනුව භාණ්ඩාගාරය, මහ බැංකුව සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා අවශ්‍ය අරමුදල් සම්පාදනය කරන ලදී.

**ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම**

මෙම අංශය, භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, විදේශ රටවල පිහිටි දූත මණ්ඩලවල/ දූත කාර්යාල වල පවතින වාහන වෙනුවට අලුත් වාහන මිළදී ගැනීමට අවශ්‍යඅවස්ථාවලදී හෝ අභිනවයෙන් විවෘත කරන ලද දූත මණ්ඩල සඳහා නව වාහන මිළදී ගැනීමට අවශ්‍ය අවස්ථාවලදී එම මිළදී ගැනීම් සඳහා පහසුකම් සලසයි.

**විගණන පරීක්ෂණ**

අභ්‍යන්තර විගණන අංශය සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව විදේශ රටවල පිහිටි දූත මණ්ඩල/දූත කාර්යාල වලදී ක්‍රමවත් විගණන පරීක්ෂණ පැවැත්වීම සඳහා මෙම අංශය පහසුකම් සලසයි.

**චාරිකා අංශයේ කාර්ය කටයුතු**

චාරිකා අංශය, අමාත්‍ය මණ්ඩලයේ, නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ,පා ර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ගේ,පළාත් සභා මන්ත්‍රිවරුන්ගේ, වෙනත් නියෝජිතවරුන්ගේ සහ රජයේ සේවයේ නිලධාරීන්ගේ නිල සංචාර සඳහා පහසුකම් සලසයි.

# සාමාන්‍ය පරිපාලන අංශය

## සාමාන්‍ය පරිපාලන අංශය

මානව සම්පත් කළමනාකරණය, පාර්ලිමේන්තු ප්‍රශ්න, අමාත්‍ය මණ්ඩල සංදේශ, භාණ්ඩ හා සේවා සලසා දීමේ හා සංවිධානය කිරීමේ කටයුතු, ගොඩනැගිලි හා උපකරණ නඩත්තුව, ප්‍රසම්පාදනය, ප්‍රවාහන කටයුතු, සන්නිවේදන පහසුකම් සැලසීම, පුහුණු කටයුතු සහ අමාත්‍යාංශයට අදාළ අනොන්‍යා සම්බන්ධතාවෙන් යුත් වෙනත් වැඩ කටයුතු පිළිබඳ වගකීම සාමාන්‍ය පරිපාලන අංශයට පැවරී ඇත.

වර්ෂය තුළදී සාමාන්‍ය පරිපාලන අංශය, මානව සම්පත් කළමනාකරණයේදී, අමාත්‍යාංශයට අවශ්‍ය කාර්ය මණ්ඩලය සපයා ගැනීම අරභයා අනෙකුත් අංශවලට අවශ්‍ය පහසුකම් සලසා දී ඇති අතර කාර්ය මණ්ඩලයේ විවිධ තරාතිරම්වල සාමාජිකයින්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා පුහුණු පහසුකම් සලසා දී ඇත. අංශ ප්‍රධානීන්, රාජ්‍ය කළමනාකරණ සහකරුවන්, සංවර්ධන නිලධාරීන් (OES) සහ රියදුරන් සඳහා මෙම කාලය තුළදී පැවති පුහුණු පාඨමාලා දහයක් පවත්වා ඇත. තොරතුරු තාක්ෂණ නිලධාරීන්ගේ හිඟය මගහැරවීම සඳහා අමාත්‍යාංශයට නිලධාරීන් දහ දෙනෙකුගේ සේවය ලබා ගැනීමෙහිලා අවශ්‍ය කටයුතු කරන ලදී. දැනට අමාත්‍යාංශයේ සේවය කරන සංවර්ධන නිලධාරීන්ට අමතරව තවත් සංවර්ධන නිලධාරී තනතුරු විස්සක් ඇති කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇත. අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයට අනුකූලව බඳවා ගැනීමේ කාර්ය පරිපාටි සකස් කිරීමේ කාර්යයෙහිලා සැලකිය යුතු ප්‍රගතියක් ලබා තිබේ.

භෝජනාගාරය ව්‍යාප්ත කිරීම, කොන්සියුලර් අංශයේ කවුළු සවි කිරීම සහ ගරු අමාත්‍යතුමාගේ නිල නිවාසය ප්‍රකෘතිමත් කිරීම පිළිබඳ කටයුතු 2013 වර්ෂය තුළදී නිමකර ඇත. ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය අසළ ප්‍රතිමාවක් ඉදි කිරීමද සාමාන්‍ය පරිපාලන අංශය ලත් ජයග්‍රහණයකි. මෙම කාර්යයෙහි වටිනාකම ආසන්න වශයෙන් රුපියල් මිලියන අටකි.

අමාත්‍යාංශයේ නිත්‍ය අවශ්‍යතා සඳහා පහසුකම් සලසාදීමට අමතරව, අදාළ සේවා පහසුකම් හා උපකරණ ප්‍රසම්පාදනය කිරීම මඟින් 2013 පොදු රාජ්‍ය මණ්ඩලයීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීම නිමිත්තෙන් කාර්ය සාධන බලකා ලේකම් කාර්යාලය ස්ථාපනය කිරීමෙහි ලා සැලකිය යුතු දායකත්වයක් සාමාන්‍ය පරිපාලන අංශය මඟින් ලබාදී තිබේ. 2013 දී අම්පාර නගරයේදී පවත්වන ලද දැයට කිරුළ ප්‍රදර්ශනයේදී අමාත්‍යාංශයේ කටයුතුවල සාර්ථකත්වය සඳහා අවශ්‍ය කාර්යයන් සම්පාදනය කිරීම සාමාන්‍ය පරිපාලන අංශයේ තවත් මූලික කර්තව්‍යයකි.

විදේශ තානාපතිවරුන් හා මහ කොමසාරිස්වරුන් වශයෙන් පත් කරනු ලැබූවන්ට අක්තපත්‍ර පිළිගැන්වීමේ උත්සව සඳහා සහ අතිවිශේෂ පුද්ගලයින් සහ වෙනත් විදේශීය නියෝජිත කණ්ඩායම්වල නිල සංචාර සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් හා සැපයුම් පිළිබඳ සංවිධාන කටයුතු සම්පාදනය කිරීම සම්බන්ධයෙන් පහසුකම් සලසා දීම මෙම වර්ෂය තුළදී සාමාන්‍ය පරිපාලන අංශය මඟින් ඉටුකර තිබේ. 2013 වර්ෂය තුළදී අක්ත පත්‍ර පිළිගැන්වීමේ උත්සව 5ක් හා නිල සංචාර 13ක් ඇතුළුව සංචාර 73ක් සඳහා මෙන්ම ශ්‍රී ලංකාවේදී පවත්වන ලද ජාත්‍යන්තර සම්මේලන සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සාමාන්‍ය පරිපාලන අංශය මඟින් ඉටු කර ඇත.

# මුදල් අංශය

## මුදල් අංශය

කළමනාකරණයට උපකාරක සේවා සැපයීම සහ අමාත්‍යාංශයේ සංවර්ධන වැඩ කටයුතු පිළිබඳ හා මූල්‍ය සැලසුම්කරණය පිළිබඳ වගකීම් මුදල් අංශය භාරයේ පවතී.

අමාත්‍යාංශයේ හා විදේශ දූත මණ්ඩලවල මූල්‍ය ගනුදෙනු පිළිබඳ ගිණුම් පවත්වා ගැනීම මෙම අංශයේ කාර්යභාරයක් වන අතර එම ගිණුම් පිළිබඳ වාර්තා මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කරනු ලැබේ.

### මෙම අංශයේ කාර්යභාරය

- අවශ්‍ය මූල්‍ය වගකීම් ඉටු කිරීම සඳහා ප්‍රධාන ගිණුම් නිලධාරියා වන අමාත්‍යාංශ ලේකම්වරයාට සහාය වීම.
- රජයේ මූල්‍ය නීති හා රෙගුලාසි අනුගමනය කෙරෙන බව තහවුරු කර ගැනීම.
- මූල්‍ය සැලසුම්කරණය ඇතුළු ගිණුම් ක්‍රම පනවා පවත්වාගෙන යාම.
- කලට වේලාවට නිවැරදි ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමට වග බලා ගැනීම.
- ගිණුම් වාර්තා සහ අයවැය අවශ්‍යතා සකස් කිරීම, යාවත්කාලීන කිරීම, සමාලෝචනය කිරීම සහ නිම කිරීම පිළිබඳ කටයුතු සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය, අමාත්‍යාංශය යටතේ පවතින වෙනත් නියෝජිතායතන සහ අමාත්‍යාංශයේ අනෙකුත් අංශ සමග සම්බන්ධීකරණ කටයුතු කිරීම

2013 වර්ෂයේ වියදම් හා ප්‍රතිපාදන පහත දැක්වේ.

### (අ) පුනරාවර්තන

| විස්තරය | **2013.12.31** දිනට මුළු ප්‍රතිපාදන රු. | **2013.12.31** දිනට මුළු වියදම රු. | වියදම් ප්‍රතිපාදන දහසේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 4,484,457,400 | 4,480,234,886 | 100 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 3,233,913,550 | 3,221,906,861 | 100 |
| **එකතුව** | **7,718,370,950** | **7,702,141,747** | **200** |

### (ආ) ප්‍රාග්ධන

| විෂය ක්ෂේත්‍රය | විස්තරය | **2013.12.31** දිනට මුළු ප්‍රතිපාදන රු. | **2013.09.30** දිනට මුළු වියදම රු. | වියදම් ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය කිරීම හා වැඩි දියුණු කිරීම | | | |
| 2001 | ගොඩනැගිලි හා ඉදි කිරීම් | 165,325,000 | 56,957,426 | 34 |
| 2002 | යන්ත්‍රාගාර, යන්ත්‍ර සහ උපකරණ | 6,110,000 | 1,730,517 | 28 |
| 2003 | වාහන | 23,395,000 | 21,360,303 | 91 |

## ප්‍රාග්ධන සම්පත් අත්පත් කර ගැනීම

| | | | | |
|---|---|---|---|---|
| 2101 | වාහන | 39,637,250 | 37,873,354 | 96 |
| 2102 | ලී බඩු හා කාර්යාල උපකරණ | 72,123,350 | 71,593,693 | 99 |
| 2103 | යන්ත්‍රාගාර යන්ත්‍ර සහ උපකරණ | 17,271,700 | 17,270,667 | 100 |
| 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1,003,501,800 | 1,002,722,980 | 100 |
| 2105 | ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම් | 0 | 0 | 0 |

## ප්‍රාග්ධන පැවරීම්

| විෂය කේතය | විස්තරය | **2013.12.31** දිනට මුළු ප්‍රතිපාදනය රු. | **2013.12.31** දිනට මුළු වියදම රු. | වියදම් ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|---|
| 2201(01) | ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සබඳතා සඳහා ක්‍රමෝපායික අධ්‍යයන ආයතනය | 10,000,000 | 9,189,154 | 92 |

## මානව සම්පත් සංවර්ධනය

| විෂය කේතය | විස්තරය | **2013.12.31** දිනටමුළු ප්‍රතිපාදනය රු. | **2013.12.31** දිනට මුළු වියදම රු. | වියදම් ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|---|
| 2401 | කාර්ය මණ්ඩල පුහුණුව | 773,000 | 772,604 | 100 |

## වෙනත් ආයෝජන

| විෂය කේතය | විස්තරය | **2013.12.31** දිනට මුළු ප්‍රතිපාදනය රු. | **2013.12.31** දිනට මුළු වියදම රු. | වියදම් ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|---|
| 01-2502 | පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව | 1,083,839,200 | 1,083,839,156 | 100 |

## වෙනත් ප්‍රාග්ධන වියදම්

| විෂය ක්ෂේත්‍රය | විස්තරය | **2013.12.31** දිනටමුළු ප්‍රතිපාදනය රු. | **2013.12.31** දිනටමුළු වියදම රු. | වියදම් ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|---|
| 2502 (01) | විදේශීය වෙළඳාම හා සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසීම | 0 | 0 | 0 |
| | එකතුව | **2,421,966,300** | **2,303,309,854** | **95** |

## (2). අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් නිර්දේශිත සීමාවන් හා සත්‍ය සීමාවන්

| විස්තරය | උපරිම හර | උපරිම බැර | උපරිම හර ශේෂය |
|---|---|---|---|
| නිර්දේශිත සීමාව | 30,000,000 | 18,000,000 | 125,000,000 |
| 2013.09.30 දක්වා සත්‍ය ගණන - 1120011 | 16,863,247 | 24,333,895 | 87,289,928 |
| 2013.09.30 දක්වා සත්‍ය ගණන- 1120012 | 12,950,762 | 8,041,491 | 4,909,270 |

# ශ්‍රී ලංකා විදේශ දූතමණ්ඩල ජාලය



# සංවිධාන සැලැස්ම

## විදේශකටයුතු අමාත්‍යාංශය

